# පොල් සංවර්ධන අධිකාරිය




## වාර්ෂික වාර්තාව

# 2021

## අපගේ දර්ශනය

“පොල් කර්මාන්තය දළ දේශීය
නිෂ්පාදනය සඳහා
වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම
දායකත්වය ලබා දෙන්නා වීම සහ
නිෂ්පාදන අළෙවි විවිධාංගීකරණයේදී
ගෝලීය නායකයා වීම.”

## අපගේ මෙහෙවර

ගෘහස්ථ පාරිභෝජනය සහ කර්මාන්තය සඳහා
පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම
තහවුරු කිරීම මඟින්,
පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය
ඵලදායීතාවය,තිරසාරත්වය හා ජාතික ආර්ථිකය
සඳහා ඉහළ දායකත්වයක් කරා
ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම.

## හැඳින්වීම

සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතෙහි ‘‘පොල්
සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ (මෙහි මින්මතු ‘‘අධිකාරිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය’’ යන 111 වන කොටසේ 24 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.

පොල් සංවර්ධන අධිකාරියේ කර්තව්‍යයන් පනතේ 30(1) වගන්තිය අනුව පහත පරිදි වේ.

(අ) පොල් කර්මාන්තය සහ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ආර්ථික වශයෙන් ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳව තීරණය කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත සහය ලබා දීම.

(ආ) එසේ තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා වලට අනුකූලව ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සකස් කිරීම හෝ සකස් කිරීම සඳහා සහය වීම.

(ඇ) එසේ සකස් කරනු ලබන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබා දීම.

(ඈ) මෙම පනත යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවා ඇති මණ්ඩලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මණ්ඩලවල වාර්ෂික අයවැය අනුමත කිරීම හා ඔවුන් වෙත අරමුදල් ලබා දීම.

(ඊ) නිසි කළමනාකරණ ගිණුම්කරණ පද්ධති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා මණ්ඩල වෙත උපදෙස් ලබා දීම හා සහය ලබා දීම.

(උ) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මණ්ඩලවල ප්‍රගතිය ඇගයීම.

(ඌ) පොල් කර්මාන්තය හෝ එහි නිෂ්පාදන පිළිබඳ යම් අංශයක් හෝ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කරනු ලබන යම් තැනැත්තෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට (සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ) මූල්‍ය සහ වෙනත් යම් ආකාරයක සහය ලබා දීම හා එවැනි පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(එ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සමාන හිමිකම් හා කර්තව්‍ය ඉටු කරනු ලබන ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතාවන්ට එළඹීම.

(ඒ) පොල් කර්මාන්තය කෙරෙහි බලපාන හෝ අදාළ සියළු කාරණා පිළිබඳව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම.

(ඔ) පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම හා යලි පණ ගැන්වීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියේ මතය වන සියළු පියවර ගැනීම.

**අධිකාරියේ බලතල පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව පහත පරිදිවේ.**

31 (1)අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උචිත හෝ අනුශාංගික වන්නා වූ යම් සියළු ක්‍රියා සිදු කිරීමට වහා පියවර ගැනීමට අධිකාරියට බලතල තිබිය යුතුය.

(2) (1) වන උප වගන්තිය මඟින් පවරා ඇති බලතල ව්‍යාපෘතියට අගතියක් නොමැතිව 22 (2) වන වගන්තිය මඟින් විධිවිධාන සලස්වා ඇති සියළු බලතල මණ්ඩලය හා සමානව අධිකාරිය වෙත තිබිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් යෝග්‍ය යැයි සලකනු ලබන විට ඔහු විසින් ගැසට් පත්‍රයේ කරනු ලබන නියමයක් මඟින් 23 වන වගන්තිය මඟින් විධි විධාන සලස්වා ඇති විශේෂ බලතල වලින් එකක් හෝ කිහිපයක් හෝ ඉන් යම් කොටසක් මණ්ඩලය හා සමාන ආකාරයෙන් අධිකාරිය වෙත පවරනු ලැබිය හැකිය.

පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වලින් දළ දේශීය නිෂ්පාදනයට වාර්ෂිකව විශාල දායකත්වයක් ලබා දේ. 2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් මෙතෙක් වාර්තාගත ඉහළම අපනයන ආදායම වූ රු. බිලියන 166 ක් ලබා ගැනීමට හැකි වූ අතර, එය 36% ක වර්ධනයකි.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරිසැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යයමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන අංශය යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටුකර ගැනීමේදී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශ වලට සහය වේ.

සභාපති ප්‍රධානියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩ කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, පාලන අංශය හා මුදල් අංශයේ අධ්‍යක්ෂවරුන් හරහා ඉටු කරනු ලබයි. මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2021 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 207 වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් 36 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.

# සභාපතිගේ සමාලෝචනය

අතීතයේ සිටම ශ්‍රී ලාංකික ආහාර රටාව හා සංස්කෘතිය සමඟ බැඳී ඇති පොල් ගස වර්තමානය වනවිට අප රටෙහි ප්‍රධානතම ආර්ථික බෝග අතරට එක්ව ඇත. පවුල් ගණනාවක් සෘජුව හා වක්‍රාකාරයෙන් පොල් කර්මාන්තය මත යැපෙන අතරම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය රටට විදේශ විනිමය ගෙනෙන ප්‍රධාන මාර්ගයකි.

පොල් ගෙඩි මිලියන 3000කට අධික වාර්ෂික ඵලදාවක් සහිත ශ්‍රී ලංකාව ලෝක වෙළඳපලට පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන රටවල් අතර සිව්වන ස්ථානය අත්කරගෙන ඇත. මුළු පොල් නිෂ්පාදනයෙන් ගෙඩි මිලියන 1800ක් පමණ ගෘහාශ්‍රිත පරිභෝජනයටද ඉතිරිය පොල් මද ආශ්‍රිත කර්මාන්ත වන දිසිඳි පොල්, පොල් කිරි,පොල් තෙල්, පොල් කිරිපිටි, පොල්ක්‍රීම් කොප්පරා හා ගෙඩි පොල් වශයෙන් ද පොල් කර්මාන්තයට යොදා ගනී එමෙන්ම පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදන කර්මාන්ත වන සක්‍රීය කාබන්, පොල් කොහු, කොහුබත් සහ පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්ත සඳහාද ජාත්‍යන්තර වෙළඳපොල තුළ විශාල ඉල්ලුමක් ලැබෙමින් පවතී.

වර්තමානයේදී ජාත්‍යන්තර වෙළඳපොල තුළ පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවත්නා අතර අපනයනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් පවත්වාගෙන යාම සඳහාත්, එතුළින් ජාත්‍යාන්තර වෙළඳපොල තුළ ශ්‍රී ලාංකීය පොල් ආශ්‍රිත නිෂ්පාදන කෙරෙහි ඉහළ ඉල්ලුම තව දුරටත් වර්ධනය කරවීම සඳහාත් පොල් සංවර්ධන අධිකාරිය මඟින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මූල්‍ය දායකත්වය, උපදේශනය සහ නියාමනය ආදී සෑම කර්තව්‍යයක් මඟින් ඉතා ඉහළ මට්ටමක කාර්යභාරයක් ඉටු කිරීම ඉමහත් සතුටට කරුණකි.

2020 වසරේදී ලැබූ රු.බිලියන 122 (ඇ.ඩො මිලියන 661) වන අපනයන ආදායම අභිබවමින් 2021 වසර තුලදී රු.බිලියන 166 (ඇ.ඩො මිලියන 834) ක අපනයන ආදායමක් ගෙන ඒමට හැකි වූ අතර එය 36% ක වාර්තාගත වර්ධනයකි ගෝලීය වසංගත තත්ත්වය මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විදේශ විනිමය අත්‍යාවශ්‍යම මොහොතක මෙවන් ප්‍රගතියක් අත්කරගැනීම සඳහා අප කාර්යමණ්ඩලයේ සියලු දෙනාගේම කැපවීම අගයකොට සැලකිය යුතුවේ

ශ්‍රී ලාංකීය ජනතාව අතර සකස්කළ පොල් නිෂ්පාදන ප්‍රචලිත කිරීම මඟින් ගෘහාශ්‍රිත පොල් නාස්තිය අවම කර පොල් මද ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණුකිරීමට දායකත්වය සහ නියාමනයෙන් දායකවීමටත් පොල්මද ආශ්‍රිත නොවන කර්මාන්ත නිවැරදි සහ කාර්යක්ෂම ක්‍රමවේදයක් හරහා එක්රැස් කර පරිසර හිතකාමී ක්‍රමවේද හරහා නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවීම තුළින් එම කර්මාන්ත නගාසිටුවීමටත් දැනටමත් පොල් සංවර්ධන අධිකාරිය පියවර ගෙන තිබේ. ශ්‍රී ලාංකීය ජනතාව වෙනුවෙන් පිරිසිදු හා ගුණාත්මක පොල් තෙල් භදුනා ගැනීමට හැකි වන පරිදි ලේබලයෙහි මුද්‍රණය කලයුතු තරු 5 කින් සමන්විත තත්ත්ව සහතිකය හඳුන්වාදීම, ගුණාත්මක නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රමිතියෙන් යුතු යන්ත්‍රෝපකරණ භාවිතය වැඩි කිරීමට දායක වීම, නිෂ්පාදන පරීක්ෂාව සඳහා රසායනාගාර සේවාවන් ලබාදෙමින් තත්ත්ව සහතික නිකුත්කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගුණාත්මකභාවයන් යුත් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය බැංකු සමග එකාබද්ධ වෙමින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ණය පහසුකම් ලබා දීම ඇතුළු ඉමහත් කාර්යභාරයක් පොල් කර්මාන්තය නගා සිටුවීම සඳහා ඉටු කරමින, ශ්‍රී ලාංකීය පොල් කර්මාන්තය ජාත්‍යන්තර තලයට ඔසවා තැබීම අපගේ අභිප්‍රාය වේ.

කීර්ති ශ්‍රී වීරසිංහ
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

ශ්‍රී ලංකාව තුළ පොල් සංවර්ධන පනත මඟින් පොල් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනය හා නියාමනය සඳහා අධිකාරිමය බලතල හිමි විශේෂිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වන බැවින් අප ආයතනය මඟින් පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයට ඉමහත් පිටුවහලක් ලැබේ.

ශ්‍රී ලාංකික පොල් ආශ්‍රිත නිෂ්පාදන ලෝක වෙළඳපොල තුළ සුවිශේෂී ස්ථානයක් හිමි වීමට දේශීය පොල් ගෙඩියේ මදයේ රසය මෙන්ම පොල් කට්ට හා ලෙල්ලේ සුවිශේෂී බවද විශේෂ හේතුවක් වේ.

පොල් ආශ්‍රිත කර්මාන්ත ආයතන ලියාපදිංචි කිරීම, එම කර්මාන්ත සඳහා තාක්ෂණික දැනුම ලබා දීම මෙන්ම ආයෝජන සහායන්, ජාත්‍යන්තර අපනයන වෙළඳපොල වෙත ප්‍රවේශ වීම සඳහා ද පොල් සංවර්ධන අධිකාරිය මඟින් අඛණ්ඩ මඟ පෙන්වීම සිදු කර ඇත.

මෙම වර්ෂය තුළද රට තුළ පැවති **Covid-19** වසංගත රෝගී තත්ත්වය හමුවේ වුවද පොල් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රය මඟින් රටට විශාල විදේශ විනිමයක් ලබා ගැනීම සඳහාත් එමඟින් දේශීය රැකියා වෙළඳපොල තුළද ස්ථාවරභාවයක් ඇති කිරීමට පොල් සංවර්ධන අධිකාරියට විශේෂ දායකත්වයක් දැරීමට හැකි වීමද භාගයක් ලෙස සලකමි.

පොල් සංවර්ධන අධිකාරිය මඟින් සපයන රසායනාගාර පරීක්ෂණ වාර්තාවන් හේතුවෙන් රාජ්‍ය සහතිකයලත් නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොලට සැපයීමට ද හැකි වීම මඟින්ද ජාත්‍යන්තර වෙළඳපොල ජය ගැනීමට අවස්ථාව ලැබී ඇත. දිසිඳි පොල් කර්මාන්ත ක්ෂේත්‍රය දෛනිකව පරීක්ෂාවට ලක් වන අතරම පොල් තෙල් කර්මාන්ත ක්ෂේත්‍රය නියාමනය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිරි සැලසුම් සකස් කරමින් පවතී. පොල් සංවර්ධන අධිකාරිය ක්ෂේත්‍ර මට්ටමින් සතු සීමිත මානව සම්පත මඟින් දේශීය පොල් තෙල් කර්මාන්ත ක්ෂේත්‍රය ගුණාත්මක තත්ත්වයට පත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. මේ සඳහා තරු පහ ( Five Star ) සළකුණ ලබා දීමේ වැඩසටහන සඳහා පොල් තෙල් නිෂ්පාදනකරුවන් යොමු වීම මෙන්ම ගුණාත්මක, සෞඛ්‍යය ආරක්ෂිත පොල් තෙල් පරිභෝජනය සඳහා ජනතාව දැනුවත් කිරීම සඳහා ද ඉදිරි සැලසුම් සකස් වෙමින් පවතී'

අපනයන කර්මාන්තයක් මෙන්ම ජීවනෝපාය සංවර්ධන කර්මාන්තයක් ලෙසද පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම මෙන්ම මේ වසර තුළ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම විශාල ප්‍රගතියක් අත් කර ගැනීමට හැකි වීම සම්බන්ධව සතුටු විය හැක.



සුමුදු.පී.විතානගේ
අධ්‍යක්ෂ ජනරාල්


## 2021 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ

### මණ්ඩල සාමාජිකයින්

1. ජයන්ත වික්‍රමසිංහ මහතා - සභාපති 2021.06.31 දින දක්වා
   කීර්ති ශ්‍රී වීරසිංහ මහතා- සභාපති 2021.07.01 දින සිට
2. එන්.එස්. වනසිංහ මහතා 2021.06.31 දක්වා
3. ඩී.එස්. විජේසේකර මහත්මිය 2021.07.01 දින සිට 2021.08.30 දක්වා
4. ආර්.පි. කස්තුරිආරච්චි මහත්මිය 2021.09.01 දින සිට
5. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මහත්මිය
6. දිනේෂ් ප්‍රනාන්දු මහතා
7. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මහතා
8. ජගත් චන්දන තල්ගස්දූව මහතා
9. උපාලි ධම්මික ද සිල්වා මහතා
10. ඒ.වී.කේ මාධවී හේරත් මහත්මිය
11. වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා

## සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

| | |
|---|---|
| 1. ජයන්ත වික්‍රමසිංහ මහතා | - සභාපති 2021.06.31 දින දක්වා |
| කීර්ති ශ්‍රී වීරසිංහ මහතා | - 2021.07.01 දින සිට |
| 2. දශිත නිරෝෂණ මහතා<br>සුමුදු පී විතානගේ මහත්මිය | - අධ්‍යක්ෂ ජනරාල්<br>2021.09.27 දින සිට |
| 3. එස්. එස්. පුරසිංහ මහත්මිය | - අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) |
| 4. එම්. පී. සන්ධ්‍යා කාන්ති මහත්මිය | - අධ්‍යක්ෂ (මුදල්) |
| 5. පී. ඒ. එස්. කේ. සම්පත් සමරවික්‍රම මහතා | - අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) |
| 6. පී. එදිරිමාන්න මහතා | - අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) |
| 7. එස්.ඩබ්. රසිකා මහත්මිය | - අධ්‍යක්ෂ (පරිපාලන) රා.ආ |
| 8. ඩබ්. එම්. ටී. එස්. වීරසූරිය මහතා | - අභ්‍යන්තර විගණක |


2021.12.31 දිනට සංවිධාන ව්‍යුහය
සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (පරිපාලන) (ජ්‍යෙෂ්ඨ කළ.)
අධ්‍යක්ෂ (මුදල්) (ජ්‍යෙෂ්ඨ කළ.)
අධ්‍යක්ෂ (අලෙවි සං .හා පර්.) (ජ්‍යෙෂ්ඨ කළ.)
අධ්‍යක්ෂ අලෙවි (ජාත්‍යන්තර) (ජ්‍යෙෂ්ඨ කළ)
අධ්‍යක්ෂ සැකසුම් සං (ජ්‍යෙෂ්ඨ කළ.)
අධ්‍යක්ෂ තත් පා. හා තත්. ආර. (ජ්‍යෙෂ්ඨ කළ.)
අභ්‍යන්තර විගණක (කළ. මට්ටි) (තනතුරු - 01)
නීති නිලධාරි (කළ. මට්ටි) (තනතුරු -01)
ස/නි අධ්‍යක්ෂ (කළ. මට්ටි) (තනතුරු -01)
ඉංජිනේරු (සිවිල්) (කළ. මට්ටි) (තනතුරු - 01)
ස/නි අධ්‍යක්ෂ (කළ. මට්ටි) (තනතුරු- 01)
ස/නි අධ්‍යක්ෂ (කළ. මට්ටි) (තනතුරු - 02)
ස/නි අධ්‍යක්ෂ (කළ. මට්ටි) (තනතුරු - 04 )
ස/නි අධ්‍යක්ෂ (කළ. මට්ටි) (තනතුරු - 02
රසඥ (කළ. මට්ටි.) (තනතුරු - 01)
සභාපති ලේකම් (කණ්.කළ. ම)
අභ්‍යන්තර වි. නිලධාරි (කණ්. කළ.) (තනතුරු - 01)
පරි. නිලධාරි (කණ්. කළ.) (තනතුරු - 01)
මූල්‍ය නිලධාරි (කණ්. කළ.) (තනතුරු - 01)
ආර්.පර්. නිලධාරි (කණ්. කළ) (තනතුරු -01)
අලෙවි නිලධාරි (කණ්.කළ) (තනතුරු-01)
තොරතුරු නිලධාරි (කණ්.කළ) (තනතුරු-01)
පර්යේෂණ නිලධාරි (කණ්.කළ) (තනතුරු-01)
ජ්ෙෂ්ඨ පරීක්ෂක (කණ්.කළ) (තනතුරු-09)
සැ. සං. නිලධාරි (කණ්.කළ) (තනතුරු-05)
තත්. පාලන නිලධාරි (කණ්.කළ.) (තනතුරු-01)
අ.ප ලේකම්
වැඩසටහන් සහකාර (අභ්‍යන්තර විගණක)
කළමණාකරණ සහකාර
කාර්යාල සහයක
වැඩසටහන් සහකාර (තොරතුරු)
කාර්මික සහකාර (ප්‍රවාහන)
කාර්මික සහකාර (යාන්ත්‍රික/විදුලි)
කළමණාකරණ සහකාර
රියදුරු
කාර්යාල සහයක
පොත් තබන්නා
කළමණාකරණ සහකාර
කාර්යාල සහයක
වැඩසටහන් සහකාර (අලෙ.සං.හා පර්.)
වැඩසටහන් සහකාර (ආර්ථික පරියේෂණ)
කළමණාකරණ සහකාර
ක්ෂේත්‍ර සහකාර
කාර්යාල සහයක
වැඩසටහන් සහකාර (සැකසුම් සංවර්ධන )
වැඩසටහන් සහකාර තාක්ෂණික සේවා
පරීක්ෂක
කළමණාකරණ සහකාර
ක්ෂේත්‍රසහයක
කාර්යාල සහයක
වැඩසටහන් සහකාර(ක්‍ර.පා
රසායනාගාර කාර්මික ශිල්පී
කළමණාකරණ සහකාර
රසායනාගාර ක්ෂේත්‍ර සහයක
රසායනාගාර සහයක
කාර්. සහයක
කෙටි යෙදුම් :
1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටම
2. ස/නිඅධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ. මට්. - කළමණාකරණ මට්ටම
5. පරි. නිලධාරි - පරිපාලන නිලධාරි
6. ආර්. පර්. නිලධාරි- ආර්ථික පර්යේෂණ නිලධාරි
7. සැ. සං. නිලධාරි - සැකසුම් සංවර්ධන නිලධාරි
9. කණ්.කළ - කණ්ඩිෂ්ඨ කළමණාකරණ මට්ටම
10. අලෙ. සං. හා. පර්. - අලෙවි සංවර්ධන හා පර්යේෂණ
11. තත්. පා. හා ආර. තත්ත්ව පාලන හා ආරක්ෂණ

# පටුන


| | පරිච්ඡේද අංකය |
|---|---|
| සැකසුම් සංවර්ධන අංශය | 01 |
| තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය | 02 |
| අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය | 03 |
| පරිපාලන අංශය | 04 |
| මුදල් අංශය | 05 |
| අභ්‍යන්තර විගණන අංශය | 06 |
| විගණකාධිපති වාර්තාව | 07 |

## 01.සැකසුම් සංවර්ධන අංශය

පොල් සංවර්ධන පනතේ 20 වගන්තියේ නිරූපනය කර ඇති පරිදි පොල් සංවර්ධන අධිකාරියේ අරමුණු, ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් මඟින් අධිකාරිය වෙත පවරා තිබෙන අතර, ඉන් පොල් කර්මාන්තයේ නිෂ්පාදන ක්‍රියාවලිය, කාර්මික ක්‍රියාවලිය, පොල් සහ පොල් නිෂ්පාදන මෙරට සහ අපනයන වෙළඳපොළට යැවීම සම්බන්ධ අධීක්ෂණය කිරීමේ කටයුතු සහ කර්මාන්ත සංවර්ධනය කිරීමේ කටයුතු සැකසුම් සංවර්ධන අංශය මඟින් සිදු කෙරේ.

ඒ යටතේ පසුගිය වසරේ මෙන්ම 2021 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැකසුම් සංවර්ධන අංශය සැලසුම් සකස් කරන ලදී.

1. පොල් ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සහ නිෂ්පාදනය කිරීමට සහාය වීම, නියාමනය කිරීම මඟින් දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිති පිරිවිතර හා ගැලපෙන ලෙස සකස් කල නිෂ්පාදන අපනයනය සඳහා ඉදිරිපත් කිරීමට සහය වීම.
2. දිසිඳි පොල් කර්මාන්තයේ සංවර්ධන කටයුතු එනම්, නවීන තාක්ෂණය භාවිතා කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෝල් සංවර්ධන අරමුදල හරහා දායකත්වය ලබා දීම.
3. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන සහ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රමිති නියම කිරීම සහ ඒවා පවත්වා ගැනීම.
4. අගය වැඩි පොල් නිෂ්පාදන නිපදවීම සඳහා ශිල්පීය සහය සහ මූල්‍ය සහය ලබාදීම.
5. පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා කාරක හා ප්‍රාග්ධන පහසුකම් සලසා දීම මඟින් නිෂ්පාදන කාර්යක්ෂමතාව, සඵලත්වය ඉහල නංවාලීම හා ඒකක පිරිවැය අවම කිරීම.
6. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය බැංකු ණය පහසුකම් ලබා ගැනීම සඳහා මහ පෙන්වීම හා පොළී සහන ලබා දීම.
7. පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් සඳහා ඇති නව ප්‍රවණතා, තාක්ෂණය හා පර්යේෂණ සඳහා පර්යේෂණය ඇති කිරීම හා නිපුණතා වර්ධනය සඳහා දේශීය හා විදේශීය තාක්ෂණය වෙත කර්මාන්තකරුවන් යොමු කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නිලධාරීන් පුහුණු කිරීම.
8. අවිධිමත් කර්මාන්තය නහා සිටුවීම සඳහා දායකත්වය ලබා දීම.
9. ග්‍රාමීය ආර්ථිකය නහා සිටුවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මෙම සැලසුම්කරණයෙන් පොල් සංවර්ධන අධිකාරියේ මෙහෙවර හා දැක්ම පදනම් කර ගනිමින්, තිරසාර සංවර්ධනය ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ඉලක්කගත අපනයන ආදායම් වර්ධනය කර ගැනීම මූලික වශයෙන් අපේක්ෂා කරන ලදී.

ඒ අනුව, 2021 වර්ෂයේ ඉහත සඳහන් කල සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් හා වැඩසටහන් පහත පරිදි වේ.

1. මූලික වශයෙන්, පොල් ආශ්‍රිත කර්මාන්ත, නිෂ්පාදකයෙකු ලෙස ලියාපදිංචි කිරීම හා එමඟින් පවත්නා නීති හා රෙගුලාසි අනුව කර්මාන්තය පවත්වා ගැනීමට යොමු කරවීම.
2. නියමිත ප්‍රමිති පවත්වා ගැනීමට වග බලා ගැනීම පිණිස පිරිසැකසුම් ඒකක සහ නියැදිගත කිරීම පරීක්ෂා කිරීම, අපනයන තොග වලින් ලබා ගත් පොල් නිෂ්පාදන නියැදි පරීක්ෂා කිරීම, අපනයන භාණ්ඩ තොග සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම. ඒ මඟින් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නිෂ්පාදන නිපදවීමට කර්මාන්තකරුවන් යොමු කරවීම. ඒ සඳහා අදාළ පරිදි උපදෙස් ලබා දීම.
3. ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ත්ව සහතික නිකුත් කිරීම තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමිති පිරිවිතර පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම හා අපනයන නිෂ්කාශණය කිරීමේ කටයුතු සඳහා සෘජු දායකත්වයක් ලබා දීම.
4. පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000 ආහාර සුරක්ෂිතතාව පිළිබඳ තත්ත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා එම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට දායක වීම.
5. ප්‍රමිතියෙන් යුක්ත පොල් තෙල් නිෂ්පාදනය සඳහා කර්මාන්තකරුවන් යොමු කරවීම, සහාය වීම හා ගුණාත්මක පොල් තෙල් පරිභෝජනය සම්බන්ධව පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. දිසිඳි පොල් කර්මාන්තයේ සංවර්ධන කටයුතු එනම්, නවීන තාක්ෂණය භාවිතා කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෝල් සංවර්ධන අරමුදල හරහා දායකත්වය ලබා දීම.
7. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා පොළී ප්‍රතිදාන ලබා දීම තුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම.
8. පොල් කොහු කෙඳි නිෂ්පාදන ආයතන වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන සහය ලබා දීම.
9. සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන්ගේ හා කර්මාන්තවල සේවයේ නියුතු තාක්ෂණික සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා නියුක්තිය සඳහා නිපුණතා සංවර්ධනය කිරීම.
10. සැකසුම් සංවර්ධන අංශයේ පරීක්ෂණ ඒකකය වෙත පරීක්ෂා කිරීම් සඳහා වූ ISO 17020:2012 ප්‍රතීතන/ අනුකූලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කිරීම.
11. නිෂ්පාදන ක්‍රමවේදයන් වලංගු කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කිරීම.
12. අවිධිමත් කර්මාන්ත සඳහා අගය වැඩි කල නිෂ්පාදන හඳුන්වාදීම සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. පරිසර හිතකාමී පොල්කටු දහන උඳුන් ඉදි කිරීම සඳහා අවිධිමත් අංශයේ කර්මාන්තකරුවන් වෙත ආයෝජන සහය ලබා දීම.
14. අවිධිමත් කර්මාන්තය ආශ්‍රිතව සැකසුම් ඒකක ස්ථාපිත කිරීම.

**1. පොල් ආශ්‍රිත කර්මාන්ත, නිෂ්පාදකයෙකු ලෙස ලියාපදිංචි කිරීම හා එමඟින් පවත්නා නීති හා රෙගුලාසි අනුව කර්මාන්තය පවත්වා ගැනීමට යොමු කරවීම.**

2021 වර්ෂයේ පොල් ආශ්‍රිත නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන් ලියාපදිංචි කිරීම, 2020 නොවැම්බර් මස සිට ආරම්භ කරන ලදී. අදාළ ලියාපදිංචි අයදුම්පත් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය හා කුරුණෑගල, ගම්පහ, පුත්තලම, ගාල්ල යන ප්‍රාදේශීය කාර්යාල වලින්ද නිකුත් කරන ලදී. තවද අදාළ ලියාපදිංචි අයදුම්පත් පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමටත්, මාර්ගගත(online) ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය ඉල්ලුම් කිරීමටත් කර්මාන්තකරුවන්ට අවස්ථා සලසා දෙන ලදී. තවද පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව ජංගම ලියාපදිංචි කිරීමේ සේවාවක්ද ක්‍රියාත්මක කෙරුණි. ඒ අනුව ලියාපදිංචි කරන ලද කර්මාන්ත පිලිබඳ විස්තරය පහත වගුවෙහි සඳහන් වේ.


| | නිෂ්පාදන වර්ගය | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|
| 1 | දිසිඳි පොල් | 48 | 46 | 44 |
| 2 | පොල් කිරම | 17 | 14 | 18 |
| 3 | පිටිකල පොල්කිරි | 12 | 13 | 13 |
| 4 | කොප්පරා පොල්තෙල් | 89 | 101 | 133 |
| 5 | නැවුම් පොල්තෙල් | 60 | 50 | 49 |
| 6 | සුදු පොල්තෙල් | 38 | 39 | 60 |
| 7 | MCT තෙල් | - | 1 | 2 |
| 8 | MCT පවුඩර් | - | 2 | 2 |
| 9 | කාර්මික පොල්තෙල් | 7 | 9 | 5 |
| 10 | පොල් වතුර | 22 | 23 | 24 |
| 11 | පොල් විනාකිරි | 1 | 1 | 1 |
| 12 | කුරුටු පොල්තෙල් | 34 | 35 | 47 |
| 13 | පොල් කිරි | 22 | 24 | 26 |
| 14 | පිටිකළ පොල්කිරි | 6 | 6 | 6 |
| 15 | පොල්කිරි ආශ්‍රිත නිෂ්පාදන | 5 | 5 | 6 |
| 16 | පොල් බටර් | 7 | 8 | 8 |
| 17 | පොල් සීනි | 4 | 1 | 8 |
| 18 | පිරිපහදු කරන ලද පොල්තෙල් | 7 | 8 | 10 |
| 19 | පොල් රා | - | - | 1 |
| 20 | මෘදු කාරක ජෙල් | 1 | 1 | 1 |
| 21 | කොප්පරා | 26 | 26 | 27 |

| | | | | |
|---|---|---|---|---|
| 22 | පොල් තැවරුම | 3 | 5 | 5 |
| 23 | දිසිඳි පොල් නැවත ඇසුරුම | 1 | 3 | 8 |
| 24 | පොල් සිරප් | 3 | 3 | 3 |
| 25 | ගාන ලද මද පොල් | 1 | 1 | 1 |
| 26 | පොල් පැණි | 7 | 10 | 11 |
| 27 | පොල්කිරි සැකසුම්කරු | 2 | 2 | 2 |
| 28 | පොල් ඇමිනෝ | - | 3 | 6 |
| 29 | පොල් ජෑම් | 1 | 1 | 1 |
| 30 | දිසිඳි පොල් (පතුරු) | - | - | 1 |
| 31 | පොල් වතුර පවුඩර් | - | - | 2 |
| 32 | නැවුම් පොල්තෙල් පවුඩර් | - | - | 1 |
| 33 | නැවුම් පොල්තෙල් (කුරුටු සමඟ) | - | - | 2 |
| 34 | දිසිඳි පොල් (පතුරු - කුරුටු සහිත) | - | - | 2 |
| 35 | පොල් පිටි | - | 5 | 16 |
| 36 | පොල් ආශ්‍රිත මධ්‍යසාර | - | - | 3 |
| 38 | පොල් සම්බෝල | - | - | 1 |
| 38 | සක්‍රීය කාබන් | 7 | 10 | 9 |
| 39 | අගය එකතු කල සක්‍රීය කාබන් | - | - | 1 |
| 40 | කොහු /කොහු මෝල් | 267 | 283 | 226 |
| 41 | පොල්කටු අඟුරු කැට | 5 | 5 | 6 |
| 42 | Hub ක්‍රියාකරු | 1 | 1 | 1 |
| 43 | පොල්කටු අඟුරු | 33 | 33 | 30 |
| 44 | පොල්කටු කැබලි / පවුඩර් | 1 | 3 | 6 |
| 45 | පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ | 8 | 11 | 11 |
| 46 | නිමි භාණ්ඩ | 126 | 137 | 125 |
| 47 | කොහුබත් උපස්තර | 120 | 124 | 139 |
| 48 | කෙඳි අතරමැදි නිපැයුම් | 39 | 37 | 47 |
| 49 | වෙනත් | 15 | 2 | 9 |
| | **එකතුව** | **1046** | **1092** | **1166** |


වගුව 01- 2019 සිට 2021 වර්ෂය දක්වා පොල් ආශ්‍රිත නිෂ්පාදකයින්/සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීමත් එමඟින් විදේශ වෙළඳපොළ ඉලක්ක කරමින් සිදුවන නිෂ්පාදන සඳහා වැඩි අපනයන ආදායමක් උත්පාදනයත් අරමුණු කරගනිමින් වාර්ෂික ලියාපදිංචිය සඳහා පද්ධති සහතිකකරණ අවශ්‍යතාවය තවදුරටත් ක්‍රියාත්මක කෙරුණි. ඒ අනුව සාම්ප්‍රදායික පොල්තෙල්, කොප්පරා හා සියලුම පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සඳහා, ISO 22000:2018 ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකයත්, සියලුම කොහුබත් උපස්තර සඳහා යහපත් නිෂ්පාදන භාවිතාවන් පිලිබඳ සහතිකයත් සහිත කර්මාන්තකරුවන් අධිකාරිය සමඟ ලියාපදිංචි වී ඇත.


පසුගිය වසරවල මෙන්ම 2021 වසරේද පොල් කර්මාන්තවල ලියාපදිංචි වීමේ වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අතරින් පොල්තෙල් කර්මාන්තය විශේෂ තැනක් ගනී. ඒ අතරිනුත් සුදු පොල් තෙල් කර්මාන්තය කැපී පෙනේ. පොල් සංවර්ධන අධිකාරිය විසින් කර්මාන්ත වෙත ලබාදෙන අනුග්‍රහයත්, අපනයනය ප්‍රවර්ධනය කිරීමත් මෙම ලියාපදිංචි වීම් ඉහළ යාමට හේතුවකි. පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අධිකාරියේ ලියාපදිංචිය ලත් නිෂ්පාදකයෙකුගෙන් නිෂ්පාදන මිලදී ගැනීම අනිවාර්ය කර ඇති බැවින්, ලියාපදිංචි වීම් වලින් 75% වඩා වැඩි ප්‍රමාණයක් වර්ෂයේ මුල් කාර්තුවේදී සිදු වේ.




සිතියම 01- පොල් මද ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්තිය




සිතියම 02- පොල් ලෙල්ල ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්තිය




සිතියම 03- පොල් කටුව ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්තිය

ඉහත සිතියම් සසඳන විට පොල් ආශ්‍රිත සියලුම කර්මාන්ත 75%කට වඩා ව්‍යාප්තව ඇත්තේ පොල් ත්‍රිකෝණය ආශ්‍රිතව බව ගම්‍යය වේ. ඒ අනුව, පොල් ත්‍රිකෝණයෙන් පිටත නව කර්මාන්ත ආරම්භ කිරීමේ වැඩි විභවතාවක් ඇතිබව පෙනේ. තවද පොල් අස්වැන්න හා සසඳා බලන විට පොල් කටුව හා පොල් ලෙල්ල ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීමේ වැඩි විභවතාවයක් උතුර හා උතුරු නැගෙනහිර ආශ්‍රිතව පවතින බවද දැක්විය හැක.

**2. නියමිත ප්‍රමිති පවත්වා ගැනීමට වග බලා ගැනීම පිණිස පිරිසැකසුම් ඒකක සහ නියැදිගත කිරීම පරීක්ෂා කිරීම, අපනයන තොග වලින් ලබාගත් පොල් නිෂ්පාදන නියැදි පරීක්ෂා කිරීම, අපනයන භාණ්ඩ තොග සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම. ඒ මඟින් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නිෂ්පාදන නිපදවීමට කර්මාන්තකරුවන් යොමු කරවීම. ඒ සඳහා අදාළ පරිදි උපදෙස් ලබා දීම.**

## 2.1 කොහුකෙඳි හා කොහු බත් උපස්ථර ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

කොහු කෙඳි නිෂ්පාදකයන් ස්වකීය ආයතනයේ නිෂ්පාදනය වන කොහු කෙඳි හා කොහු බත්වල ප්‍රමිතියානුකූල තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහාත් පිරිවිතරයෙන් අපගමනයවන අවස්ථාවන් නිරීක්ෂණය කර නිෂ්පාදන ක්‍රියාවලිය සකසා ගැනීම සඳහාත් කොහු කෙඳි හා කොහු බත් ආදර්ශ විශ්ලේෂණය කිරීම අරමුණු විය.

මෙහිදී කොහුබත් උපස්තර නියැදි වල pH අගය, තෙතමනය (Moisture), විද්‍යුත් සන්නායකතාවය (Electrical Conductivity), බාහිර අපද්‍රව්‍ය (Extraneous matter), ඊ කෝලි (E-coli), හා සැල්මොනෙල්ලා (Salmonella) යන පරාමිතීන්ද, කොහු නියැදි වල තෙතමනය (Moisture) හා අපද්‍රව්‍ය (Impurities) යන පරාමිතීන් ද විශ්ලේෂණය කරන ලදී.
ඒ අනුව, පසුගිය වසරවල මෙන්ම 2021 වසර සඳහා ද අධිකාරියේ ලියාපදිංචි කොහුබත් උපස්ථර නිෂ්පාදන ආයතන වලින් නිෂ්පාදන 187ක ආදර්ශ රැස් කර තත්ත්ව සහතික නිකුත් කර ඇත. තවද තෝරාගත් කොහු කෙඳි නිෂ්පාදන ආයතන 134කින් ආදර්ශ රැස් කර තත්ත්ව සහතික නිකුත් කිරීමට කටයුතු කර ඇත.

ඒ ඒ ආයතන වල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා පිරිවිතරයන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යයනය කර නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලදී. මෙමඟින් වඩාත් ගුණාත්මක නිෂ්පාදන වෙළඳපොලට නිකුත් කිරීම අධිකාරියේ පරමාර්ථය විය.

## 2.2 නැවුම් පොල් තෙල් ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

නැවුම් පොල් තෙල් ආදර්ශ, අධිකාරියේ රසායනාගාරය මඟින් නිදහස් මේද අම්ල (Free fatty acids), පැහැය (Colour) , තෙතමනය (Moisture), අයඩින් අගය (Iodine value) සහ දිලීර හා පුස් (Yeast & Moulds) යන විශ්ලේෂණ පරාමිති යටතේ විශ්ලේෂණය කරන ලදී.

2021 වසරේදී නැවුම් පොල් තෙල් ආදර්ශ 57ක විශ්ලේෂණයන් සිදුකර ඇත. ඒ ඒ ආයතන වල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා පිරිවිතරයන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යයනය කර නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලදී. මෙමඟින් වඩාත් ගුණාත්මක නිෂ්පාදන වෙළඳපොලට නිකුත් කිරීම අධිකාරියේ පරමාර්ථය විය.

විශ්ලේෂණ වාර්තා අනුව, නිෂ්පාදන වල ප්‍රමිතිය නැවුම් පොල්තෙල් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සැසඳීම් හා නොගැළපෙන අවස්ථාවන්හිදී එම දත්තයන් වල නිරවද්‍යතාවය සඳහා පියවර ගැනීම මෙම විශ්ලේෂණ ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය වේ.

## 2.3 පොල් කිරි නිෂ්පාදන ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

සකස් කරන ලද  පොල් කිරි හා පිටිකළ පොල්කිරි නියාමනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී පොල් කිරි ආදර්ශවල මේද ප්‍රමාණය හා pH අගය පරීක්ෂා කරන ලද අතර පිටිකළ පොල්කිරි ආදර්ශවල Salmonella, E-coli, pH අගය, මේදය ප්‍රමාණය පරීක්ෂා කරන ලදී. කර්මාන්තායතන වලින් පොල් කිරි සහ පිටිකළ පොල් කිරි ආදර්ශ 150ක් පරීක්ෂා කර විශ්ලේෂිත වාර්තා ලබාගෙන කර්මාන්තකරුවන් වෙත යොමු කරන ලදී.

## 2.4 පොල් තෙල් ආදර්ශ විශ්ලේෂණ ක්‍රියාවලිය

සැකසුම් සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ගුණාත්මක පොල්තෙල් නිෂ්පාදන සඳහා ලාංඡනයක් ලබාදීමේ වැඩසටන යටතේ පොල්තෙල් කර්මාන්තායතන වලින් පොල්තෙල් නියැදි 173ක ආදර්ශ ලබාගෙන එම වැඩසටහනේ මූලික කරුණු සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ SLS 32: 2017 ට අනුරූපව පොල්තෙල් වල අයඩින් අගයත්, නිදහස් මේද අම්ල ප්‍රමාණයත්, ඇල්ලටෝක්සින් අගයත් නියැදි පරීක්ෂාවට භාජනය කරමින් විශ්ලේෂණ වාර්තා ලබා ගන්නා ලදී.

ඒ ඒ ආයතන වල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා පිරිවිතරයන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යනය කර  නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලද අතර විශ්ලේෂිත තොරතුරු පදනම් කර ගනිමින් අදාළ වැඩසටහනේ ඉදිරි කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

## 2.5 පොල්කටු අඟුරු විශ්ලේෂණ ක්‍රියාවලිය

ශ්‍රී ලංකාවේ අපනයන අදායම් ඉහල නැංවීමට දායක වන තවත් පොල් හා සම්බන්ධ ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගත් සක්‍රීය අඟුරු නිෂ්පාදනයේ මූලික අමුද්‍රව්‍ය වන පොල්කටු අඟුරු විශ්ලේෂණය කිරීම 2021 වසරේදී සිදු කරන ලදී. මෙහිදී තෙතමනය, අළු ප්‍රමාණය හා බාහිර අපද්‍රව්‍ය යන පරාමිතීන් විශ්ලේෂණය කරන ලදී. නිෂ්පාදන ආයතන 13කින් නියැදි ලබාගෙන විශ්ලේෂණ කටයුතු සඳහා යොමු කරන ලදී.

ඒ ඒ ආයතන වල පරීක්ෂා කරනු ලැබූ ශ්‍රී ලංකා පිරිවිතරයන්ගෙන් අපගමනය වන අවස්ථාවන් අධ්‍යනය කර  නිවැරදි කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කරන ලදී.

**3. ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ත්ව සහතික නිකුත් කිරීම තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමිති පිරිවිතර පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම හා අපනයන නිෂ්කාශණය කිරීමේ කටයුතු සඳහා ඍජු දායකත්වයක් ලබා දීම.**

සැකසුම් සංවර්ධන අංශයේ සේවා සමායෝජන ඒකකය මඟින් සපයනු ලබන ඉහත සඳහන් සේවාව තුළින්, අපනයනකරුවන් වෙත තම නිෂ්පාදන අපනයනයේදී නිෂ්කාශණ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කරගැනීමට මෙම සහතිකපත් ලබා දීම සිදුකෙරේ. මෙම තත්ත්ව සහතික නිකුත් කිරීම නිෂ්පාදන වල විශ්ලේෂණ පිරිවිතර හා ඍජුව සම්බන්ධ වන බැවින් තත්ත්වයෙන් උසස් නිෂ්පාදන සිදු කිරීමට ඔවුන් නිතැතින්ම පෙළඹේ.

2021 වර්ෂය තුල දිසිඳි පොල් මෙට්‍රික් ටොන් **33,289** නිෂ්පාදනය කර ඇති අතර ඉන් ක්ෂුද්‍රජීවී සහ භෞතික පරාමිති විශ්ලේෂණය කිරීම සඳහා දෛනික දිසිඳි ආදර්ශ 7749 ක් සැකසුම් සංවර්ධන අංශය වෙත ලැබී ඇත. ඒ මත පදනම්ව අපනයන සහතික 572ක් නිකුත් කර ඇත.

| සහතික වර්ගය | නිකුත් කල සහතිකපත් ගණන | |
|---|---|---|
| | **2020** | **2021** |
| සැල්මොනෙල්ලා රහිත බවට | 197 | 228 |
| භෞතික තත්ත්ව විශ්ලේෂණ | 197 | 228 |
| ඇෆ්ලටෝක්සින් රහිත බවට | 83 | 170 |
| සල්ෆර් ඩයොක්සයිඩ් රහිත බවට | 95 | 130 |
| **මුළු ගණන** | **572** | **756** |

වගුව 2 : දිසිඳී පොල් අපනයන තොග සඳහා ක්ෂුද්‍ර ජීවී හා භෞතික තත්ත්ව විශ්ලේෂණ සහතිකපත් නිකුත් කිරීම

2021 වර්ෂයේ නිකුත් කරන ලද අපනයන සහතිකපත් ප්‍රමාණය පෙර වසරට වඩා 32%ක වැඩි වීමක් පෙන්නුම් කරයි. බිඳ වැටුණු අපනයන ආර්ථිකය ඉහල නැංවීමට පොල් සංවර්ධන අධිකාරිය දක්වන ලද සහය මේ සඳහා පාදක වී ඇත.

මීට අමතරව, අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් විසින් අවශ්‍යතා මත ගෙනවිත් භාරදෙන පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ විශ්ලේෂණ කටයුතු සඳහා රසායනාගාරය වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද ප්‍රතිඵල ලේඛණ අනුව පහත පරිදි විශ්ලේෂණ වාර්තා සහතික නිකුත් කර ඇත.

| නිෂ්පාදන වර්ගය | නිකුත් කල වාර්තා ගණන | | |
|---|---|---|---|
| | **2021** | **2020** | **2019** |
| කොහු/ කොහුබත් | 437 | 250 | 316 |
| පොල්තෙල් | 411 | 319 | 211 |
| දිසිඳි පොල් | 11 | 08 | 18 |
| මේදය තරමක් ඉවත් කල දිසිඳි පොල් | 14 | 51 | 87 |
| පොල් කිරි | - | 03 | 9 |
| පුන්නක්කු | 14 | 03 | - |
| පොල් කිරම | 03 | 02 | - |
| තැඹිලි | 06 | - | - |
| පොල් වතුර | 04 | - | - |
| පොල්කටු අඟුරු | 02 | - | - |
| පොල් | 01 | - | - |
| **මුළු ගණන** | **903** | **636** | **641** |

වගුව 03- කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම අනුව ලැබෙන ආදර්ශ සඳහා ප්‍රතිඵල වාර්තා නිකුත් කිරීම

2021 පරීක්ෂා කරන ලද නිෂ්පාදන ප්‍රමාණයද, නිෂ්පාදන වර්ග ප්‍රමාණයද ඉහල ගොස් ඇත. ඒ අනුව නිගමනය කල හැක්කේ, ගෝලීය ප්‍රජාව නිෂ්පාදනයේ ගුණාත්මකභාවය නිරන්තරයෙන් අධීක්ෂණය කරන බවයි. තවද, වගා මාධ්‍යයක් ලෙස ගෝලීයව භාවිතාවන කොහුබත් පරීක්ෂාවට ලක් කිරීම කැපී පෙනෙන ලෙස ඉහල ගොස් ඇත.

**4. පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000:2018 ආහාර සුරක්ෂිතතාව පිළිබඳ තත්ත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා එම නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට දායක වීම.**

ISO 22000:2018 යනු ආහාරයක් ලෙස පරිභෝජනය සඳහා සුරක්ෂිත වන බවට තහවුරු කරනු ලබන තත්ත්ව සහතිකකරණ පද්ධතියකි. පොල්තෙල්, කොප්පරා හැර පොල් මද හා පොල් වතුර ආශ්‍රිතව නිෂ්පාදන කරනු ලබන ආහාරමය නිෂ්පාදන සඳහා මෙම තත්ත්ව සහතිකය ලබා ගැනීම අනිවාර්ය කර ඇත. අන්තර්ජාතික ප්‍රමිතීන් සහිත කාර්යක්ෂම, තිරසාර පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් උසස් තත්ත්වයේ නිෂ්පාදනයක් ඇති කිරීම මෙහි මූලික අරමුණ විය. මෙමඟින් ගුණාත්මක සහ ප්‍රමිතියෙන් උසස් නිෂ්පදනයක් වෙළඳපලට නිකුත් කිරීම සිදු වන අතර, එමඟින් කර්මාන්තකරුට වෙළඳපොල තුල සුවිශේෂී ස්ථානයක් ගොඩනඟා ගත හැකි වනු ඇත.

මෙහිදී SLAB (ශ්‍රී ලංකා ප්‍රතීතන ආයතනය) හා/හෝ IAF (International Accreditation Forum) යන ආයතනවල ප්‍රතීතනය වූ සහතිකකරණ ආයතන විගණන කටයුතු පවත්වන විට අධිකාරිය නියෝජනය කරමින්, විගණනය සඳහා පුහුණුව ලත් ක්ෂේත්‍ර නිලධාරියෙකු ඒ සඳහා යොමු කරන අතර එම නිලධාරියා විසින් ලබාදෙන නිරීක්ෂණ වාර්තාවට අනුව අදාළ ආයතනයන්හි පවතින දුර්වලතා නිවැරදි කිරීමට කටයුතු කිරීම සඳහා යොමු කරන ලදී. 2021 වර්ෂය අවසාන වන විට කර්මාන්ත 39ක ISO 22000:2018 විගණන පරීක්ෂණ සඳහා සහභාගී වී ඇත.

GMP යනු මනා නිෂ්පාදන ක්‍රියාවලියක් පවත්වාගෙන යන බව තහවුරු කරනු ලබන තත්ත්ව පද්ධතියකි. මෙම තත්ත්ව සහතිකය කොහු ආශ්‍රිත නිෂ්පාදන හා කොහුබත් නිෂ්පාදන ලියාපදිංචියෙදී අනිවාර්ය කර ඇත. මෙම තත්ත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල තත්ත්වය උසස් ලෙස පවත්වා ගැනීම සඳහා සැකසුම් සංවර්ධන අංශය සහය වේ. 2021 වර්ෂය අවසාන වන විට කර්මාන්ත 61ක GMP විගණන පරීක්ෂණ සඳහා සහභාගී වී ඇත.

2021 වර්ෂයේ පැවති කොවිඩ් වාතාවරණය යටතේ අදාළ සහතිකකරණ ආයතනවල විගණනය කිරීමේ කටයුතුවල යම් පසුබෑමක් ඇති විය.

**5. ප්‍රමිතියෙන් යුක්ත පොල්තෙල් නිෂ්පාදනය සඳහා කර්මාන්තකරුවන් යොමු කරවීම, සහාය වීම හා ගුණාත්මක පොල්තෙල් පරිභෝජනය සම්බන්ධව පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

2020 පොල් සංවර්ධන අධිකාරියේ සංඛ්‍යා දත්ත අනුව මිලියන 2792.2 ක් වූ ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් නිෂ්පාදනයෙන් 65.4% ක් දේශීය පරිභෝජනය සඳහා ද, 34.6% කර්මාන්ත සඳහා ද වැයකර ඇත. ඒ අනුව පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් ලැබෙන ආදායම ඇ.ඩො. බිලියනයක් දක්වා වැඩි කිරීමට නම් දේශීය පොල් පරිභෝජනය විධිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

එමෙන්ම ග්‍රාමීය වශයෙන් සිදුකරන පොල් තෙල් නිෂ්පාදනය සඳහා නිසි තාක්ෂණික ක්‍රමවේදයන් යොදා නොගැනීම නිසා භාවිතයට ගත හැකි පොල් ප්‍රමාණයක් අපතේ යෑමත් එලෙස නිපදවන පොල්තෙල් ආහාරයට නුසුදුසු ලෙස නිපදවීමත් ගැටළුවකි.

තවද, දේශීය වශයෙන් පොල්තෙල් සඳහා ඇති ඉල්ලුමට සරිලන නිෂ්පාදනයක් රට තුල නොමැති හෙයින් ප්‍රමිතියෙන් තොර ආහාරයට නුසුදුසු පොල්තෙල් මෙන්ම වෙනත් ආදේශක තෙල් සමඟ මිශ්‍ර කර පොල්තෙල් ලෙස විකිණීම පොල්තෙල් පිළිබඳ පාරිභෝගික විශ්වාසය බිඳවැටීමට හේතුවී ඇත.
මීට අමතරව මෑත කාලීනව ආනයනික පොල්තෙල් වල ඇෆ්ලටොක්සින් විෂ රසායනික අඩංගු බව සනාථ වීම නිසා සහ මෙවැනි විෂ සහිත ප්‍රමිතියෙන් තොර ආහාර පරිභෝජනය නිසා නොයෙකුත් බෝ නොවන රෝග බහුල වීමට හේතු වන බව සනාථ වීම නිසා පොල්තෙල් වල ප්‍රමිතිය පිළිබඳ සමාජ කතිකාවතක් මේ වන විට නිර්මාණය වී ඇත.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය වශයෙන් සිදු කරන පොල්තෙල් නිෂ්පාදනය වැඩි වශයෙන් සිදු කරනුයේ කොප්පරා උපයෝගී කරගෙනය. එලෙස ග්‍රාමීය වශයෙන් පොල්තෙල් නිෂ්පාදනය සඳහා යොදාගන්නා කොප්පරා පොල් කටු දහනය මඟින් සකස් කර ගන්නා බැවින් එලෙස සකස් කරන කොප්පරා බොහොමයක් පුස් බැඳුන නරක්වූ කොප්පරා බවට පත්වේ. ඒ අනුව පුස් බැඳුනු කොප්පරා වලින් ඇෆ්ලටොක්සින් වැනි විෂ රසයනිකයන් ද, පොල් කටු දහනයේදී පිටවෙන දුම් වලින් බහු චක්‍රීය ඇරෝමැටික හයිඩ්‍රොකාබන් වැනි විෂ රසායනිකයන් ද එකතු වීම සිදුවේ. මෙලෙස නිපදවන කොප්පරා වලින් නිෂ්පාදනය කරන පොල් තෙල්ද ප්‍රමිතියෙන් තොර විෂ සහිත වන බැවින් ග්‍රාමීය පොල්තෙල් කර්මාන්තය වැඩිදියුණු කිරීම වැදගත් අවශ්‍යතාවයකි.

ඒ අනුව, පොල් සංවර්ධන අධිකාරිය නිර්දේශ කරන පරිදි ප්‍රමිතිගත පොල්තෙල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ග්‍රාමීය පොල්තෙල් නිෂ්පාදනයේ දුර්වලතා හඳුනාගෙන ඒවා නව තාක්ෂණ ක්‍රමය මඟින් වැඩිදියුණු කිරීමත් පරිසර හිතකාමී බලශක්ති භාවිතයත් සහ ඉදිරියේදී යාවත්කාලීන වෙතැයි අපේක්ෂිත ආහාර අණපනත් වලට ගැලපෙන පරිදි ඇසුරුම් කල පිරිසුදු පොල්තෙල් සඳහා ජනතාව උනන්දු කරවීමත් ඉලක්ක කොටගත් උපාය මාර්ගික ආදර්ශ වැඩසටහනක් ලෙස 2021 වර්ෂයේදී පොල්තෙල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතිය තුළින් කර්මාන්තකරුවන්, 2021 වර්ෂයේ 50 ක් ද , 2022 වර්ෂයේ 150ක් ද, 2023 වර්ෂයේ 250ක් ද 2024 වර්ෂයේ 150ක් වන පරිදි 600 ක ඉලක්කයක් සපුරාලීමට යෝජනා කලද, 2021 වර්ෂයේ සැකසුම් සංවර්ධන අංශයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් පොල්තෙල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මුදල රු. මිලියන 21.5 ක් වූ බැවින් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 34 කට සීමා කිරීමට සිදුවිය.

ඒ අනුව, පුවත්පත් දැන්වීම් සහ පොල් සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් දැනුවත් කර ලැබුණු අයදුම්පත් වලින් වියලුම් යන්ත්‍ර සඳහා කර්මාන්තකරුවන් 32 ක් ද, බෝතල් කිරීම, කටු ඉවත් කිරීම සහ කුරුටු ඉවත් කිරීම සඳහා එක් කර්මාන්තකරුවෙකුට ද, තෙල් පෙරන යන්ත්‍රයක් සහ පොල් සේදීමේ සුදු යකඩ භාජන සඳහා එක් කර්මන්තකරුවෙකුට ද වශයෙන් වැයවන මුදලින් 70% වන පරිදි රු ලක්ෂ 06 ක උපරිම මුදලක් දක්වා පොල් සංවර්ධන අධිකාරියෙන් ලබා දීමට සහ ඉතිරි මුදල ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය යන පදනම මත කර්මාන්තකරුවන් 34 දෙනෙකු සඳහා රු. මිලියන 20.36 ක ආයෝජන පහසුකම් ලබාදෙන ලදී.

**මීට** අමතරව මෙම ව්‍යාපෘතියට සමගාමීව කර්මාන්තකරුවන් 70ක් සඳහා ගුණාත්මක පොල් තෙල් නිෂ්පාදනය පිළිබඳව පුහුණු වැඩසටහන් 02 ක් ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී.

ඒ අනුව, මෙම ප්‍රතිලාභී කර්මාන්තකරුවන් නිරන්තර අධීක්ෂණය සහ රසායනික විශ්ලේෂණ මඟින් නිෂ්පාදනය කරන පොල් තෙල් ගුණාත්මකභාවයෙන් යුක්තව පවත්වාගෙන යාමත්, පරිසර හිතකාමී බලශක්ති ප්‍රභව භාවිතයට උනන්දු කරවීම සඳහා වැයවන විදුලි ඒකක ගණන සුර්ය විදුලි නිෂ්පාදනය මඟින් ලබා ගැනීමට ප්‍රතිලාභීන් යොමු කරවීමට අපේක්ෂා කෙරේ.



රූපය 01- මූල්‍ය අනුග්‍රහය ලබාදෙන ලද වියලුම් යන්ත්‍ර පරීක්ෂාවන් කීපයක්

**ප්‍රමිතියෙන් යුතු පොල් තෙල් නිෂ්පාදනයට නිෂ්පාදකයින් යොමු කරවීම හා ඒ මඟින් පොල්තෙල් කර්මාන්තය නඟා සිටුවීම.**

ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනයට නිෂ්පාදකයින් යොමු කරවීම හා ඒ මඟින් පොල්තෙල් කර්මාන්තය නඟා සිටුවීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන ලද, අවසන් පාරිභෝගිකයා අරමුණු කරගනිමින් වෙළඳපලට නිකුත් කරනු ලබන පොල්තෙල් වල නිෂ්පාදන ක්‍රියාවලිය ද සැළකිල්ලට ගනිමින් සමස්ථ ප්‍රමිතිය පිළිබඳව තරු 5 කින් යුතු ප්‍රමිති සහතිකරණයකින් යුතු ලාංඡනයක් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩ ලෙස 2021 වසරේ ද ක්‍රියාත්මක කරන ලදී.

පොල්තෙල් සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය හා නිදහස් මේද අම්ලය , අයඩින් අගය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් පොල්තෙල් සඳහා නිකුත් කර ඇති SLS :32 ප්‍රමිති පරාමිතීන් අතර වීමත් හා ඇෆ්ලටොක්සින් නොමැති බවටත්, කිසිදු රසායනික ද්‍රව්‍යයක් දැමීමෙන් තොරව ස්වභාවික ලෙස නිෂ්පාදනය වන බවත්, සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියම ප්‍රමිතියෙන් යුතුව සිදු වන බවටත් සහතික කරමින් එකී නිර්ණායක තරු සලකුණු 5 කින් දක්වමින් සහතික ලකුණක් බුද්ධිමය දේපල කාර්යාංශයේ ද ලියාපදිංචි කරමින් 2020.09.18 දිනැති ගැසට් පත්‍රයක් ද නිකුත් කර 2020 වසරේ දී එලි දක්වන ලදී .




රූපය 02- ප්‍රමිතිගත පොල්තෙල් සඳහා ලබාදෙනු ලබන ලාංඡනය

මෙම ක්‍රියාවලියට විද්වත් කමිටුවක් සක්‍රීය ලෙස දායක කර ගන්නා ලද අතර සහතිකකරණ ලකුණ ලබා දීමේ අවසන් අනුමැතිය ලබා ගැනීම සඳහා ස්වාධීන කමිටුවක් ලෙස මෙම විද්වත් කමිටුවේ පහත ආයතන වල සාමාජිකයින් තුන් දෙනෙකු, අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකු සමඟ නිෂ්පාදන ආයතන පරීක්ෂා කිරීමට ද සම්බන්ධ වේ .

එම විද්වත් කමිටුවේ සාමාජිකත්වය දරන ආයතන නම්

1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
2. සෞඛ්‍යය අමාත්‍යාංශය යටතේ පාරිසරික හා ආහාර පෝෂණ හා ආහාර සුරක්ෂිත කිරීමේ දෙපාර්තමේන්තුව
3. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ බෝ නොවන රෝග අනු කමිටුව

මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වසරේ දී ආයතන 16 ක් පරීක්ෂා කිරීමට මෙම ස්වාධීන වූ විද්වත් කමිටුව සහභාගී වීමෙන් ද ආයතන 53 කින් පොල්තෙල් නියැදි 84 ක් පරීක්ෂා කිරීමෙන් ද අනතුරුව ආයතන 7 කට ලාංඡනය ලබා දීමට හැකියාව ලැබුණි.

එසේම මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන බැවින් 2021 වසරේ දී නියැදි 173 ක් ආයතන 74 කින් ලබා ගෙන ආයතන 19 ක් ස්වාධීන කමිටු පරීක්ෂාවට ලක් කර ආයතන 7 ක් වෙත ලාංඡනය ලබා දීමට හැකියාව ලැබුණි. ඒ අනුව මේ වන විට ආයතන 14 කට තරු 5 න් යුතු පොල් සංවර්ධන අධිකාරියේ සහතික ලකුණ ලබා දී ඇත.

මෙම සමස්ථ ක්‍රියාවලිය ආශ්‍රයෙන් පහත ආකාරයට දේශීය පොල්තෙල් කර්මාන්තයේ ප්‍රගතියක් ලබා ගැනීමට මේ වන විටත් පොල් සංවර්ධන අධිකාරියට හැකියාව ලැබී ඇත.

1. නිදහස් මේද අම්ල ප්‍රමාණය, අයඩින් අගය, ඇල්ලටොක්සින් ප්‍රමාණය යන කරුණු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් තෙල් සඳහා නිකුත් කර ඇති SLS :32 ප්‍රමිතියට අනුකූල ද යන්න සමස්ථ කර්මාන්ත ක්ෂේත්‍රයෙන්ම අහඹු ලෙස නියැදි ලබා ගෙන පරීක්ෂාවට භාජනය කිරීම නිසා වෙළඳ පොලට නිකුත් කරන පොල් තෙල් වල පහත ආකාරයට ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.
   1.1. වෙනත් තෙල් වර්ග හා/ හෝ ප්‍රමිතියෙන් අඩු පොල්තෙල් සමඟ මිශ්‍ර කිරීම අවම වී තිබීම.
   1.2. පොල්තෙල් අලෙවිකරණයේදී එහි ප්‍රමිතිය පිලිබඳව සැළකිලිමත් වීම.

2. පොල් තෙල් නිෂ්පාදන කර්මාන්තකරුවන් විශාල ලෙස කර්මාන්තයට එක් වීම.
3. 10% ක් ව තිබූ දේශීය පොල් තෙල් නිෂ්පාදනය 35% ක් බවට පත් වීම

ඉහත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2018 වසරේ සිට පොල් සංවර්ධන අධිකාරිය අඛණ්ඩව ක්‍රියාත්මක වී ඇති අතර 2021 වසරට අදාළව පහත ක්‍රියාකාරකම් කීපයක් ද සිදු කිරීමට හැකියාව ලැබුණි.

1. ලාංඡනය පිළිබඳව මාධ්‍ය වැඩසටහන් ප්‍රාග්ධන පෙලේ රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍ය කීපයකම පැවැත්වීම.
2. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ද සහය ලබා ගනිමින් සමාජ වෙබ් අඩෙවි තුළින් මහජනතාව පොල් තෙල්වල ප්‍රමිතිය පිලිබඳව දැනුවත් කිරීමට හැකියාව ලැබීම.
3. සුම් තාක්ෂණය ඔස්සේ කර්මාන්තකරුවන් මෙම ලාංඡනය පිළිබඳවත් ඉන් ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳවත් දැනුවත් කිරීමට පියවර ගැනීම.
4. පොල්තෙල්වල තිබිය යුතු වන ප්‍රමිතිය පිලිබඳවත්, එය පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් විසින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් විද්වත් මහාචාර්යවරයෙකු ලවා සුම් තාක්ෂණය ඔස්සේ කර්මාන්තකරුවන්ට හා පොල්තෙල් අපනයනකරුවන්ට දේශනයක් පැවැත්වීම.
5. පොල් සංවර්ධන අධිකාරිය මුලික කරගනිමින් ලාංඡනය පිළිබඳව ප්‍රවර්ධන කටයුතු වඩාත් විමධ්‍යගතව හා ඵලදායීව ඉටු කිරීමට ප්‍රමිති ලකුණ ලබා ගන්නා ආයතන එක් කොට සංගමයක් පිහිටුවීමට පියවර ගැනීම. (මෙම සංගමය හරහා මේ වන විටත් 2022 වසරට අදාළව පුවත්පත් 5 ක දැන්වීම් පල කිරීමට හැකියාව ලැබුණි.)
6. මෙම ක්‍රියාදාමය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2021 වසරේ දී විද්වත් කමිටුව සමඟ රැස්වීම් 4 ක් පැවැත්වීම.

| වසර | 2018.08.01-2018.12.31 | 2019 | 2020 | 2021 | එකතුව |
|---|---|---|---|---|---|
| ආයතන ගණන | 57 | 89 | 53 | 74 | **273** |
| නියැදි ගණන | 90 | 139 | 84 | 173 | **486** |
| ප්‍රමිතියට අනුකූල නියැදි ගණන | 45 | 79 | 59 | 133 | **316** |
| ලබා ගෙන ඇති නියැදි ගණන අනුව ප්‍රමිතියට අනුකූල නියැදි ගණන ප්‍රතිශතයක් ලෙස | 50% | 57% | 70% | 77% | **65%** |
| ලාංඡනය ලබා දීමට විද්වත් කමිටු පරීක්ෂාවන් සිදු කල පොල් තෙල් නිෂ්පාදන ආයතන ගන්න | - | 21 | 16 | 19 | **56** |
| ලාංඡනය නිකුත් කර ඇති ආයතන ගණන | - | - | 7 | 7 | **14** |

වගුව 04- විද්වත් කමිටු පරීක්ෂණ



රූපය 03- පවත්වන ලද විද්වත් කමිටු රැස්වීමක්





රූපය 04 - විද්වත් කමිටුව විසින් පරීක්ෂාවට භාජනය කිරීම

6. දිසිඳි පොල් කර්මාන්තයේ සංවර්ධන කටයුතු එනම්, නවීන තාක්ෂණය භාවිතා කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මෝල් සංවර්ධන අරමුදල හරහා දායකත්වය ලබා දීම.

සෑම දිසිඳි පොල් නිෂ්පාදන කි.ග්‍රෑ. 01ක් සඳහා සත 20ක මුදලක් එකී දිසිඳි පොල් නිෂ්පාදන ආයතනය නමින් පිහිටුවා ඇති දිසිඳි පොල් අරමුදල වෙත බැර කරනු ලබයි. අදාළ ආයතනයේ නවීකරන කටයුතු සඳහා එම අරමුදලින් අවශ්‍ය අවස්ථාවලදී මුදල් වෙන් කරනු ලැබේ. 2021 වසරේදී මෝල් සංවර්ධන අරමුදල මඟින් දිසිඳි නිෂ්පාදන ආයතන හතරක සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 6.0ක මුදලක් ලබාදී ඇත. මෙම වර්ෂයේ පැවති කොවිඩ් වාතාවරණය යටතේ නිෂ්පාදන ආයතනවල සංවර්ධන කටයුතු අවම මට්ටමක පැවතිණි.





රූපය 05 - මෝල් සංවර්ධන අරමුදල හරහා සිදුකරන ලද ලද නවීකරණ කීපයක්

7. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා පොළී ප්‍රතිදාන ලබා දීම තුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම.

මහජන බැංකුව හා ඒකාබද්ධව, ‘‘කප්රුක නිපැයුම් දිරිය’’ ණය යෝජනා ක්‍රමය 2012. 05.16 දින එම බැංකුව සමඟ අත්සන් කල අවබෝධතා ගිවිසුමකින් ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව, ‘‘කප්රුක ජය ඉසුර’’ ණය යෝජනා ක්‍රමය 2015.02.25 දින අත්සන් කල අවබෝධතා ගිවිසුමකින් ද කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන් ලියාපදිංචියට ආකර්ෂණය කර ගැනීමට හා ඒ හරහා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කරා ලඟා කරවීම අරමුණු කර ගනිමින් අඩු පොළී සහන ණය යෝජනා ක්‍රමයන් 2 ක් ආරම්භකර පවත්වා ගෙන යනු ලැබේ .

මහජන බැංකුවේ ‘‘කප්රුක නිපැයුම් දිරිය’’ ණය යෝජනා ක්‍රමය මඟින් බැංකුවේ වාණිජ පොළිය යටතේ එම ණය මුදල වාරික 60 කින් කර්මාන්තකරුවාට ගෙවීමට සලස්වා ඇත. ඔහු එකී වාරික නියමිත පරිදි බැංකුව වෙත ගෙවීමෙන් හා අදාළ කාර්ය නියමිත පරිදි සිදුකල බවට සහතික කර ගැනීමෙන් අනතුරුව වර්ෂය අවසානයේ 6% ක පොළියක් කර්මාන්තකරුට හිමි වන ලෙස ඉතිරි පොළී මුදල අධිකාරිය විසින් බැංකුව හරහා කර්මාන්තකරු වෙත ප්‍රතිපූර්ණය කරනු ලැබේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ‘‘කප්රුක

ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය මඟින් සෘජුව කර්මාන්තකරුට 6%ක වාර්ෂික පොළියක් යටතේ ණය මුදල ලබා දෙයි. මෙම ණය යෝජනා ක්‍රම දෙකම මූල්‍ය ණය යෝජනා ක්‍රම දෙකක් වේ.

මහජන බැංකුවේ "කප්රුක නිපැයුම් දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ බැංකුව වෙත කර්මාන්තකරු වෙත ගෙවීමට ප්‍රතිපූර්ණය කරනු ලබන පොළී මුදල අධිකාරියට තත්කාලීන වියදමක් වෙයි. එනමුත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගන්නා කර්මාන්තකරුවන් විසින් සෘජුව 6% ක වාර්ෂික පොළියක් යටතේ ණය වාරික බැංකුවට ගෙවන බැවින් එකී පොලිය අධිකාරියට තත්කාලීන වියදමක් නොවේ. එනමුත් මෙම ණය යෝජනා ක්‍රම දෙකින්ම කර්මාන්තකරු බැංකුවට ගෙවන 6% ක පොලියෙන් අඩක් එනම් 3% ක පොළී ප්‍රමාණයක් අධිකාරියට විසින් බැංකුව ගෙවනු ලැබේ.

එමෙන්ම පොල් සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2020.06.04 දිනැතිව අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව එතෙක් ලබා දුන් රු. මිලියන 2.0 ක ණය මුදල රු. මිලියන 3.5 ක් දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව රු. මිලියන 2.0 ක් දක්වා ණය මුදල් ලබාගෙන තිබූ කර්මාන්තකරුවන් හට රු. මිලියන 3.5 ක් දක්වා වූ ඉතිරි ණය මුදල් ලබා දීමට 2020 වර්ෂය තුලදී කටයුතු කර ඇත. මෙම අවබෝධතා ගිවිසුම සඳහා මේ වන තෙක් මහජන බැංකුව තම එකඟතාවය පල කර නොමැත.

මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ ණය ලබා ගත් කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| වර්ෂය | මහජන බැංකුව | | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ගණන | ණය මුදල (රු. මිලියන) | ගණන | ණය මුදල(රු. මිලියන) | ගණන | ණය මුදල(රු. මිලියන ) |
| 2012 | 27 | 17.61 | - | - | 17 | 11.99 |
| 2013 | 100 | 80.96 | - | - | 67 | 47.35 |
| 2014 | 51 | 35.12 | - | - | 40 | 19.67 |
| 2015 | 33 | 23.90 | 06 | 7.42 | 37 | 24.96 |
| 2016 | 05 | 3.01 | 06 | 5.67 | 12 | 7.39 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2017 | 02 | 1.50 | 05 | 8.40 | 07 | 9.90 |
| 2018 | 08 | 6.66 | 53 | 65.30 | 61 | 72.96 |
| 2019 | 08 | 6.05 | 59 | 70.86 | 66 | 76.51 |
| 2020 | 03 | 2.1 | 11 | 11.80 | 12 | 13.30 |
| 2021 | 00 | 00 | 31 | 36.15 | 31 | 36.15 |
| **එකතුව** | 237 | 176.91 | 171 | 205.6 | 350 | 320.18 |

වගුව 05- ණය යෝජනා ක්‍රමයේ සමස්ථ ප්‍රගතිය

| **වර්ගය** | **මද ආශ්‍රිත කර්මාන්ත** | | **වර්ගය** | **මද නොවන කර්මාන්ත** | |
|---|---|---|---|---|---|
| පොල්තෙල් | 02 | 3.0 | කොහු | 8 | 7.8 |
| - | - | - | අඟුරු | 1 | 1.0 |
| **එකතුව** | **02** | **3.0** | **එකතුව** | **9** | **8.8** |

වගුව 06-කර්මාන්ත වර්ගය අනුව

| **වර්ෂය** | **අයදුම්කරුවන් ගණන** | **ණය මුදල (රු.මිලියන)** | **මුදල් පියවීම** | | **ගෙවීමට ඉතිරිව ඇති ණය මුදල් (රු.මිලියන)** | |
|---|---|---|---|---|---|---|
| 2012 | 27 | 17.61 | 26 | 15.61 | 1 | 0.088 |
| 2013 | 100 | 80.96 | 96 | 77.97 | 4 | 1.8 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2014 | 51 | 35.12 | 47 | 32.64 | 4 | 0.89 |
| 2015 | 33 | 23.90 | 28 | 21.45 | 5 | 0.73 |
| 2016 | 05 | 3.01 | 02 | 0.265 | 3 | 0.29 |
| 2017 | 02 | 1.50 | 01 | 0.50 | 1 | 0.53 |
| 2018 | 08 | 6.66 | - | - | 8 | 3.7 |
| 2019 | 08 | 6.05 | - | - | 8 | 4.81 |
| 2020 | 03 | 2.1 | 01 | 0.5 | 1 | 1.09 |
| **මුළු** | **237** | **176.91** | **201** | **148.94** | **35** | **14.01** |

වගුව 07- මහජන බැංකුවේ කප්රුක නිපැයුම් දිරිය ණය මුදල් පියවීමේ විස්තර

| **විස්තරය** | 2020 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| | **ණය ලාභීන් ගණන** | **ණය මුදල (රු.මි.)** | **අය විය යුතු ණය මුදල (රු.මි.)** | **ණය ලාභීන් ගණන** | **ණය මුදල (රු.මි.)** | **අය විය යුතු ණය මුදල (රු.මි.)** |
| **12.31** දිනට | 46 | 35.25 | 17.32 | 01 | - | - |

වගුව 08-මහජන බැංකුවේ - "කප්රුක නිපැයුම් දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක ණය ලාභීන්ගේ විස්තර

| වර්ෂය | බැංකුවේ නිර්දේශය | | | | | | අධිකාරියේ නිර්දේශය ලද | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පොළී සහන ගණන | | ණය මුදල ( රු.මී. ) | | පොළී සහන මුදල ( රු.මී. ) | | ගෙවූ පොළී සහන ගණන | | ගෙවූ පොළී සහන මුදල ( රු.මී. ) | |
| | **2020** | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** | **2021** |
| 1 වන කාර්තුව | 30 | 18 | 22.41 | 15.06 | 0.24 | 0.243 | 17 | 06 | 0.19 | 0.12 |
| 2 වන කාර්තුව | 03 | 24 | 4.5 | 19.63 | 0.11 | 0.23 | 01 | 11 | 0.005 | 0.14 |
| 3 වන කාර්තුව | 13 | 18 | 8.9 | 15.95 | 0.12 | 0.19 | 05 | 09 | 0.058 | 0.116 |
| 4 වන කාර්තුව | 22 | - | 18.06 | - | 0.65 | - | 14 | - | 0.59 | - |
| එකතුව | **68** | **60** | **53.87** | **50.64** | **1.12** | **0.663** | **37** | **26** | **0.843** | **0.376** |

වගුව 09- 2019 හා 2020 වසර වලට අදාළ පොළී ප්‍රතිදාන ගෙවීම්

| **වර්ෂය** | **2020** | **2021** |
|---|---|---|
| බැංකුවේ නිර්දේශිත පොළී මුදල | 1.12 | 0.663 |
| අධිකාරිය මඟින් ගෙවීම් | 0.843 | 0.37 |
| බැංකුවේ නිර්දේශයෙන් ගෙවීම්හි ප්‍රතිශතය | **75.2%** | **55.8%** |

වගුව 10-2019 හා 2020 වසර වලට මහජන බැංකුවට, අධිකාරිය විසින් ගෙවන ලද අදාළ පොළී ප්‍රතිදාන සාරාංශ

| | |
|---|---|
| 2021.12.31 දිනට අධිකාරිය වෙත ලද අයදුම්පත් ගණන | 29 |
| 2021 වසරේ ණය ලබා දී ඇති අයදුම්පත් ගණන | 10 |
| ඊට අදාළ ණය මුදල | රු 18,600,000.00 |

වගුව 11 - 2020 වසරේ "කප්රුක ජය ඉසුර" ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය

මෙම ණය යෝජනා ක්‍රම දෙක පිළිබඳව හා අධිකාරිය මඟින් කර්මාන්ත ක්ෂේත්‍රයට ඉටුවෙන සේවාවන් පිළිබඳවත් පොල් කටු ව්‍යාපාරය හා පොල් ලෙලි ව්‍යාපාරයන් ගෘහස්ථ මට්ටමින් ආරම්භ කරගනිමින් කර්මාන්ත ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ඨ විය හැකි ආකාරය පිළිබඳව වැඩමුළු පවත්වන ලදී .

එසේම ණය යෝජනා ක්‍රම වල ප්‍රගතිය මෙන්ම, ක්‍රියාත්මක කිරීමේදී බැංකු ආශ්‍රිතව පැන නගින ගැටළු ද සාකච්ඡා කරමින් ණය යෝජනා ක්‍රම මඟින් කර්මාන්තකරුවන් මෙතෙක් අත් කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.

මීට අමතරව මෙම ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සුදුසුකමක් ලෙස අධිකාරියේ ලියාපදිංචිය ද බලපාන බැවින් ණය ලබා ගැනීමේ අරමුණ ඇතිව නව ලියාපදිංචිකරුවන් ලෙස ලියාපදිංචියේ වර්ධනයක් ද ඇති වී ඇත. එනම් ණය යෝජනා ක්‍රමය මෙන්ම අනිකුත් සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් කර්මාන්තකරුවන් අධිකාරියේ ලියාපදිංචිය සඳහා යොමු කිරීමද වක්‍රාකාරව සිදුවේ.

## 8. පොල් කොහු කෙඳි නිෂ්පාදනායතන වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන සහය ලබා දීම.

කොහු කෙඳි නිෂ්පාදන වල තත්ත්වය උසස් කිරීම සඳහා කොහු කෙඳි කර්මාන්තායතන සඳහා යහපත් නිෂ්පාදන සහතිකය හඳුන්වා දෙන ලදී. නමුත් බොහොමයක් කොහු කෙඳි කර්මාන්තකරුවන් හට යහපත් නිෂ්පාදන පුරුදු (GMP) සහතිකය ලබා ගැනීමට නොහැකි වීමට බලපාන ලද ප්‍රධාන සාධකයක් ලෙස වියලුම් පිට්ටනියක් නොමැති වීම විගණන අධීක්ෂණ වලදී හඳුනා ගන්නා ලදී.

ඒ අනුව වියලුම් පිට්ටනි නොමැති කොහු කෙඳි කර්මාන්තකරුවන් වෙත ආයෝජන සහය ලබා දීමේ ව්‍යාපෘතියක් 2017 වසරේ සිට ආරම්භ කරන ලදී. 2017 වසරේ සිට 2020 වසර දක්වා කර්මාන්තායතන 144ක් වෙත වියලුම් පිට්ටනි ආයෝජන සහය ලබා දෙන ලදී. අධිකාරියේ ලියාපදිංචි කොහු කෙඳි කර්මාන්තායතන වලින් සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි ආයෝජන සහය ලබා දී ඇති අතර සෑම දිස්ත්‍රික්කයකම ලියාපදිංචි කොහු කෙඳි කර්මාන්තායතන වලින් 50%කට ආසන්න ප්‍රමාණයකට ආයෝජන සහය ලබා දී ඇත. 2020 වසරේ සිට වියළීමේ ක්‍රමවේදය තවදුරටත් විධිමත් කිරීම සඳහා සංවෘත වියලුම් පිට්ටනි සඳහාද ආයෝජන සහය ලබාදෙන ලදී.

පොල් ත්‍රිකෝණයෙන් පිටත දිස්ත්‍රික්කද ප්‍රධාන වශයෙන් සලකා බලමින් වියලුම් පිට්ටනි නොමැති කොහු කෙඳි කර්මාන්තකරුවන් වෙත ආයෝජන සහය ලබා දීම 2021 වසරේද ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා කර්මාන්තායතන 44ක් වෙත රු.මි. 17.6 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. එහිදී 2021 වර්ෂයේ කොහු කෙඳි කර්මාන්තකරුවන් 43 දෙනෙකු සඳහා වියලුම් පිට්ටනි සඳහා ආයෝජන සහය ලබා දීමට හැකි විය. එහි ප්‍රගතිය 97.72% කි.






රූපය 06- ඉදි කරන ලද සංවෘත හා විවෘත වියලුම් පිටි කිහිපයක්

**9. සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන්ගේ හා කර්මාන්තවල සේවයේ නියුතු තාක්ෂණික සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා නියුක්තිය සඳහා නිපුණතා සංවර්ධනය කිරීම.**

සැකසුම් සංවර්ධන අංශය වෙත පැවරී ඇති කාර්යයභාරය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කර ගැනීමේ අවශ්‍යතාවය මත හා අංශයේ කාර්ය මණ්ඩලය මඟින් වඩාත් ප්‍රශස්ත මට්ටමින් රාජකාරී ඉටුකරවා ගැනීමේ අරමුණින් 2021 වර්ෂයේදී ද ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු හා මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර, ඒ අනුව පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

එහිදී මූලික වශයෙන් විගණන පුහුණු හා රාජකාරිමය අවශ්‍යතාවය මත ISO, HACCP හා GMP සහතිකකරණය සම්බන්ධ වැඩමුළු හා වෙනත් තත්ත්ව කළමනාකරණ පාඨමාලාවන් සඳහා සැකසුම් සංවර්ධන අංශයේ කාර්යය මණ්ඩලය සහභාගී කරවන ලදී. මෙම පුහුණු කිරීම් සඳහා කර්මන්තකරුවන්ද සහභාගී කරවූ අතර වැයවූ මුදල රුපියල් මිලියන 2.15කි.

| අංකය | ආයතනය | පුහුණු පාඨමාලාව |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI ) | ISO 14001:2018 Awareness programme |
| 2. | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය(SLSI ) | Awareness programme on covid-19b free management system |
| 3 | ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ ජාතික ආයතනය (NIBM) | Import & export procedures |
| 4. | අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ( SLAB ) | Awareness programme on ISO 17020:2012 |
| 5. | අනුකූලතා තක්සේරු පිලිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ( SLAB ) | Internal audit training on ISO 17020:2012 |
| 6. | ආහාර විද්‍යාව හා තාක්ෂණ ආයතනය (IFST) | Problems regarding the manufacturing of coconut oil |
| 7. | ආහාර විද්‍යාව හා තාක්ෂණ ආයතනය (IFST) | Problems regarding the manufacturing of copra & VCO |
| 8. | ආහාර විද්‍යාව හා තාක්ෂණ ආයතනය (IFST) | Problems regarding the value added products |
| 9. | Food Safety & Quality Solutions, කැනඩාව | Awareness programme on BRC |
| 10. | පොල් පර්යේෂණ ආයතනය ( CRI) | Awareness programme on manufacturing of coconut oil |

වගුව 12-2021 වර්ෂයේ සිදු කරන ලද පුහුණු වැඩසටහන්





රූපය 07 -2021 වර්ෂයේ පොල් පර්යේෂණ ආයතනයේ සම්පත් දායකත්වය ලබාගෙන කරන ලද පුහුණු වැඩසටහනක්

**10. සැකසුම් සංවර්ධන අංශයේ පරීක්ෂණ ඒකකය වෙත පරීක්ෂා කිරීම් සඳහා වූ ISO 17020:2012 ප්‍රතීතන/ අනුකූලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කිරීම.**

ISO 17020:2012 යනු පරීක්ෂා කිරීම් සඳහා අන්තර්ජාතිකව ලබාදෙනු ලබන ප්‍රතීතනයයි. සැකසුම් සංවර්ධන අංශය ඉහත සඳහන් කල පරිදි කර්මාන්ත නියාමනය කිරීමේදී නිරන්තර පරීක්ෂා කිරීම් සිදුකරනු ලබයි. මෙම පරීක්ෂා කිරීම් සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති කරනු පිණිස අංශයේ පරීක්ෂණ ඒකකයක් පිහිටුවා ඒ වෙත අදාළ සහතිකකරණය ලබා ගැනීම සඳහා කටයුතු ක්‍රියාත්මක කෙරුණි. මෙහිදී, අවශ්‍ය පුහුණුවීම් ලබා දෙමින්, විවිධ ලේඛන, ක්‍රියාපටිපාටි, අදාළ අනෙකුත් ලියකියවිලි ලේඛනගත කරමින් ගොඩනගන ලද පද්ධතියට ප්‍රථම වතාවට 2020 වසරේ ප්‍රතීතනය ලබාගත් අතර, 2021 වර්ෂයේදී එහි වාර්ෂික විගණන කටයුතු සාර්ථකව නිම කරමින්, අඛණ්ඩව සහතිකකරණය භාවිතා කිරීමට අවස්ථාව උදා කරගන්නා ලදී.

ප්‍රතීතන සහතිකය ලබාගැනීමෙන් පසු, නැවුම් පොල්තෙල්, පොල් කිරි, පොල් වතුර සහ කොහුබත් උපස්ථර යන නිෂ්පාදන සඳහා ද ප්‍රතීතන සහතිකය ලබාගැනීමට අවශ්‍ය මූලික ලියකියවිලි සකස් කිරීම ආරම්භ කරන ලදී. නමුත්, 2020 හා 2021 වසරේ ඇතිවූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතු යම් පසුබෑමකට ලක්වුව ද, 2022 වසරේදී මෙම කටයුතු තවදුරටත් ඉදිරියට කරගෙන යාමට නියමිතය.




රූපය 08-පරීක්ෂණ ඒකකයේ නිලධාරීන් හට පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහනක්

**11. නිෂ්පාදන ක්‍රමවේදයන් වලංගු කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කිරීම.**

කර්මාන්ත ක්ෂේත්‍රය වෙත නවීන තාක්ෂනය යොදා ගැනීමත් සමඟ අදාළ ක්‍රමවේදයන්හි වලංගුභාවය තහවුරු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.මේ අනුව මේ වන විට කාර්මික තාක්ෂණ ආයතනය හා එක්ව ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව, දිසිඳි පොල් කර්මාන්ත ආයතනවල මේ වන විට භාවිතාවන භූමාලය මඟින් සිදුකරන විෂබීජහරණය ක්‍රියාවලිය (steam blanching) වලංගු කිරීම සිදු කරන අතර, පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ව්‍යාපෘතිය සිදු කිරීමේ යම් පසුබෑමක් දක්නට ඇතත්, 2022 වර්ෂය වන විට අවසන් අදියරට ලඟා වීමට නියමිතය.

**2021 වසරේදී ලංකාවට ආනයනය කරනලද *Aflatoxin* අනුමත ප්‍රමාණයට වඩා වැඩි පොල්තෙල් නිසා ඇතිවූ ආන්දෝලනාත්මක තත්ත්වය හේතුවෙන් එම ආනයනික පොල්තෙල් වල ප්‍රමිතිය පිළිබඳ ගැටළුවක් ඇතිවිය. මෙහිදී, එම පොල්තෙල් පිරිපහදුකරන ක්‍රමවේදයේ ප්‍රමිතිය පිළිබඳව ගැටළු ඇති විය. එම ගැටලුවට විසඳුමක් ලෙස පිරිපහදු කරනලද පොල්තෙල් (RBD) නිෂ්පාදනය කිරීමේදී භාවිතා කරනු ලබන ක්‍රමවේදය වලංගු කිරීම සඳහා කාර්මික තාක්ෂණික ආයතනය සමඟ වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම කර්මාන්තකරුවන් සඳහා වාර්ෂික ලියාපදිංචියේදී මෙම ක්‍රමවේදයට ඇතුලත්වීම අනිවාර්යකර ඇත. මෙහිදී, RBD තෙල් නිෂ්පාදනය කරනු ලබන ක්‍රමවේදය වලංගු කිරීම් සිදුකරන අතර, අධිකාරිය සහ කාර්මික තාක්ෂණික ආයතනය මඟින් නිරන්තර නියැඳි පරීක්ෂා කිරීම් සිදුකිරීමට නියමිත වේ.**

**12. අවිධිමත් කර්මාන්ත සඳහා අගය වැඩි කල නිෂ්පාදන හඳුන්වාදීම සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

පොල් ආශ්‍රිත නිෂ්පාදන විධිමත්ව සහ අවිධිමත්ව සිදු කරනු ලබන අතර, නිෂ්පාදන තුළින් ලබන අපනයන ආදායමින් 10% ක පමණ ප්‍රමාණයක් අවිධිමත්ව සිදු කරණු ලබන නිෂ්පාදන වලින් ලබා ගනී.

මෙම නිෂ්පාදන පොල් ආශ්‍රිත අමුද්‍රව්‍ය කරගනිමින් සිදු කරණු ලබන අතර, මෙම කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන ප්‍රමාණය 25,000 කට ආසන්න වේ. ඔවුන්ගෙන් වැඩි ප්‍රමාණයක් අඩු ආදායම්ලාභී කාන්තාවන් වේ. මෙම ක්ෂේත්‍රය වැඩිදුරටත් සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. පොල් හා පොල් ආශ්‍රිත සුළු පරිමාණ අවිධිමත්ව සිදු කරනු ලබන කර්මාන්ත විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් සිදු කරනු ලබන අතර ඇතැම් කර්මාන්ත දේශීය හා විදේශීය වෙළඳපොළට නිෂ්පාදන ද්‍රව්‍ය සපයනු ලැබේ. මේවා අතරින් වැඩිමනත් කර්මාන්ත අපනයනය අරමුණු කර ගනිමින් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලැබේ. මෙම කර්මාන්ත දිවයින පුරා ව්‍යාප්තව ඇති අතර ගෘහස්ථ හා සාමුහිකව සිදු කරනු ලැබේ.අධිකාරිය මඟින් පවත්වන පුහුණු වැඩසටහන් මඟින් කොහු භාවිතා කර කොසු සැකසීම, පාපිසි නිෂ්පාදනය, තවාෂි බුරුසු සැකසීම, ලණු නිෂ්පාදනය සහ පොල් ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධව දිවයින පුරා පුහුණු වැඩ සටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලෙස අමු ද්‍රව්‍ය නාස්තිය අවම කිරීම සහ අඩු ආදායම්ලාභීන් සඳහා ස්වයං රැකියා ආරම්භ කර ආදායම් උත්පාදනයට හැකියාවක් ලැබී ඇත.

මීට අමතරව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ ඉල්ලීම පරිදි මත්ද්‍රව්‍ය සඳහා යොමුවූ පිරිස් සමාජගත කිරීමේ කාර්යයේ එක් අංගයක් ලෙස පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා පුහුණුව ලබාදීම පොල් සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරනු ලබයි. 2021 වසරේ මෙම වැඩසටහන් පල්ලෙකැලේ හා වීරවිල පුනරුත්ථාපන මධ්‍යස්ථාන වල කාර්යාංශයේ ඉල්ලීම පරිදි සංවිධානය කරනු ලැබේ. වැඩසටහන සඳහා වැයවන මුදල පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් ප්‍රතිපූරණය කෙරේ.

ග්‍රාමීය ආර්ථිකය සවිබල ගන්වමින් ජීවනෝපාය ඉහල නැංවීම සඳහා පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ගුණාත්මකව සිදු කිරීම සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් දැනුවත් කිරීමේ වැඩසටහන් 18 ක් ප්‍රතිලාභීන් 352 ක සඳහා ක්‍රියාවේ යොදවන ලදී.




රූපය 09- ඉදල් හා මුසුන් පුහුණු වැඩසටහන - ආණමඩුව






රූපය 10- ලණු නිෂ්පාදනය කිරීමේ පුහුණු වැඩසටහන - බෝගස්වැව




රූපය 11 -ඉදල් හා මුසුන් නිෂ්පාදනය තාක්ෂණික හුවමාරු වැඩසටහන - පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර




රූපය 12- ඉදල් නිෂ්පාදන තාක්ෂණික හුවමාරු වැඩසටහන - එළිමහන් සිරකඳවුර වීරවිල




රූපය 13 - ඉදල් නිෂ්පාදන තාක්ෂණික හුවමාරු වැඩසටහන ගාල්ල දිස්ත්‍රික්කය සන්නද්ධ බුද්ධි බලකාය - කරන්දෙණිය

**13. පරිසර හිතකාමී පොල්කටු දහන උඳුන් ඉදි කිරීම සඳහා අවිධිමත් අංශයේ කර්මාන්තකරුවන් වෙත ආයෝජන සහය ලබා දීම.**

තත්ත්වයෙන් උසස් පොල්කටු අඟුරු නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් දිරිමත් කිරීම සඳහා, යෝග්‍ය තාක්ෂණය ලබා ගැනීම වෙනුවෙන් කර්මාන්තකරුවන් 12 දෙනෙකු සඳහා ආයෝජන සහාය ලබා දෙන ලදී. පොල්කටු අඟුරු හා ඒ ආශ්‍රිත වටිනාකමින් යුත් අඟුරු නිෂ්පාදන ඒකක ආරම්භ කරන ව්‍යවසායකයින් සංවිධානගතකර සකසුරුවම්භාවය පුරුදුකර සමාජ ආර්ථික මට්ටම ඉහළ නැංවීම සහ පරිසරහිතකාමී ලෙස ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීම දිරි ගැන්වීම මේ යටතේ සිදු කරනු ඇත.




රූපය 14- ඉදිකරන ලද පොල්කටු දහන උඳුනක්




රූපය 15 - ආයෝජන සහය ප්‍රදානය කෙරුණු අවස්ථා කීපයක්

**14. අවිධිමත් කර්මාන්තය ආශ්‍රිතව සැකසුම් ඒකක ස්ථාපිත කිරීම.**

මේ සඳහා වියදම් කරන ප්‍රාග්ධනය අඩු මට්ටමක පැවතියද ඒ තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ වඩා වැඩි අගයක් ගනී. එබැවින්, අවිධිමත්ව පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සිදු කිරීම මඟින්, ගුණාත්මකභවෙන් අඩු නිෂ්පාදන සිදු කිරීම මෙන්ම අමුද්‍රව්‍ය නාස්ති වීමක් සිදු වේ. එම තත්ත්වය අවම කිරීමේ අරමුණින් සහ ග්‍රාමීය ආර්ථිකය නංවාලීමේ අරමුණ ඇතිව ඒ ඒ ප්‍රදේශ වල පොල් ආශ්‍රිත නිෂ්පාදන ආරම්භ කිරීමේ ඇති විභවතාවය සලකා බලා පොල් ආශ්‍රිත නිෂ්පාදන ඒකක 08 ක් ස්ථාපනය කිරීම සිදු කරන ලදී.

ඒ අනුව, ඒ ඒ ප්‍රදේශ වල ගෘහස්ථව සිදු කල හැකි තවාෂි බුරුසු, ඉදල් හා මුසුන්, කොහු ලණු, ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත්වන අඩු ආදායම්ලාභී සහ සමෘධිලාභී පවුල් තෝරා ගෙන, ඔවුන් අතරින් පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් සඳහා එම නිෂ්පාදනය පිළිබඳව තාක්ෂණික දැනුම ලබා දී කණ්ඩායම් ගත කර සමිතියක් පිහිටුවා මධ්‍යස්ථානයක් කේන්ද්‍ර කරගනිමින් ගැනුම්කරුවෙකු සම්බන්ධ කර ගම්මාන පිහිටුවන ලදී. එම පිහිටුවන ලද ගම්මාන පහත පරිදි දැක්විය හැකිය.

| | **දිස්ත්‍රික්කය** | **ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය** | **සවිබල ගැන්වීමට අපේක්ෂිත පවුල් ප්‍රමාණය** |
|---|---|---|---|
| 01 | මොණරාගල | බිබිල | 40 |
| 02 | පුත්තලම | මුන්දලම | 30 |
| 03 | වව්නියාව | බෝ ගස් වැව | 40 |
| 04 | බදුල්ල | රිදීමාලියද්ද | 40 |
| 05 | පොළොන්නරුව | කදුරුවෙල | 40 |
| 06 | හම්බන්තොට | අගුණුකොලපැලැස්ස | 30 |
| 07 | කුරුණෑගල | මහව | 20 |
| 08 | කළුතර | මතුගම | 40 |
| **එකතුව** | | | **280** |

වගුව 13-2021 වර්ෂයේ පිහිටුවන ලද සැකසුම් ඒකක පිලිබඳ සාරාංශයක්





රූපය 16 -පුත්තලම දිස්ත්‍රික්කය තවාෂි බුරුසු නිෂ්පාදන ගම්මානය ආරම්භ කිරීම





රූපය 17 -පුත්තලම දිස්ත්‍රික්කය මුන්දලම අත් ලණු නිෂ්පාදන ගම්මානය ආරම්භ කිරීම





රූපය 18 -කළුතර දිස්ත්‍රික්කය මතුගම තවාෂි බුරුසු නිෂ්පාදන ගම්මානය ආරම්භ කිරීම





රූපය 19-රිදීමාලියද්ද තවාෂි බුරුසු නිෂ්පාදන ගම්මානය ආරම්භ කිරීම





රූපය 20 -මොණරාගල දිස්ත්‍රික්කය තවාෂි බුරුසු නිෂ්පාදන ගම්මානය ආරම්භ කිරීම





රූපය 21- අගුණුකොලපැලැස්ස අත් ලණු නිෂ්පාදන ගම්මානය - ආරම්භය

**කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශන**

2022 වර්ෂය උදාවීමට සමගාමීව වෙන්නප්පුව ප්‍රදේශයේ පැවති වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා පොල් සංවර්ධන අධිකාරිය සක්‍රීයව දායක විය.









රූපය 22-පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශන කීපයක්

## පොල් තෙල් නිෂ්පාදන - නියමු ව්‍යාපෘතිය

දකුණු පළාත තුල මේ වන විට පොල් කර්මාන්තය සඳහා ආයෝජකයින් යොමු වීමේ වැඩි නැඹුරුතාවයක් දැකිය හැකි අතර, ඒ අතරින් පොල්තෙල් නිෂ්පාදනය කිරීම සඳහා යොමුවීම විශේෂ වේ. එබැවින් පොල්තෙල් නිෂ්පාදනය ගුණාත්මකව හා කාර්යක්ෂම ලෙස සිදු කිරීමේ අපේක්ෂාව ඇතිව පොල්තෙල් නිෂ්පාදන නියමු ව්‍යාපෘතියක් දකුණු පළාත තුල සිදු කිරීමට සැලසුම් කර ඇත.

එම ව්‍යාපෘතිය සිදු කිරීම ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සන්නද්ධ බුද්ධි බලකාය මඟින් ආරම්භ කර ඇති සුදු පොල්තෙල් නිෂ්පාදන ආයතනය හරහා සිදුකල අතර, නිෂ්පාදන ක්‍රියාවලියේ කටයුතු සඳහා වැයවූ මුදල් වලින් කොටසක් සඳහා අධිකාරියෙන් මුල්‍ය සහයක් ලබාදෙන ලදී.

## 02.තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

තත්ත්ව පාලන කටයුතු පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අපනයන තොග වල ගුණාත්මක භාවය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි පරීක්ෂණ පහසුකම් සැපයීම, පොල් නිෂ්පාදන දේශීය වෙළඳපොළට යොමු වීමේදී පරීක්ෂා කොට සහතික නිකුත් කිරීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා උපදේශකත්වය සැපයීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන වගකීමයි'
අංශයේ කාර්යයන්ට්

1. අපනයනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම හා තත්ත්වය සහතික කිරීම

   - දිසිදි පොල් හි ක්ෂුද්‍රජීවී හා භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම

     පොල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම මද ආශ්‍රිත නිෂ්පාදනය වන දිසිදි පොල් කර්මාන්තය ප්‍රධාන වශයෙන් මනා තත්ත්ව පාලනයකට යොමු කරන අතර දෙන-ික දිසිදි පොල් නිෂ්පාදන සියල්ල තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ දී දිනපතා පරීක්ෂාවට භාජනය කෙරේ අපනයනය සඳහා යොමු වන මෙම නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම පිණිස මෙම පරීක්ෂණ ප්‍රතිඵල දායකවේ

   - කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීම

2. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්, අපනයනකරුවන් හා පාරිභෝගික ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවක් ලෙසට රසායනාගාර පරීක්ෂණ සේවා, සහන ගාස්තු ක්‍රමයක් යටතේ සිදුකිරීම.
   ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ප්‍රමිතීන් හි දැක්වෙන ක්ෂුද්‍රජීවී හා භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීමේ හැකියාව පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය සතු වන අතර පොල් කර්මාන්තයේ නියැළි ව්‍යවසායකයන්ගේ අභිවෘද්ධිය සඳහා කඩිනම් පරීක්ෂණ සේවාවන් ලබාදීමට සෑම විටම කටයුතු කරනු ලැබේ.

3. දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී, භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම
   අධිකාරියේ රසායනාගාරයේ සිදුකරන පරීක්ෂා හැරුණු කොට දිසිදි පොල් නිෂ්පාදනාගාර ආශ්‍රිත දිසිදි හා ජල ආදර්ශ රැස්කොට පරීක්ෂා කර ප්‍රතිඵල සපයා පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා නිෂ්පාදනයන්හි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා දායකවේ.

4. තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනික හා ක්ෂුද්‍රජීවී රසායනාගාර සඳහා ISO 17025 තත්ත්වය පවත්වා ගැනිමේ කටයුතු සිදුකිරීම.

5. පොල් තෙල් කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම හා නඟාසිටුවීම අරමුණු කරගනිමින් අදාළ පරීක්ෂණ සිදුකිරීමට පොල් තෙල් නිෂ්පාදනාගාරයන් හි සෞඛ්‍යාරක්ෂිතභාවය පරීක්ෂා කිරීම හා පොල් තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය වන කොප්පරා, නිෂ්පාදිතය වන පොල් තෙල් හා එහි අතුරුඵලය වන පුන්නක්කු ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වන්නේදැයි පරීක්ෂා කිරීම

6. දේශීය වෙළඳපොළෙහි පවතින මිශ්‍ර පොල් තෙල් හඳුනාගැනීමේ පරීක්ෂා සිදුකිරීමේ සහ අපගමනය වීම පරිභෝගික අධිකාරියට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත දැනුම් දීම. පොල් තෙල් නිෂ්පාදනයන්හි තත්ත්වය පරීක්ෂා කිරීම සිදුකරන අතර හඳුනාගත් මිශ්‍ර පොල් තෙල් විකුණුම්කරුවන් පිළිබඳ විස්තර පාරිභෝගික කටයුතු පිළිබඳ වන පාරිභෝගික අධිකාරිය සහ ආහාරමය ද්‍රව්‍ය සඳහා පාලනමය බලතල ඇති ආයතනය වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත සපයා එකී ආයතන සමඟ එක්ව කටයුතු කර මිශ්‍ර පොල් තෙල් අනුභවයෙන් පාරිභෝගික ජනතාව රැකගැනීම සඳහා සේවාවන් සැපයීම.

7. පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව පැන නැගෙන දේශීය හා විදේශීය පැමිණිලි හමුවේ නිෂ්පාදන පරීක්ෂණ සිදුකිරීම.
8. පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ ප්‍රදර්ශණ සඳහා සහභාගී වීම.
9. ආහාරමය වෙනත් නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාවන් පවත්වා ගෙන යාම.
10. වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම සහ දැනට ප්‍රමිතීන් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සම්බන්ධවී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
11. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.


මේ අනුව ගුණාත්මක පොල් නිෂ්පාදන බිහිකිරීමත්, ඒ අනුව දේශීය හා විදේශීය වෙළඳපල වර්ධනය වීමත් අපේක්ෂා කරමින් පොල් නිෂ්පාදන පරීක්ෂා කිරීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකර ඇත. මෙකී සියළු කාර්යයන්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මකට අනුව සිදුකරනු ලබන අතර 2021 වාර්ෂික ප්‍රගතිය පහත පරිදි වේ.

## Q1 අපනයනය සහ දේශීය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හි තත්ත්වය සහතික කිරීම

## A පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම

පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන්හි පරීක්ෂණ කටයුතු ලෙස ප්‍රධාන වශයෙන් සිදුවන්නේ දිසිදි පොල් සඳහා වේ. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි සිදුවන දෛනික නිෂ්පාදන, සැල්මොනෙල්ලා පරීක්ෂාවට භාජනය කිරීම, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ක්ෂුද්‍රජීවී රසායනාගාරයේදී සිදුකෙරේ. මේ අනුව අපනයනය සඳහා යොමුවන දිසිදි පොල් නිෂ්පාදනයන් සියල්ල පරීක්ෂාවට භාජනය කෙරේ.


2021 වසර සඳහා දෛනික දිසිදි නිෂ්පාදන ආදර්ශ පරීක්ෂා කිරීමේ ඉලක්කය ආදර්ශ 6500කි. ආදර්ශ 7687ක් සැල්මොනෙල්ලා සඳහා පරීක්ෂා කර 2021 වසරේදී මෙම පරීක්ෂණ වෙනුවෙන් 118% ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත. 2020 වසරේදී පරීක්ෂා කර ඇති ආදර්ශ ගණන 5935ක් වන අතර 2021 වසරේ ප්‍රගතිය, 2020 වර්ෂයට සාපේක්ෂව 30%කි.




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදර්ශ ප්‍රමාණය | 6532 | 10223 | 9318 | 6498 | 11609 | 9597 | 11265 | 7097 | 6060 | 10000 | 5935 | 7687 |
| නිෂ්පාදනය MT | 28850 | 46620 | 41645 | 29200 | 50368 | 41795 | 51219 | 29557 | 24625 | 44081 | 25256 | 33289 |

ප්‍රස්ථාරය 01- දිසිදි නිෂ්පාදන හා ආදර්ශ ලැබීම

2020 වසරේදී පරීක්ෂාවට භාජනය කල දිසිදි පොල් නිෂ්පාදන අතුරින් ආදර්ශ 02ක් සැල්මොනෙල්ලා විෂගතවීම වාර්තා විය. ප්‍රතිශතයක් ලෙස විෂගතවීම් 0.03%කි. 2021 වසරේදී විෂගතවීම ආදර්ශ 41ක් වන අතර 2021 වසරේදී ක්ෂුද්‍රජීවී පරීක්ෂාවට භාජනය කල දිසිදි ආදර්ශයන්හි ප්‍රතිශතයක් ලෙස ගත්කල මෙය 0.53% වේ.





ප්‍රස්ථාරය 02- සැල්මොනෙල්ලා විෂගතවීම-දිසිදි පොල් දෛනික ආදර්ශ

| වසර | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විෂගතවීම් ප්‍රතිශතය % | 0.12 | 0.2 | 0.08 | 0.14 | 0.15 | 0.27 | 0.4 | 1.2 | 0.26 | 0.09 | 0.03 | 0.53 |

වගුව 14 - සැල්මොනෙල්ලා විෂගතවීම-දිසිදි පොල් දෛනික ආදර්ශ

පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයි. 2020 වසරේදී ආදර්ශ 1210ක් පරීක්ෂා කර ඇති අතර 2021 වසරේදී ආදර්ශ 2153ක් පරීක්ෂා කර ඇත. 2021 වසරේ ප්‍රගතිය, 2020 වර්ෂයට සාපේක්ෂව 78% කි. මෙම ආදර්ශ 2153 හි පරීක්ෂණ 2598ක් සිදුකර ඇත. 2021 වර්ෂයේදී කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව, ප්‍රගතිය 94%කි. පරීක්ෂා කල ආදර්ශ අතුරින් සැල්මොනෙල්ලා විශගතවීම් ආදර්ශ 15ක් පමණක් වාර්තා වී ඇති අතර ආදර්ශයන්හි ප්‍රතිශතයක් ලෙස ගත්කල මෙය 3.5% වේ. ආදර්ශ 12ක් ඊකෝලයි බැක්ටීරියාව සඳහා වන ප්‍රමිති සීමාවන් ඉක්මවා ඇති අතර ආදර්ශන්හි ප්‍රතිශතයක් ලෙස 0.56% කි.පසුගිය වර්ෂ සමඟ සැසඳීමේදී කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන ආදර්ශ, වැඩිම ප්‍රමාණයක් පරීක්ෂණ සඳහා යොමු වී ඇත්තේ 2021 වර්ෂයේදීය.





**ප්‍රස්ථාරය 03- කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ක්ෂුද්‍රජීවී පරීක්ෂාව**

## B දිසිඳි පොල් නිෂ්පාදනයන්හි පුර්ව අපනයන භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම සහ සහතික කිරීම.

භෞතික හා සංවේදි පරීක්ෂා ලෙස, දිසිඳි පොල් හි වර්ණය, වර්ග කිරීම, තෙතමනය, රස, සුවඳ, අපද්‍රව්‍ය, කුරුටු, තෙල් බෙරීම යන පරීක්ෂා ප්‍රධානව සිදුකර ඇත.

මේ අනුව 2020 වසරේදී ආදර්ශ 6006ක් පරීක්ෂා කර ඇති අතර 2021 වසරේදී ආදර්ශ 7749 ක් පරීක්ෂා කර ඇත. මෙම ආදර්ශ 7749 හි සිදුකර ඇති සම්පුර්ණ පරීක්ෂණ ගණන 61992 කි. 2021 වසරේ ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 119%කි.2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ආදර්ශ පරීක්ෂා කිරීමේ ප්‍රගතිය, 29% කි.




| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදර්ශ ප්‍රමාණය | 9913 | 8381 | 8333 | 6586 | 1030 | 9381 | 6509 | 1170 | 9643 | 1134 | 7097 | 6087 | 1012 | 6006 | 7749 |
| ඉලක්කය | 1025 | 8750 | 8500 | 8500 | 6800 | 9500 | 6500 | 1050 | 9250 | 9500 | 7500 | 6500 | 9500 | 7000 | 6500 |

ප්‍රස්ථාරය 04-දෛනික දිසිඳි පොල් නිෂ්පාදනයන්හි භෞත රසායනික පරීක්ෂාව

2020 වර්ෂය තුල පරීක්ෂණයට භාජනය කල දිසිඳි ආදර්ශ 6006 අතුරින් ආදර්ශ 641ක් එනම් 11%ක් භෞතික ලක්ෂණයන්හි අඩුපාඩු පෙන්නුම් කරන ලද අතර 2021 වර්ෂයේදී පරීක්ෂා කල ආදර්ශ 7749න් ආදර්ශ 514 එනම් 7%ක් එම අඩුපාඩු පෙන්වා ඇත. මේ අනුව භෞතික ලක්ෂණයන්හි ප්‍රමිතියානුකූල නොවීම 2021 වර්ෂයේදී තරමක අඩුවීමක් සිදුවී ඇත. මෙලෙස ශ්‍රී ලංකා ප්‍රමිතිය හා එකඟ නොවූ ආදර්ශ අතුරින් වැඩිම ප්‍රතිශතය වන 38.7% ක් වර්ණය අනුව ප්‍රමිතියට නොගැලපීමකි. තත්ත්ව දෝශ වාර්තාවීම පහත පරිදි වේ.

| පරාමිතිය | එකඟ නොවූ ආදර්ශ | |
|---|---|---|
| | ගණන | % |
| වර්ණය | 199 | 38.7 |
| තෙල් බේරීම | 15 | 3 |
| දැවුනු කැබලි | 198 | 38.5 |
| තෙතමනය | 27 | 5.3 |
| බාහිර අපද්‍රව්‍ය | 11 | 2.1 |
| කුරුටු | 175 | 34 |
| වර්ග කිරීම | 184 | 35.8 |

වගුව 15 - දෛනික දිසිදි පොල් නිෂ්පාදනයන්හි භෞත රසායනික පරීක්ෂාව


(ඇතැම් ආදර්ශ පරාමිතින් කිහිපයකින් ප්‍රමිතිය හා එකඟ නොවී ඇත.)

## Q2.පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවා පවත්වා ගැනීම

දේශීය නිෂ්පාදකයන්ගේ විවිධ පොල් නිෂ්පාදන විශ්ලේෂණය කිරීමේ සේවාව පවත්වා ගැනීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකරයි. ක්ෂුද්‍රජීවී පරීක්ෂා, රසායනික පරීක්ෂා, භෞතික පරීක්ෂා සහ සංවේදි පරීක්ෂා මේ යටතේ සිදු කෙරේ. මෙම සේවාව සාධාරණ මිලකට, සිදු කරන අතර ඉල්ලුම්කරුගේ අවශ්‍ය පරාමිතින්ට අදාළව පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලැබේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳ මහතුන් සහ අපනයන කරුවන් ආදී වූ ඕනෑම බාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාව ලබා දෙනු ලැබේ.

දිසිදි පොල්,මද වශයෙන් මේදය ඉවත් කල දිසිදි පොල්, කොප්පරා, පොල් කෙඳි, පොල් තෙල්, පුන්නක්කු, කොහු බත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන පොල් පිටි මෙන්ම වෙනත් විවිධ පොල් නිෂ්පාදන ද්‍රව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අදාළව පරීක්ෂා කිරීමේ රසායනාගාර සේවාව පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා අවශ්‍ය වන නවීන රසායනාගාර උපකරණ, තත්ත්ව පාලන අංශය සතු වන අතර කඩිනම් ප්‍රතිඵල ලබාදීම තත්ත්ව පාලන අංශයෙන් සිදුකරනු ලැබේ.
ප්‍රමිතියානුකූල ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා පරීක්ෂා කර එහි තත්ත්වයන් පිළිබඳව අවබෝධය ලබා ගැනීම උදෙසා නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහාත්, ශ්‍රී ලාංකික භාවය රැකෙන පරිදි තත්ත්වයෙන් උසස් පොල් නිෂ්පාදන නිරතුරුව විදේශීය වෙළඳපල කරා යොමු කරවීම පිණිස අපනයනකරුවන් දිරිගැන්වීම සඳහාත්, පොල් සංවර්ධන අධිකාරියෙහි ඉහත කී ලියාපදිංචි කාණ්ඩ සඳහා පරීක්ෂණ ගාස්තුවෙන් 15% ක වට්ටම් ගාස්තුවක් ලබාදේ.

පරීක්ෂා කර ගැනීම සඳහා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් යොමුවන අතර 2020 වසරේදී ආදර්ශ 867ක් පරීක්ෂා කර ඇත. 2021 වසර තුල ආදර්ශ 778ක් විශ්ලේෂණයකර ඇත. ඉලක්කය වන ආදර්ශ 750ට සාපේක්ෂ ප්‍රගතිය 104% වේ. මෙම ආදර්ශ 778 හි සිදුකර ඇති සම්පූර්ණ පරීක්ෂණ ගණන 1571කි. 2021 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අතුරින් සල්ෆර්ඩයොක්සයිඩ් හා ඇෆ්ලටොක්සින් පරීක්ෂණ සඳහා පමණක් දිසිදි ආදර්ශ 300ක් විශ්ලේෂණය කර ඇත. පොල් තෙල් ආදර්ශ පරීක්ෂාවද 2020ට සාපේක්ෂව සැලකිය යුතු පරිදි ඉහල ගොස් ඇත.මේ යටතේ පරීක්ෂා කල සියළුම ආදර්ශ වර්ග පහත දැක්වේ.




ප්‍රස්ථාරය 05- පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පරීක්ෂා කිරීමේ සේවාවන් පවත්වා ගැනීම

| වර්ෂය | දිසිඳි පොල් (ආදර්ශ) | භූන්නාක්කු (ආදර්ශ) | පොල් තෙල් (ආදර්ශ) | කොප්පරා (ආදර්ශ) | මද මේදය ඉවත් කරන ලද දිසිඳි පොල් (ආදර්ශ) | Coconut spread(ආදර්ශ) | පොල් ක්‍රීම් /ක්‍රීරම (ආදර්ශ) | සිටි කල පොල් (ආදර්ශ) | පොල් කිරි | පොල් නොවන ආදර්ශ | දිසිඳි පොල් ආදර්ශ ඇෆ්ලටොක්සින් හා සල්ෆර් | Row coconut flaks | King coconut water | පොල්කුර | Fresh Coconut | Imported Coconut Kernel | Coconut shell charcoal |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 | 122 | 5 | 161 | 4 | 81 | -- | 11 | -- | -- | 05 | 710 | - | - | - | - | - | - |
| 2015 | 35 | 10 | 158 | 3 | 105 | 01 | 11 | 01 | -- | 01 | 214 | - | - | - | - | - | - |
| 2016 | 58 | 2 | 191 | 1 | 112 | -- | 4 | -- | -- | -- | 374 | - | - | - | - | - | - |
| 2017 | 42 | - | 332 | - | 121 | - | 07 | - | -- | - | 366 | - | - | - | - | - | - |
| 2018 | 13 | - | 344 | - | 141 | - | 01 | -- | -- | 07 | 417 | 02 | - | - | - | - | - |
| 2019 | 18 | 1 | 213 | 1 | 66 | -- | 5 | -- | 2 | 15 | 667 | -- | - | - | - | - | - |
| 2020 | 08 | 3 | 335 | -- | 51 | -- | 03 | 02 | 03 | 04 | 453 | -- | 05 | - | - | - | - |
| 2021 | 11 | 14 | 411 | -- | 22 | -- | 03 | -- | -- | 01 | 300 | -- | 06 | 04 | 01 | 03 | 02 |

වගුව 16 - වාර්ෂික පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂන

## Q3.A) ISO තත්ත්ව සහතිකය ලබා ගැනීමේ කාර්යයන්

පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය මඟින් නිකුත් කරනු ලබන පරීක්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරීක්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමාණුකූලව සිදුකිරීම සඳහා, ISO 17025 ප්‍රතීතන තත්ත්වයට අදාළ කාර්යයන් අංශයෙහි පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව වාර්ෂිකව උපකරණ ක්‍රමාංකනය කිරීම, ජාත්‍යන්තර හා දේශීයව Inter laboratory සහ Intra laboratory වෘත්තිමය කුසලතා ඇගයීමේ පරීක්ෂණ සඳහා පෙනී සිටීම සිදුකර ඇති අතර ප්‍රතිඵල සතුටුදායක මට්ටමේ පවති.

2012 වසරේදී ආරම්භ කරනු ලැබූ ISO 17025 ප්‍රතීතන තත්ත්වය ලබා ගැනීමේ වැඩ සටහන ක්‍රම ක්‍රමයෙන් පුළුල් කර ඇති අතර 2021 වසර වනවිට පහත දක්වා ඇති පරීක්ෂණ සඳහා ප්‍රතීතන තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර ඇත.

පොල් තෙල් හි ක්ෂුද්‍රජීවී පරීක්ෂා සඳහා

1. දිලීර හා පුස්
2. සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව

පොල් තෙල් හි රසායනික පරීක්ෂා සඳහා

1. සැපොනිකරන අගය
2. අයඩින් අගය
3. නිදහස් මේද අම්ල ප්‍රමාණය

දිසිදි පොල්, මේදය තරමක් ඉවත් කල දිසිදි, පොල් කිරි, පිටිකල පොල් කිරි, පොල් කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් ක්‍රීම් හා පොල් තලප, පොල් වතුර, කොහු බත් උපස්ථර, කොප්පරා සහ ගෙඩි පොල් හි ක්ෂුද්‍රජීවී පරීක්ෂණ සඳහා

1. සැල්මොනෙල්ලා
2. කොලිෆෝම් සංඛ්‍යාව
3. ඊ-කොලයි සංඛ්‍යාව
4. දිලීර හා පුස්
5. සම්පූර්ණ සනාවාස සංඛ්‍යාව

පානීය ජලයෙහි ක්ෂුද්‍රජීවී පරීක්ෂා සඳහා

1. කොලිෆෝම් සංඛ්‍යාව
2. ඊ-කොලයි සංඛ්‍යාව

පානීය ජලය හා නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ජලයෙහි රසායනික පරීක්ෂා සඳහා

1. ක්ලෝරයිඩ්
2. ජලයේ මුළු කඨිනත්වය
3. කැල්සියම්
4. මැග්නිසියම්

මේ වන විට සමස්ථ වශයෙන් පොල් නිෂ්පාදන 12ක පරීක්ෂණ වර්ග 19ක් සඳහා ISO 17025 ප්‍රතීතන තත්ත්වය හිමිකර ගෙන ඇත.



SLAB

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Chemical and Microbiology Laboratory
Quality Control and Quality Assurance Division
Coconut Development Authority

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2017, has been accredited as a testing laboratory under the field of

Chemical and Biological Testing

and has been assigned the accreditation number

TL 030 - 01

This certificate is issued on 30 June 2020 and is valid until

29 June 2023

The accreditation was granted for the first time for Chemical laboratory on 2012-06-12 and Microbiology laboratory on 2015-10-15

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate

Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka



SLAB

Valid from 30 June 2020
to 29 June 2023
Issued on: 30 June 2020

As an accredited laboratory, this laboratory is entitled to use the following accreditation symbol.

SLAB ACCREDITED

ISO/ IEC 17025
TL 030-01

Schedule of Accreditation

Accreditation Scheme for Testing Laboratories
Sri Lanka Accreditation Board for Conformity Assessment
Accreditation Number: TL 030-01

Chemical & Microbiology Laboratory
Quality Control and Quality Assurance Division
Coconut Development Authority
No. 54, Nawala Road
Colombo 05

Scope of Accreditation: Performing Chemical and Biological testing on Food and Agricultural Products and Potable water as per SLS and ISO methods.

The laboratory is accredited for the following tests.

| Sl No. | Product(s) / Material of test | Specific tests performed | Test method / Standard against which tests are performed | Range of testing / Limits of detection |
|---|---|---|---|---|
| Biological Testing | | | | |
| 1.1 | Food and Agricultural Products (Coconut Oil) | Enumeration of Yeast and Moulds | SLS 516 Part 02 section 02:2013 ISO 21527:2008 | 10 - $10^5$ |
| 1.2 | | Enumeration of microorganisms colony count technique at 30°c (Aerobic plate count) | SLS 516 Part 03 section 01:2013 ISO 4833:2013 | 10 - $10^5$ |
| 2.1 | Food and Agricultural Products (Desiccated coconut, Coconut milk, Coconut milk powder, Coconut water, Coir fiber pith substrate, Copra, Partially defatted desiccated coconut, Fresh coconut kernel) | Detection of Salmonella sp. | SLS 516 Part 05:2013 ISO 6579:2002 | Present/Absent |
| 2.2 | | Detection and enumeration of Coliforms | SLS 516 Part 03 section 01:2013 ISO 4831:2006 | MPN 3 - 1100 |
| 2.3 | | Detection and enumeration of Escherichia Coli | SLS 516 Part 12:2013 ISO 7251:2005 | MPN 3 - 1100 |
| 2.4 | | Enumeration of microorganisms colony count technique at 30°c (Aerobic plate count) | SLS 516 Part 03 section 01:2013 ISO 4833:2013 | 10 - $10^5$ |
| 3.5 | | Enumeration of Yeast and Moulds | SLS 516 Part 02 section 02:2013 ISO 21527:2008 | 10 - $10^5$ |
| 3.1 | Potable Water | Detection and enumeration of E. coli & Coliform Bacteria | SLS 1461: Part 1: Section 3: 2013 | MPN 0 - 1800 |

Page 03 of 06

| SI No. | Product(s) / Material of test | Specific tests performed | Test method / Standard against which tests are performed | Range of testing / Limits of detection |
|---|---|---|---|---|
| 4.1 | Food and Agricultural Products (Aqueous coconut products - Milk Cream & Paste) | Enumeration of Yeast and Moulds | SLS 516 Part 02 section 02:2013 ISO 21527:2008 | 10 -$10^5$ |
| 4.2 | | Detection of *Salmonella sp.* | SLS 516 Part 05:2013 ISO 6579:2002 | Present/Absent |
| 4.3 | | Detection and enumeration of Coliforms | SLS 516 Part 03 section 01:2013 ISO 4831:2006 | MPN 3 -1100 |
| 4.4 | | Detection and enumeration of *Escherichia Coli* | SLS 516 Part 12:2013 ISO 7251:2005 | MPN 3 -1100 |
| **Chemical Testing** | | | | |
| 1.1 | Food and Agricultural Products (Vegetable Oil) | Determination of saponification value | SLS 313: Part 2, Section 1: 2014 ISO 3657: 2013 | 150 – 300 |
| 1.2 | | Determination of Iodine value | SLS 313: Part 2, Section 2: 2014 ISO 3961: 2013 | 5 - 200 |
| 2.1 | | Determination of Free Fatty Acid (Acidity) | SLS 313: Part 2, Section 1: 2009 ISO 660: 2009 | 0.1 – 20.0 |
| 2.2 | Potable Water /Drinking water/ Processing water | Chloride as Cl | APHA 4500 – Cl – B | 1 – 400 (mg/L) |
| 2.3 | | Total hardness as $CaCO_3$ | APHA 2340 C | >1 mg/L |
| 2.4 | | Calcium (as Ca) | APHA 3500 Ca. A | 0.8-200 mg/L |
| 3.1 | | Magnesium | APHA 3500 Mg B | 0.5-50 mg/L |

**රූපය 23 -SLAB සහතිකපත**

**B)** පුහුණු වැඩ සටහන් පැවැත්වීම

තත්ත්ව පාලන අංශයේ ආරම්භ කර ඇති ISO ප්‍රතීතන තත්ත්වයේ කටයුතු සඳහා සහ කාලීනව සංශෝධනය කර ඇති පොල් නිෂ්පාදන පරීක්ෂා කිරීමේ ක්‍රමවේද සඳහා අවශ්‍ය වන පුහුණුව රසායනාගාර සේවක පිරිස වෙනුවෙන් ලබාදී ඇති අතර වෙනත් බාහිර රසායනාගාරයන්හි සේවක පිරිස වෙනුවෙන් තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් පුහුණු වැඩසටහන් පවත්වා ඇත. වාර්ෂික සැලැස්මට අනුව පහත පරිදි ප්‍රගතිය ලබා ඇත.

| | පුහුණු වැඩසටහන | **පුහුණුව පැවැත්වූ ආයතනය** | සහභාගිවූ සාමාජිකයන් ගණන |
|---|---|---|---|
| 1 | ISO 17025:2017 ප්‍රතීතන තත්ත්වයට අදාළ අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණුව -2021-03-25 -28 | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | 02 |
| 2 | Diploma in Food Quality management – 2021-08-08 | Sri Lanka standards Institution | 03 |
| 3 | Workshop on analytical method validation and verification – 2021-03-26 | Association of testing laboratory | 01 |
| 4 | Webinar on Emerging problem in processing coconut oil – 2021-05-13, 18 | Institute of Food science & Technology | 05 |
| 5 | Webinar on Emerging problem in processing Copra & VCO – 2021-06-30, 07/02 | Institute of Food science & Technology | 06 |
| 6 | AAS application | ITI | 10 |
| 7 | Training programme on Microbiological analysis – Online 2021/07/28-29 | Sri Lanka Association of Testing laboratories | 02 |
| 8 | Advance HACCP Programe 2021/09/22 - 24 | Food safety & Quality Solutions | 07 |
| 9 | Training on HPLC (Instrumental & Testing procedures for PAH and sugars) 2021/10/14-22 | Analytical Instruments | 07 |

**වගුව 17 - පුහුණු වැඩසටහන් පැවැත්වීම**

**බාහිර පිරිස පුහුණු කරවීම**

පොල් නිෂ්පාදන කර්මාන්තයේ සහ අධිකාරියේ නව පරීක්ෂකවරුන් සඳහා රසායනාගාර සේවය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

| | ආයතනය | සහභාගි වූ ගණන |
|---|---|---|
| 1 | අධිකාරියට බඳවාගත් නවක පරීක්ෂකවරුන් සඳහා රසායනාගාර පිළිබඳ පුහුණුව ලබාදීම | 11 |
| 2 | පොල් පර්යේෂණ ආයතනයේ විශ්ලේෂකයින් පුහුණු කිරීම -පොල් තෙල්හි සැපොනිකරණ අගය පිළිබඳ පුහුණුව | 02 |

වගුව 18 - **බාහිර පිරිස පුහුණු කරවීම**

**C) පොල් කර්මාන්තය සඳහා රෙගුලාසි සකස් කිරීම**

සමස්ථ පොල් නිෂ්පාදන කර්මාන්තය සඳහා දළ රෙගුලාසි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට කටයුතු කර ඇත.

## Q4 අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්වය සුරක්ෂිත කිරීම

දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී හා භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම, කර්මාන්තශාලා පරීක්ෂා කිරීම සහ උපදේශක දායකත්වය සැපයීම. මේ යටතේ සිදුකරනු ලබන කාර්යයන් වේ.

2021 වර්ෂය තුල ක්ෂේත්‍ර පරීක්ෂා 399ක් පැවැත්වීමට හැකියාව ලැබී ඇත. නිෂ්පාදනකරුවන්ගේ ඉල්ලීම මත පරීක්ෂා කිරීම් වැඩිවී ඇති හෙයින් 2021 වසරේ ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 200% කි.

දිසිදි පොල් නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී පරීක්ෂා සිදුකිරීම 2020 වර්ෂය සඳහා ආදර්ශ 67ක් වන අතර 2021 වර්ෂය සඳහා ආදර්ශ 214කි. මෙම ආදර්ශ 214 හි සිදුකර ඇති සම්පූර්ණ පරීක්ෂණ සංඛ්‍යාව 642 කි. 2021 වසරේදී ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 119% ක් වන අතර 2020 වසරට සාපේක්ෂව ප්‍රගතිය 219% කි.

තවද දිසිදි පොල් නිෂ්පාදනයේදී භාවිතා කරනු ලබන ජලය නිසි ප්‍රමිතියෙහි පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා එම ජලයේ ක්ෂුද්‍රජීවී හා රසායනික විශ්ලේෂණය සිදුකරනු ලැබේ. මේ සඳහා ආදර්ශ 140ක් පරීක්ෂා කර ඇත.2021 වසරේ වාර්ෂික ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 140%කි.

## Q5 සැකසුම් සංවර්ධන අංශයේ ක්‍රියාකාරිත්වයට අදාළව පොල් නිෂ්පාදන විශ්ලේෂණය

සැකසුම් සංවර්ධන අංශයේ නියාමන අවශ්‍යතාව පරිදි නැවුම් පොල් තෙල් , පොල් තෙල් සහ කොහු බත් හා කොහු කෙඳි ආදර්ශ පරීක්ෂා කර ඇත. නැවුම් පොල් තෙල් ආදර්ශ 57ක් පරීක්ෂා කර ඇති අතර ප්‍රගතිය 104%කි. පොල් තෙල් ආදර්ශය 173ක් පරීක්ෂා කර ඇති අතර ප්‍රගතිය 157%කි. ඒ අනුව පොල් තෙල් ආදර්ශ 173 හි නිදහස් මේද අම්ල ප්‍රමාණය ප්‍රමිතිය හා එකඟ නොවීම මත 10% ක් ද, අයඩින් අගය එකඟ නොවීම මත 14% ක්ද ඇෆ්ලටොක්සින් ප්‍රමාණය ප්‍රමිතිය හා එකඟ නොවීම මත 14%ක්ද වශයෙන් ආදර්ශ අසමත්ව ඇත.

කොහු බත් උපස්ථර ආදර්ශ 187 පරීක්ෂා කර ඇති අතර ආදර්ශ පරීක්ෂාවේ ප්‍රගතිය 72%කි. කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීම සිදුකර ඇති අතර ආදර්ශ 134 පරීක්ෂා කර ප්‍රගතිය 67%ක් අත්කර ගෙන ඇත.

පොල් කිරි සහ පිටිකල පොල් ආදර්ශ 150ක් පරීක්ෂා කර ඇති අතර ප්‍රගතිය 107%කි. පොල් කටු අඟුරු ආදර්ශ 13ක් පරීක්ෂා කර ඇති අතර ප්‍රගතිය 50%කි. මද වශයෙන් මේදය ඉවත් කල ආදර්ශ 99ක් පරීක්ෂා කර ඇති අතර ප්‍රගතිය 50%කි.

**වෙනත් බාහිර ක්‍රියාකාරම්**

1) විෂගතවීම සිදුවීමේදී කර්මාන්තශාලාවන්හි swab පරීක්ෂණ සිදුකිරීම

| | කාර්යය | පරීක්ෂා කිරීමේ ප්‍රගතිය (ආදර්ශ) | ප්‍රමිතියෙන් අපගමනය වීම % |
|---|---|---|---|
| 1 | දංකොටුව මෝල පරීක්ෂා සිදුකිරීම | 8 | Yeast &Mould count -7% |
| 2 | N.M.K.කොකො ලෑන්ඩ් - M-102 | 13 | Salmonella - 20% |
| 3 | නාත්තන්ඩිය මෝල - M-114 | 15 | |
| 4 | වයඹ දිසිදි හා පොල් තෙල් මෝල -M-151 | 16 | Salmonella - 6% |

වගුව 19 - විෂ ගතවීම සිදුවීමේදී කර්මාන්තශාලාවෙහි SWAB පරීක්ෂණ සිදුකිරීම

2) දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ක්ෂේත්‍ර රාජකාරි සඳහා සහභාගිවීම

| | සිදුකල කාර්යය | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|---|
| 1 | සක්‍රීය කාබන් පොල් කටු අඟුරු නිෂ්පාදනයට යොමුවීමට / බලාපොරොත්තු වන ව්‍යවසායකයන් දැනුවත් කිරීම | මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 01 |
| 2 | තාක්ෂණික හුවමාරු වැඩ සටහන (කොහු බත් උපස්ථර - coir dust blocks and discs) කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවූ ඉහත වැඩ සටහන සඳහා තත්ත්ව පාලන අංශයෙන් සම්පත් දායකයෙකු ලෙස සහභාගි වී ඇත. | වාද්දුව 01 |
| 3 | තාක්ෂණික හුවමාරු වැඩ සටහන (පොල් තෙල් කර්මාන්තය) කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවූ ඉහත වැඩ සටහන සඳහා තත්ත්ව පාලන අංශයෙන් සම්පත් දායකයෙකු ලෙස සහභාගී වී ඇත. | 01 |
| 4 | තාක්ෂණික හුවමාරු වැඩ සටහන (නැවුම් පොල් තෙල් කර්මාන්තය) කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙහෙයවූ ඉහත වැඩ සටහන සඳහා තත්ත්ව පාලන අංශයෙන් සම්පත් දායකයෙකු ලෙස සහභාගී වී ඇත. | 01 |
| 5 | බ්‍රසීලයෙන් පැමිණි දූත පිරිස සමඟ නම් කරනු ලැබූ රසායනාගාරයන්හි විගණනයට හා අධීක්ෂණයට සහභාගිවීම<br>• Ms. HJS Condiments (Pvt) Ltd., අධීක්ෂණය කිරීම සඳහා<br>• ITI රසායනාගාරයේ විගණන කටයුතු සඳහා<br>• Ms. Tropikal Life International (Pvt) අධීක්ෂණය කිරීම සඳහා<br>• SGS Lanka (Pvt) Ltd., රසායනාගාරයේ විගණන කටයුතු සඳහා<br>• පොල් වතු අධීක්ෂණය | 05 |

වගුව 20 - දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ක්ෂේත්‍ර රාජකාරී සඳහා සහභාගී වීම.

3) තත්ත්වයෙන් උසස් පොල්තෙල් සඳහා අනුමත කරනු ලබන තරු 5 ලාංඡනය ලබාදීමේ අධීක්ෂණ කටයුතු සඳහා සහභාගි වීම්

| | ස්ථාන | අධීක්ෂණය කල නිෂ්පාදනාගාර සංඛ්‍යාව |
|---|---|---|
| 1 | NMK Group පොල් තෙල් කර්මාන්තශාලාවේහි මූලික කර්මාන්තශාලා පරීක්ෂාව සඳහා සහභාගිවීම | 01 |
| 2 | RBD තෙල් සඳහා පවත්වනු ලැබූ රැස්වීම සඳහා සහභාගිවීම | 01 |
| 3 | පොල් තෙල් නිෂ්පාදන ආයතන පරීක්ෂා කිරීම<br>• ගම්පහ ප්‍රදේශයේ<br>• කුරුණෑගල / වාද්දුව/ කළුතර/ කෑගල්ල/ පුත්තලම/ ගම්පහ<br>• දකුණු පළාත<br>• කුලියාපිටිය / පන්නල<br>• කුරුණෑගල | <br>01<br>17<br>02<br>02<br>03 |
| 4 | Export related quality and safety problems related to VCO වැඩ සටහන | 01 |

වගුව 21 - තත්ත්වයෙන් උසස් පොල්තෙල් සඳහා අනුමත කරනු ලබන තරු 5 ලාංඡනය ලබාදීමේ අධී ක්ෂණ කටයුතු සඳහා සහභාගි වීම.

4) ප්‍රමිති සංශෝධන සහ නව ප්‍රමිති සකස් කිරීමේ සාකච්ඡා සඳහා සහභාගිවීම

| | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 1 | කැබලි කරන ලද වියලි පොල් මද සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය සඳහා කෙටුම්පත් සකස් කිරීම | ප්‍රමිතිය සකස් වෙමින් පවති |

වගුව 22 - ප්‍රමිති සංශෝධන සහ නව ප්‍රමිති සකස් කිරීමේ සාකච්ඡා සඳහා සහභාගිවීම

5) තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා තත්ත්ව පාලන අංශයේ නිලධාරීන් සහභාගිවීම

| | කාර්යය | සහභාගිවූ නිලධාරි |
|---|---|---|
| 1 | අධිකාරියේ සේවකයන් සඳහා සැත්කම් හා රෝහල් ගාස්තු රක්ෂණාවරණය ලබා ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව | එස්. එස්. පුරසිංහ මිය |
| 2 | 2021 වර්ෂය සඳහා ක්ෂුද්‍ර ජීවී මාධ්‍ය මිලදී ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | අශෝක පුෂ්පකුමාර මයා |
| 3 | 2021 වර්ෂය සඳහා රසායනාගාර උපකරණ මිලදී ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | සමදරා දිසානායක මිය |
| 4 | 2021වර්ෂය සඳහා වීදුරු භාණ්ඩ හා උපාංග සුළු මිලදී ගැනීම් සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව | සමදරා දිසානායක මිය |
| 5 | 2021 වර්ෂය සඳහා රසායණික ද්‍රව්‍ය මිලදී ගැනීම සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටුව | මධුරි විජේබණ්ඩාර මිය |
| 6 | 2021 වර්ෂය සඳහා තාක්ෂණික ද්‍රව්‍ය මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව | අශෝක පුෂ්පකුමාර මයා |

**වගුව 23** - තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා තත්ත්ව පාලන අංශයේ නිලධාරීන් සහභාගිවීම

6) විශ්ව විද්‍යාලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උපාධි සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු (Industrial Training ) අවස්ථාව සැපයීම

| | විශ්ව විද්‍යාලය | සහභාගිවූ ශිෂ්‍යයන් ගණන |
|---|---|---|
| 1 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - රසායනික විශ්ලේෂණ සඳහා | 01 |
| 2 | කැළණිය විශ්ව විද්‍යාලය - ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ සඳහා | 02 |
| 3 | වයඹ විශ්ව විද්‍යාලය - විශ්ලේෂණය සඳහා | 02 |
| | සම්පූර්ණ අවස්ථා ගණන | 05 |

**වගුව 24** - විශ්ව විද්‍යාලයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා උපාධි සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාර්මික පුහුණු (Industrial Training ) අවස්ථාව සැපයීම

**තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම ඉපැයීම**

| **කාර්යය** | **2020** | **2021** |
|---|---|---|
| පරීක්ෂා කර ඇති ආදර්ශ ප්‍රමාණය | 14,734 | 19,913 |
| සිදුකර ඇති පරීක්ෂණ ගණන | 59,793 | 79,017 |
| ආදායම් ඉපයීම (රු. මිලියන) | 17.53 | 25.95 |

**වගුව 25 - තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම ඉපැයීම**

# 03. අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කාර්යභාරයක් ඉටුකරන අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය කොවිඩ් වසංගත තත්ත්වයක් තුලදීත් 2021 වසරේදීද සිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සකසන ලද සැලසුම් සාක්ෂාත් කරගැනීමට දායකත්වයක් සපයන ලදී. එම ඉටුකරන ලද කාර්යභාරය හේතුකොට ගෙන 2021 වසර අවසන් වන විට සමස්ථ ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසර ආරම්භයේ සිදු කරන ලද පුරෝකථනයන් අභිබවා වැඩි අගයක් ලභා කර ගන්නා ලදී. එය මෙතෙක් වාර්තාගත වැඩිම අපනයන ආදායම ලෙස රු .බිලියන 166 හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 834 දක්වා වර්ධනය වූ අතර පොල් ආශ්‍රිත අපනයන ක්ෂේත්‍රය සැළකීමේදි එය සුවිශේෂී ජයග්‍රහණයකි. මෙහි දී අපගේ සේවාදායකයන් ඇතුළු පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන්ගේ අභිවෘද්ධිය සඳහා ඉවහල් වන වෙළඳපළ තොරතුරු සහ දත්ත සැපයීම,විදේශීය ගැණුම්කරුවන් සම්බන්ධ කර දීම, අලෙවිකරුවන් සොයා ගැනීම සඳහා අදාළ සේවාවන් සැපයීම, ඇසුරුම්කරණය පිළිබඳව ප්‍රවණතා හඳුන්වාදීම, නව වෙළඳපළ නැඹුරුතාවයන් පිළිබඳ තොරතුරු සැපයීම, සහ අනෙකුත් අලෙවිකරණ සේවාවන් කාර්යක්ෂමවත් , ඵලදායි ලෙසත් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් 2021 වර්ෂයේ දීද ඉටු කරන ලදී.

**2021 වර්ෂය තුළ ක්‍රියාත්මක සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.**

- පොල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා නව ජාත්‍යන්තර වෙළඳපළ සහ ගැණුම්කරුවන් හඳුනාගැනීම මඟින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමේ අරමුණින් ජපානයේ සංවිධානය කර තිබූ HEALTH INGREDIENTS ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් සංවිධානය කිරීම.

- පොල් කර්මාන්ත ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම සහ පහසුකම් සැලසීම - අපනයනකරුවන්, වෙළඳුන්, පොල් වතු හා අතරමැදියන් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ට උපදේශන සේවාවන් ලබාදීම.
- උසස් ප්‍රමිතියකින් යුතු පොල් සහ තැඹිලි ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස අපනයනය කිරීම සඳහා අදාළ අවසරපත් නිකුත් කිරීම සහ ක්ෂේත්‍රයට පිවිසීමට අපේක්ෂා කරන අපනයන ප්‍රමුඛ ව්‍යවසායකයින් සඳහා තාවකාලික අපනයන අවසරපත් නිකුත් කිරීම
- ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු හා සම්බන්ධ වී සියලුම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අනුමැතීන් ලබාදීම.
- පොල් ආශ්‍රිත අපනයන හා ආනයන කටයුතු අධීක්ෂණ කිරීම

- වෙළඳ ආරවුල් නිරාකරණය කිරීමට සහය වීම.
- ගෙඩි පොල් වෙන්දේසි පැවැත්වීම.
- පොල් හා පොල් ආශ්‍රිත වෙළඳපළ මිල ගණන් මුද්‍රිත මාධ්‍ය වෙත දිනපතා ලබාදීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන, අපනයන/ආනයන ප්‍රමාණ, වෙන්දේසි මිල ගණන්, ලෝක වෙළඳපලේ පොල් ආශ්‍රිත මිල ගණන් ඇතුළත් සති වාර්තා, මාසික වාර්තා සහ 2020 වසර සඳහා ශ්‍රී ලංකා පොල් සංඛ්‍යාත වාර්තාව නිකුත් කිරීම.
- දේශීය අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා සහභාගී වීමෙන් පොල් ආශ්‍රිත කර්මාන්ත හා ඒවායේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
- වැවිලි අමාත්‍යාංශය, පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, පාරිභෝගික සේවා අධිකාරිය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ වෙළඳ ගිවිසුම් හා බැඳි සාකච්ඡා වටයන්ට සහභාගි වීම හා අවශ්‍ය තොරතුරු ලබා දීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් සඳහා විදේශීය වෙළඳ විමසුම් ලබාදීම.
- ගෙඩි පොල් සඳහා ආදේශකයක් වන පොල් කිරි හා පොල් කිරි පිටි භාවිතය පිළිබඳව සහ පොල් කටු සහ පොල් ලෙලි අපතේ යාම අවම කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පුවත් පත් දැන්වීම් පළකිරීම, දැන්වීම් පුවරු සැකසීම, ගුවන් විදුලි පණිවුඩ සහ මුද්‍රිත / විද්‍යුත් මාධ්‍යයන්හි වැඩ සටහන් පැවැත්වීම.
- දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයන් හඳුනාගැනීම සඳහා අලෙවි සමීක්ෂණ පැවැත්වීම.

## 2021 වසර තුළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා සේවාවන් සහ ඉන් ලබා ගත් ප්‍රගතිය පහත දැක්වේ.

### 3.1 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම

සෑම වසරකම පොල් සංවර්ධන අධිකාරිය විසින් තෝරා ගත් ජාත්‍යන්තරව පිළිගත් විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් කීපයකට අපනයනකරුවන් සහභාගී කරවීම තුළින් අගය එකතු කරන ලද පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩි විදේශ විනිමයක් ලබාගැනීමට හැකියාව ලැබී ඇත. මෙසේ ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් වලට සහභාගී වීමෙන් විදේශ ඇණවුම් වැඩි වශයෙන් ලබාගැනීමටත්, පවතින වෙළඳපළ ආරක්ෂා කර ගැනීමටත්, නව ගැණුම්කරුවන් හඳුනා ගැනීමටත්, විදේශීය රටවල භාවිතා කරන හා ඉදිරි වෙළඳපළ අත්පත් කර ගන්නා තරඟකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා

ගැනීමටත්, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ජාත්‍යන්තර ප්‍රජාව බලාපොරොත්තු වන මට්ටමේ නිෂ්පාදන සහ ඒවායේ ප්‍රමිතිය මෙන්ම ගුණාත්මකභාවය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් හැකියාව ලැබේ. එමඟින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇති අතර ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබේ.







**රූපය 24-විදේශ ප්‍රදර්ශන**

පොල් නිෂ්පාදන මිලදී ගැනීම සඳහා නව ජාත්‍යන්තර වෙළඳපළ සහ ගැණුම්කරුවන් හඳුනාගැනීම මඟින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමේ අරමුණින් ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් 2021 වසරේ සැලසුම් කර තිබුණද පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එම වැඩසටහන් වලට සහභාගී වීමට නොහැකි විය. නමුත් ජපානයේ සංවිධානය කර තිබූ HEALTH INGREDIENTS ජාත්‍යන්තර ප්‍රදර්ශනය සඳහා ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගයෙන් ශ්‍රී ලාංකීය සන්නාමය ඇති පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන් වන දිසිඳි පොල්, පොල් තෙල්, නැවුම් පොල් තෙල්, එම්.සි.ටී තෙල්, පොල් කිරි, පොල් කිරි පිටි, පොල් ක්‍රීම්, පොල් විනාකිරි, ඇමිනෝ, පොල් පිටි, පොල් වතුර, තැඹිලි වතුර, පොල් බටර්, පොල් සීනි සහ පොල් පැණි ප්‍රදර්ශනය කිරීමට හැකි විය. එයින් ලැබුණු අලෙවි විමසුම් 60ක් අපනයන ආයතන වෙත බෙදා දෙන ලදී.

## 3.2 පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියලු පාර්ශවයන් හා පොල් වතු ලියාපදිංචිය

2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම ඉහල ගොස් ඇති අතර අපනයන ක්ෂේත්‍රයෙහි නියැලෙන අපනයනකරුවන්ගේ ලියාපදිංචිය 9%කින් ඉහළ යාමක් පෙන්නුම් කර ඇත.

**ලියාපදිංචි කටයුතු - 2020/2021**

| ලියාපදිංචි කිරීම් | 2020 | 2021 |
|---|---|---|
| අපනයනකරුවන් | 643 | 704 |
| බ්‍රෝකර්වරුන් | 20 | 17 |
| වෙළඳුන් | 74 | 31 |
| පොල් වතු | 246 | 99 |

වගුව 26 - ලියාපදිංචි කටයුතු - 2020/2021

## 3.3 පොල් වෙන්දේසි පැවැත්වීම

### 3.3.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

1994 වසරේ සිට පුරා වසර 27ක් පොල් වගාකරුවා හා ගැණුම්කරුවා යන දෙපාර්ශවයටම අවාසියක් නොවන ආකාරයට මෙහෙයවනු ලැබූ ගෙඩි පොල් වෙන්දේසිය 2021 වසරේදී මැයි මස සිට පවත්වන ලදී. පොල් මිල සඳහා ස්ථාවර මිලක් රජය විසින් යෝජනා කර තිබූ බැවින් 2021 වසරේ මැයි මස වන තෙක් පොල් වෙන්දේසිය නොපවත්වන ලදී. 2021 වසරේදී කොළඹ පොල් වෙන්දේසි 33ක් පැවැත්වීමට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයට හැකි විය. කොවිඩ් වසංගත තත්ත්වය තුළද ZOOM තාක්ෂණය උපයෝගී කර ගනිමින් පොල් වෙන්දේසිය පවත්වන ලදී.

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2020 | 34,886,660 | 25,464,460 | 48,891.47 |
| 2021 | 34,784,736 | 23,530,226 | 56,512.88 |

වගුව 27 - කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ පොල් ඵලදාවේ 12% ක පමණ වැඩිවීමක් තිබුණු අතර පැවැත්වූ වෙන්දේසි සංඛ්‍යාව අඩු බැවින් වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ පොල් ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබුණි.

පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පෙර වසර වලදී මෙන් කොප්පරා වෙන්දේසිය සහ ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය පැවැත්වීමට නොහැකි විය.

### 3.3.2 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

පොල් වෙන්දේසිය ක්‍රියාත්මක කිරීමේදී අලෙවිකරුවන් හා ගැණුම්කරුවන් අතර ඇති වන වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා මැදිහත්කරු ලෙස අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2021 වසරේදීද සුවිශේෂී කාර්යයභාරයක් ඉටු කරන ලදී. තවද, පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේදී ඇති වූ වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සිය දායකත්වය ප්‍රතිඵලදායක ලෙස ලබා දෙන ලදී.

## 3.4 දේශීය අලෙවි ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම

කොවිඩ් උවදුරු තත්ත්වය මත 2021 වසර පුරා පැවති සමාජ දුරස්ථකරන සීමා හේතුවෙන් වෙනත් වර්ෂයන්හී මෙන් දේශීය වෙළඳ, කෘෂිකර්ම හා අධ්‍යාපන ප්‍රදර්ශන බොහොමයක් රට තුළ සංවිධානය නොවූ අතර තත්ත්වයෙන් උසස් පොල් ආශ්‍රිත නිෂ්පාදිත මහජනතාවට හඳුන්වාදීමේ අරමුණින් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය වෙළඳ ප්‍රදර්ශන සහ සල්පිල් 3 කට පමණක් සහභාගී වන ලදී.

| ප්‍රදර්ශනයේ නම | ස්ථානය | සංවිධානය |
|---|---|---|
| නව අවුරුදු පොළ - 2021 අප්‍රේල් | ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රය | සුභසාධක සමිතිය - ආරක්ෂක අමාත්‍යාංශය |
| දොරින් දොරට කජ්රුක ආරම්භක වැඩ සටහන | වැලිකැටිය වත්ත - දංකොටුව | පොල් වගාකිරීමේ මණ්ඩලය |
| නත්තල් වෙළඳ සල්පිල - වෙන්නප්පුව | වෙන්නප්පුව ප්‍රාදේශීය සභා භූමිය | පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය |


**වගුව 28 - දේශීය අලෙවි ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම**

කෙසේ නමුත් 2021 වසර තුළ ජනතාව ඒකරාශී නොවන ආකාරයෙන් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය, දැන්වීම් පුවරු, ඩිජිටල් දැන්වීම් පුවරු භාවිතා කරමින් පොල් නාස්තිය අවම කිරීමේ වැදගත්කම, පොල් කටු හා පොල් ලෙලි නාස්තිය අවම කිරීම, පොල් නිෂ්පාදන වල ඇති වැදගත්කම, පොල් ආශ්‍රිත නිෂ්පාදන වලින් විදේශ විනිමය උපයා ගන්නා ආකාරය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.මේ යටතේ පහත ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී.

i. පොල් නාස්තිය අවම කිරීමේ අරමුණින් පොල් කිරි නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය, පොල් කටු හා පොල් ලෙලි එකතු කිරීම ප්‍රවර්ධනය,පොල් නිෂ්පාදන වල ඇති වැදගත්කම, පොල් ආශ්‍රිත නිෂ්පාදන වලින් විදේශ විනිමය උපයා ගන්නා ආකාරය, පොල් සංවර්ධන අධිකාරියේ සහතිකලත් පොල්තෙල් ප්‍රවර්ධනය සහ කොහු බත් වලට වැලි කලවම් කිරීමේ නීති විරෝධීභාවය සම්බන්ධයෙන් ජනතාව සහ කර්මාන්තකරුවන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නාලිකා 12 ක් හරහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ගුවන් විදුලි දැන්වීම් 5ක් 2021 වසර තුල 1,950 වාරයක් ප්‍රචාරණය කරන ලදී. මීට අමතරව එම ගුවන් විදුලි නාලිකාවන්ගේ උදැසන 7 ට විකාශය වන දස දෙසින් 7 වැඩසටහන තුළදී දිනපතා ඉහත පණිවිඩ ප්‍රවීණ මාධ්‍යවේදීන් විසින් ජනතාවට සන්නිවේදනය කිරීමද සිදු කරන ලදී.

ii. ඉහත සඳහන් ප්‍රචාරණ සහ දැනුවත් කිරීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සිංහල සහ දෙමළ භාෂා පුවත්පත් වල සම්පූර්ණ පිටුවක් ආවරණය වන පරිදි පුවත්පත් ලිපි සහ දැන්වීම් 18 ක් පළ කරන ලදී.

iii. රටපුරා විසිරී සිටින පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගේ නිරත විවිධ පාර්ශවකරුවන් සහ අනාගතයේ පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගේ නිරතවීමට අදහස් කරන පුද්ගලයන්ට පහසුවෙන් අධිකාරිය හා සම්බන්ධවීම සඳහා ක්ෂණික දුරකථන ඇමතුම් අංකයක් )Hotline Number) හඳුන්වා දෙමින් රට පුරා පිහිටි සියලුම ග්‍රාම නිලධාරී කාර්යාල සහ වෙනත් තෝරාගත් රාජ්‍ය ආයතනයන්හී සිංහල සහ දෙමළ භාෂා ද්විත්වයෙන් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම.



රූපය 25 - දැන්වීමක්

iv. ඉහත දුරකථන අංකය හඳුන්වාදීම සඳහා අධිකාරියේ නාරාහේන්පිට කාර්යාලය අසල සහ රූපවාහිනී සංස්ථාව අසල දැන්වීම් පුවරුවක් ස්ථාපිත කිරීම.

v. අධිකාරියේ සහ කර්මාන්තයට අදාළ විවිධ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා නාරාහේන්පිට කාර්යාලය ඉදිරිපිට LED ඩිජිටල් තිරයක් ස්ථාපිත කිරීම.


vi. ඉදිරියේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වන රූපවාහිනී වැඩසටහන්, වාර්තාමය වැඩසටහන් 2021 වසරේදී සකස් කරන ලදී.


රූපය 26-LED තිරය

vii. සමාජ මාධ්‍ය හරහා පොල් කර්මාන්තයේ ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වැදගත්කම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ඇති වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කරන ලදී.

ඉහත ප්‍රවර්ධන කටයුතු වලට අමතරව 2021ජාත්‍යන්තර පොල් දිනය නිමිති කොටගෙන පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- පොල් මද ආශ්‍රිත අපනයනකරුවන් සඳහා තත්ත්වයෙන් සහ ගුණාත්මකභවෙන් උසස් පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ලෝක වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම හා ලෝක වෙළෙඳපොළේ ඒ සඳහා පවතින ඉල්ලුම පිලිබඳ zoom තාක්ෂණය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩ සටහනක් සිදු කරන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශයේ හිටපු අංශ ප්‍රධානී සම්මානිත මහාචාර්ය උපාලි සමරජීව මහතා විසින් ලබාදුන් අතර අපනයනකරුවන් සියයකට ආසන්න පිරිසක් සහභාගී විය.




- පොල් කර්මාන්තයේ ප්‍රගතිය, ඉදිරි දැක්ම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවත්පත් වෙළඳ දැන්වීම් සහ රාජ්‍ය අමාත්‍යාතුමා, සභාපතිතුමා සහ අධිකාරියේ නිලධාරීන් සහභාගී වූ රූපවාහිනී සහ ගුවන් විදුලි සම්මුඛ සාකච්ඡා පොල් දිනයේදී සහ එම සතිය තුළ සිදු කරන ලදී.




රූපය 27-ලෝක පොල් දිනය

## 3.5 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව මඟින් 2021 වසරේදීද පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ට මෙන්ම අපනයනකරුවන්ට සිය සේවාදායකත්වය උපරිම වශයෙන් ලබාදෙන ලදී. එමඟින්, නිෂ්පාදන සඳහා මිල ගණන් තීරණය කිරීමේදී අදාළ නිවැරදි වෙළඳපළ තොරතුරු හා දත්ත ලබා ගෙන නිවැරදි විශ්ලේෂණයක් තුළින් සිය කර්මාන්ත හා බැඳි වෙළඳ රටාව තීරණය කිරීම සඳහාත්,කර්මාන්තකරුවන්ගේ තීරණ ගැනීමේ හැකියාව පහසු කරලීම සඳහාත් පහත දක්වා ඇති ක්‍රියාවලීන් ඉටුකරන ලදී;


- පොල් ආශ්‍රිත විවිධාංගීකරණය කරන ලද කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නිෂ්පාදන තොරතුරු, අපනයන සහ ආනයන තොරතුරු, දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු හා දත්ත අවශ්‍ය පාර්ශව වෙත අවශ්‍ය අවස්ථා වලදී ලබාදීම.

- දෛනිකව ලබා ගන්නා ලද පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍ය දිනපතා මුද්‍රිත මාධ්‍යයන් මඟින් ප්‍රකාශයට පත් කිරීම.

- සතිපතා නිකුත් කරනු ලබන"Coco Market Focus" සති වාර්තා ප්‍රකාශන 48ක් 2021 වසරේදීද ප්‍රකාශයට පත් කරන ලද අතර එමඟින් පොල් වෙන්දේසි මිල ගණන්, දේශීය පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ගොවිපළ මිල ගණන්, තොග මිල ගණන් හා ජාත්‍යන්තර මිල ගණන් පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදී.


- ප්‍රකාශන 12 කින් සමන්විත "Coco Market Focus" මාසික සඟරාව 2021 වසර තුළදීද ප්‍රකාශයට පත් කරන ලදී.

  පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ හා අපනයන ක්ෂේත්‍රයේ නියැලි පාර්ශවකරුවන් සඳහා මෙම ප්‍රකාශය සිය වෙළඳ තීරණ ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය. සියලුම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ අපනයන ප්‍රමාණයන්, මිල ගණන්, අපනයනය කරන ලබනු රටවල් සහ ආනයනය කරනු ලබන බෘද්‍ය තෙල්, පොල් තෙල්, සක්‍රීය කාබන් ආදී නිෂ්පාදනයන්හී ආනයන ප්‍රමාණයන් හා මිල ගණන් මෙම ප්‍රකාශනයේ දක්වා ඇත.




රූපය 28- Coco Market Forcus සඟරාව

- දේශීයව සහ ජාත්‍යන්තරව ඉහළ ඉල්ලුමක් ඇති පොල් කර්මාන්තය හා අපනයන ක්ෂේත්‍රයේ දත්ත, තොරතුරු හා විස්තර ඇතුළත් පරිපූර්ණ වාර්ෂික ප්‍රකාශනයක් වූ Sri Lanka Coconut Statistics –2020 ප්‍රකාශනය අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් 2021 වසරේදී නිකුත් කරන ලදී.




රූපය 29-පොල් සංඛ්‍යාතික වාර්තාව

මෙම ප්‍රකාශනය පොල් හා ඒ ආශ්‍රිත සියලුම අපනයන හා ආනයන ආශ්‍රිත මිල ගණන්, අපනයනය කරනු ලබන රටවල්, දේශීය මිල ගණන්, ලාංකීය පොල් එලදාව, ජාත්‍යන්තර පොල් ප්‍රජාව නියෝජනය කරනු ලබන රටවල්හී පොල් එලදා දත්ත, නිෂ්පාදන හා අපනයන තොරතුරු, පොල් වෙන්දේසිය තොරතුරු වලින් සමන්විත වේ.

- වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳ තොරතුරු විධිමත්ව රැස්කිරීම, වගුගත කිරීම හා ප්‍රචාරය කිරීම.

- පොල් සහ ඒ ආශ්‍රිත කර්මාන්ත ආශ්‍රිතව ප්‍රතිපත්තීන් සැකසීමට දායක කර ගැනීම සඳහා පහත සඳහන් ආයතන වෙත අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2021වසරේදීද දත්ත ලබා දීම සිදු කරන ලදී.
    - ශ්‍රී ලංකා මහ බැංකුව
    - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
    - අපනයන සංවර්ධන මණ්ඩලය
    - විවිධ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන
    - එමෙන්ම, ජාත්‍යන්තර පොල් ප්‍රජාව, විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP, Indian Coconut Journal) ආදී විදේශීය ආයතන හා සම්බන්ධ වෙමින් ලබා ගන්නා තොරතුරු හා දත්ත නිරන්තරයෙන් ලාංකීය පොල් ප්‍රජාවට ලබා දීමෙන් විශේෂ කාර්යයභාරයක් 2021 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් ඉටු කරන ලදී.


## 3.6 පොල් කර්මාන්තයේ අපනයන ආදායම

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හී පසුගිය වසර 12ක අපනයන ආදායම (2010-2021) පහත දක්වා ඇත.

| වසර | වටිනාකම | |
|---|---|---|
| | (රු. මිලියන) | (ඇ. ඩො. මිලියන) |
| 2010 | 32,433 | 286.86 |
| 2011 | 47,306 | 427.85 |
| 2012 | 46,667 | 365.72 |
| 2013 | 47,952 | 371.40 |

| | | |
|---|---|---|
| 2014 | 72,880 | 558.21 |
| 2015 | 75,259 | 553.63 |
| 2016 | 84,702 | 581.74 |
| 2017 | 91,198 | 598.19 |
| 2018 | 94,722 | 583.81 |
| 2019 | 108,946 | 609.77 |
| 2020 | 122,514 | 661.04 |
| 2021 | 166,034 | 834.12 |

වගුව 29 - පොල් කර්මාන්තයේ අපනයන ආදායම




ප්‍රස්ථාරය06 - පොල් නිෂ්පාදිත අපනයන ආදායම

2021 වසරේදී කොවිඩ් වසංගත තත්ත්වය තුළද මෙතෙක් වාර්තාගත ඉහළම අපනයන ආදායම් වූ ඇ.ඩො.මිලියන 834 ක් ලබාගැනීමට 2021 වසරේදී හැකිවූ අතර, එය 2020 වසරට සාපේක්ෂව 26% ක වර්ධනයකි.

2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතයන්හී අපනයන ආදායම ඇ.ඩො.මිලියන 434.02කි. එය 2020 වසරට සාපේක්ෂව 27%ක වර්ධනයක් පෙන්වා ඇත. පොල් කටු ආශ්‍රිත නිෂ්පාදිතයන්හී අපනයන ආදායම 2021 වසරේ ඇ.ඩො. මිලියන 147.59කි. එය 2020 වසරට සාපේක්ෂව 32%ක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර අමුද්‍රව්‍ය ස්වරූපයේ කොහු අපනයනයන්හී ආදායම ඇ.ඩො.මිලියන 29.10කි. එයද 2020 වසරට සාපේක්ෂව 2%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. අගය එකතු කළ කොහු නිෂ්පාදන අපනයනයන්හී ආදායම ඇ.ඩො.මිලියන 219.84 කි. එය

2020 වසරේ ආදායමට සාපේක්ෂව 24%ක වර්ධනයක් ද පෙන්නුම් කර ඇත. වසරින් වසර පොල් ආශ්‍රිත නිෂ්පාදන වල අපනයන ආදායම ඉහල අගයක් ගන්නා අතර 2025 වසර වන විට පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයෙහි අපනයන ආදායම ඇ.ඩො. බිලියන 1.5ක් ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.7 නව නිෂ්පාදන, අගය එකතු කිරීම්, වෙළඳපල ප්‍රවර්ධනය, සහ වෙළඳපල ප්‍රවිශ්ඨය ඉහළ නැංවීම

**3.7.1** ඇණවුම් වැඩි ගණනක් ලැබීම හේතුවෙන් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ නැවුම් පොල් තෙල් , දිසිඳි පොල්, තැඹිලි, පොල් කිරම, පොල් කිරි, පොල් වතුර, පොල් කිරිපිටි, පොල් බටර්, විනාකිරි සහ පොල් පිටි අපනයනයේ සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

3.7.2 පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය (www.cda.gov.lk) යාවත්කාලීන කිරීම මඟින් වඩාත් විධිමත් ලෙස දත්ත හුවමාරු කර ගැනීමේ කටයුතු 2021 වසරේදීද සිදු කරන ලදී.

**3.7.3** අගය එකතු කළ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන හා පරිසර හිතකාමී පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වලට ජනතාව යොමු කිරීමටත් එමඟින් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් වැඩි කරගැනීමේ අරමුණින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රවර්ධන සේවාවන් 2021 වසරේදීද සිදු කරන ලදී.

**3.7.4** හම්බන්තොට වරාය ආශ්‍රිතව පොල් ප්‍රතිඅපනයන සැකසුම් කලාපයක් ඇති කිරීම සඳහා 2021 වසරේදී මූලික සැලසුම් ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

## 3.8 අලෙවි සංවර්ධන සහාය සේවා

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳ ඇණවුම් පිළිබඳ තොරතුරු, නිෂ්පාදන,වෙළඳපොළවල්,වෙළඳ ප්‍රදර්ශන පිළිබඳ තොරතුරු කර්මාන්තකරුවන්ට,අපනයනකරුවන්ට,ගැණුම්කරුවන්ට ලබා දීම.
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදනයන් සඳහා පුරෝකථනයන් සැකසීම, වෙළඳ ප්‍රතිපත්ති සැකසීම සඳහා වැවිලි අමාත්‍යාංශයට සහ පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශයට සහාය වීම.
- ශ්‍රී ලංකාව වෙනත් රටවල් සමඟ සම්බන්ධ වීමට බලාපොරොත්තු වන සහයෝගීතා සහ නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා වැදගත් වන ලංකාවේ පොල් කර්මාන්ත හා අපනයන ක්ෂේත්‍රය හා බැඳි තොරතුරු වාණිජ දෙපාර්තමේන්තුවට සහ විදේශ කටයුතු අමාත්‍යාංශයට ලබාදීම.

## පොල් නිෂ්පාදිත අපනයන - 2020 /2021 සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන

| නිෂ්පාදනවර්ගය | ප්‍රමාණය )මෙ.ටෝ(. | | | වටිනාකම (ඇ.ඩො.මිලියන( | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | % වෙනස | 2020 | 2021 | % වෙනස |
| **1. පොල් මද නිෂ්පාදිතයන්** | | | | | | |
| 1) පොල් තෙල් | 5,180 | 3,825 | -26 | 14.23 | 11.66 | -18 |
| 2) නැවුම් පොල් තෙල් | 14,584 | 14,960 | 3 | 64.44 | 73.97 | 15 |
| 3) දිසිඳි පොල් | 29,591 | 36,116 | 22 | 76.21 | 107.85 | 42 |
| 4) කොප්පරා | 1,082 | 828 | -23 | 1.62 | 1.35 | -17 |
| 5) ගෙඩි පොල් ගෙඩි | 15,838 | 14,565 | -8 | 6.63 | 6.10 | -8 |
| 6) තැඹිලි ගෙඩි | 5,924,087 | 9,548,368 | 61 | 3.24 | 4.51 | 39 |
| 7) පුන්නක්කු | 8,935 | 5,317 | -40 | 2.34 | 1.86 | -21 |
| 8) ඔයිල් කේක් | 3,340 | 365 | -89 | 1.18 | 0.29 | -76 |
| 9) පොල් කිරම | 15,048 | 19,583 | 30 | 33.12 | 47.91 | 45 |
| 10) පොල් කිරි | 46,626 | 53,255 | 14 | 83.11 | 102.94 | 24 |
| 11) පොල් කිරි පිටි | 6,751 | 7,442 | 10 | 31.28 | 40.81 | 30 |
| 12) මේදය ඉවත් කළ පොල් | 3,303 | 3,376 | 2 | 3.96 | 5.18 | 31 |
| 13) පොල්වතුර | 17,910 | 26,414 | 47 | 15.03 | 22.52 | 50 |
| 14) පොල්අරක්ක ලීටර් | 13,325 | 19,078 | 43 | 0.13 | 0.18 | 44 |
| 15) විනාකිරි ලීටර් | 42,691 | 44,410 | 4 | 0.18 | 0.15 | -13 |
| 16) ෆැටි ඇසිඩ් | 268 | 1,098 | 310 | 0.20 | 0.92 | 358 |
| 17) පොල් බටර් | 127 | 214 | 69 | 0.47 | 0.79 | 68 |
| 18) පොල් පිටි | 3,630 | 4,042 | 11 | 4.22 | 5.02 | 19 |
| ***උප එකතුව -පොල් මද නිෂ්පාදිතයන්*** | | | | **341.59** | **434.01** | **27** |
| **2. කෙඳි නිෂ්පාදිතයන්** | | | | | | |
| 19) ගුදිරි කෙඳි | 71,604 | 73,492 | 3 | 17.33 | 19.17 | 11 |
| 20) බ්‍රිස්ටල් කෙඳි | 1,231 | 1,785 | 45 | 1.74 | 2.39 | 38 |
| 21) අඹරන ලද කෙඳි | 30,733 | 20,720 | -33 | 9.56 | 7.54 | -21 |
| ***උප එකතුව -කෙඳිනිෂ්පාදිතයන්*** | **103,568** | **95,997** | **-7** | **28.63** | **29.10** | **2** |
| **3. පොල් කටු නිෂ්පාදිතයන්** | | | | | | |
| 22) පොල් කටු අඟුරු | 12,038 | 8,355 | -31 | 5.85 | 5.07 | -13 |
| 23) පොල් කටුකැබලි හා කුඩු | 319 | 365 | 14 | 0.15 | 0.20 | 35 |
| 24) සක්‍රීය කාබන් | 45,306 | 52,719 | 16 | 105.51 | 142.32 | 35 |
| **උප එකතුව -පොල් කටුනිෂ්පාදිතයන්** | **57,663** | **61,439** | **7** | **111.51** | **147.59** | **32** |
| **4. නිමි භාණ්ඩ නිෂ්පාදිතයන්** | | | | | | |
| **(කොහු කෙඳි ආශ්‍රිත(** | | | | | | |
| 25) කොහු ලණු | 993 | 1,109 | 12 | 0.82 | 0.94 | 14 |
| 26) කොහු කඹ | 7,268 | 8,191 | 13 | 9.57 | 10.85 | 13 |
| 27) තවාෂි බුරුසු සංඛ්‍යාව'000 | 24,879 | 22,425 | -10 | 4.16 | 3.73 | -10 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 28) කොසු හා බුරුසු සංඛ්‍යාව'000 ) තවාෂි බුරුසු හැර | 15,611 | 13,470 | -14 | 7.32 | 9.09 | 24 |
| 29) රබර්මිශ්‍ර කොහු පෑඩ හා ඇඳන් මෙට්ට )සංඛ්‍යාව( | 667,522 | 809,090 | 21 | 1.199 | 0.98 | -18 |
| 30) කොහු ලණුපැදුරු හා බුමුතුරුණු )වර්ගමීටර්( | 325,122 | 380,205 | 17 | 1.63 | 1.84 | 13 |
| 31) කොහුකලාල )වර්ගමීටර්( | 2,913 | 5,897 | 102 | 0.02 | 0.02 | -15 |
| 32) කොහුබත් | 38,526 | 42,567 | 10 | 9.61 | 11.68 | 22 |
| 33) පොල්ලෙලි කැබලි | 6,896 | 2,682 | -61 | 3.11 | 1.06 | -66 |
| 34) මිහිසළු | 4,273 | 4,550 | 6 | 4.55 | 5.21 | 15 |
| 35) උද්‍යානවගා සඳහා යොදා ගන්නා කොහු නිෂ්පාදිතයන් | 272,520 | 324,855 | 19 | 135.33 | 174.44 | 29 |
| **උපඑකතුව -කොහු ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදිතයන්** | | | | **177.32** | **219.84** | **24** |
| **5. වෙනත් නිෂ්පාදිතයන්** | | | | | | |
| 36) පොල්ඉරටු | 7,604 | 11,889 | 56 | 1.79 | 3.33 | 86 |
| 37) පොල්ලී | 6 | 41 | 583 | 0.03 | 0.23 | 784 |
| **උප එකතුව -වෙනත්නිෂ්පාදිතයන්** | **7,610** | **11,930** | **57** | **1.82** | **3.56** | **96** |
| **මුළු අපනයනආදායම** | | | | **660.87** | **834.11** | **26** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

## වගුව 30 - පොල් නිෂ්පාදිත අපනයන - 2020 /2021

# 04.පරිපාලන අංශය

පරිපාලන අංශයේ මූලික පරමාර්ථය වනුයේ ආයතනයේ සියළු අංශයන් සඳහා සහය සේවාවන් ලබාදීම හා පහසුකම් සැපයීම, අධිකාරියේ මනා පැවැත්ම හා ප්‍රවර්ධනය වෙනුවෙන් අදාළ වන සියළුම ආයතනික කටයුතු, මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු මෙහෙයවීම ද එමඟින් ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යයභාරය ඉටු කිරීමේදී සහය වීම මෙන්ම සමස්ත ආයතනයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වීමයි.

## 4.1 සේවක සංඛ්‍යාව

මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2021 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 207 ක් වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් තිස් හය දෙනෙක් (36) කළමනාකරණ මට්ටමේ අය වූහ. සේවක සංඛ්‍යාව පහත සේවා ගණයන්ගෙන් සමන්විත විය.

1. ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය
2. කළමනාකාර සේවා ගණය
3. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය
4. ආශ්‍රිත නිලධාරී සේවා ගණය
5. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය
6. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) සේවා ගණය
7. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය
8. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය
9. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය

- මෙම අධිකාරිය සඳහා අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සහ බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා කාර්යය මණ්ඩල පරිපාලනයට අදාළ සියළුම කටයුතු සිදු කිරීම.

**2021.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු**

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවක සංඛාව | 2021 වර්ෂය තුළ අලුතින් ගත් සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | | |
| අධ්‍යක්ෂ(තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) | 1 | 1 | | |
| අධ්‍යක්ෂ (පාලන) | 1 | - | 1 | |
| අධ්‍යක්ෂ(මූදල්) | 1 | 1 | | |
| අධ්‍යක්ෂ(සැකසුම් සංවර්ධන) | 1 | 1 | | 1 |
| අධ්‍යක්ෂ(අලෙවි සංවර්ධන හා පර්යේෂණ) | 1 | 1 | | |
| අධ්‍යක්ෂ අලෙවිකරණ(ජාත්‍යන්තර) | 1 | | 1 | |
| සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) | 4 | 4 | | 2 |
| අභ්‍යන්තර විගණක | 1 | 1 | | |
| සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූදල්) | 1 | 1 | | |
| සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) | 2 | 2 | | |
| සහකාර අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) | 2 | 2 | | |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | | |
| රසඥ | 1 | 1 | | |
| ඉංජිනේරු(සිවිල්) | 1 | 1 | | |
| නීති නිළධාරී | 1 | 1 | | 1 |
| මූල්‍ය නිළධාරී | 1 | 1 | | |
| පර්යේෂණ නිළධාරී | 1 | 1 | | 1 |
| අලෙවි නිලධාරී | 1 | 1 | | 1 |
| ජ්‍යෙෂ්ඨ පරීක්ෂක | 9 | 8 | 1 | 2 |
| පරිපාලන නිළධාරී | 1 | | 1 | |
| අභ්‍යන්තර විගණක නිලධාරී | 1 | 1 | | 1 |
| තොරතුරු නිලධාරී | 1 | 1 | | |
| තත්ත්ව පාලන නිලධාරී | 1 | 1 | | |
| සැකසුම් සංවර්ධන නිලධාරී | 5 | 3 | 2 | 1 |
| ආර්ථික පර්යේෂණ නිලධාරී | 1 | | 1 | |
| සභාපති ලේකම් | 1 | 1 | | |
| වැඩසටහන් සහකාර(අලෙවි පර්යේෂණ) | 3 | 1 | 2 | |
| වැඩසටහන් සහකාර(තත්ත්ව පාලන) | 7 | 3 | 4 | |
| වැඩසටහන් සහකාර(අභ්‍යන්තර විගණක) | 2 | 2 | | 2 |
| වැඩසටහන් සහකාර (තොරතුරු ) | 1 | 1 | | |
| වැඩසටහන් සහකාර(සැකසුම් සංවර්ධන) | 2 | | 2 | |

| | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන් සහකාර (තාක්ෂණික සේවා) | 25 | 12 | 13 | |
| වැඩසටහන් සහකාර(ආර්ථික පර්යේෂණ) | 1 | 1 | | |
| කාර්මික සහකාර (ප්‍රවාහන ) | 1 | 1 | | 1 |
| කාර්මික සහකාර(විදුලි) | 1 | 1 | | 1 |
| පොත් තබන්නා | 2 | 2 | | 2 |
| පරීක්ෂක | 30 | 26 | 4 | 11 |
| රසායනාගාර කාර්මික ශිල්පී | 11 | 11 | | 8 |
| අධ්‍යක්ෂ ජනරාල් ලේකම් | 1 | | 1 | |
| කළමනාකාර සහකාර | 58 | 49 | 9 | |
| රසායනාගාර ක්ෂේත්‍ර සහකාර | 2 | 1 | 1 | |
| ක්ෂේත්‍ර සහකාර | 2 | 1 | 1 | |
| රියදුරු | 20 | 19 | 1 | |
| රසායනාගාර සහයක | 13 | 11 | 2 | |
| කාර්යාල සහයක | 18 | 16 | 2 | |
| ක්ෂේත්‍ර සහයක | 15 | 13 | 2 | |

වගුව 31 - **2021.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු**

## 4.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

මානව සම්පත අධිකාරියේ මෙහෙවර හා අරමුණු ලභා කර ගැනීම සඳහා වඩා ඵලදායීව හා සඵලදායීව යොදා ගැනීමට හැකිවන පරිදි මෙම අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතා හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2021 වර්ෂයේ දේශීය පුහුණු සංවර්ධන පාඨමාලා විවිධ විෂයන් ඔස්සේ සංවිධානය කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී පුහුණු සංවර්ධන පාඨමාලා මෙහෙයවනු ලබන රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් පාඨමාලා සංවිධානය කිරීමට කටයුතු කර ඇත. 2021 වර්ෂයේ දී අධිකාරියේ කාර්යය මණ්ඩලය වෙත පසුගිය වර්ෂයන්වල දී ලබා දීමට නොහැකි වූ හා අත්‍යවශ්‍යයෙන්ම ලබා දිය යුතු පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීම පාලන අංශයේ අරමුණ විය.

පුද්ගල ආකල්ප හා කුසලතා වර්ධනය, නවක කාර්යය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවය පිළිබඳ අවබෝධය ලබා දීම, කණ්ඩායම් හැඟීම වර්ධනය, රැකියා පරිසරයේ ඇති වී තිබෙන නව්‍යතා හඳුන්වා දීම හා ආයතනික පරිසරය කෙරෙහි හැඩගැස්වීම පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීමේ අරමුණු වී ඇත.

ඒ අනුව කාර්යය මණ්ඩලය වෙනුවෙන් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා වැය කරන මුදල් අනාගත ආයෝජනයක් සේ සළකා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අදාළ පුහුණු කටයුතු සඳහා යොමු කිරීම සිදු කර ඇත.

දේශීය පුහුණු සංවර්ධන කටයුතු

| අංකය | පාඨමාලාවේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ ගණන | පැවති දින ගණන |
|---|---|---|---|---|
| 01 | Capacity Building programme to be conducted by Singapore Coperation Enterprise &TEMASEC foundation International | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 06 | 01 |
| 02 | Perfaormance Management & KPI Setting | | 02 | 01 |
| 03 | Personal File Management (Online) | MILODA | 01 | 01 |
| 04 | Procurement Guidline Planning & Regulation | MILODA | 01 | 01 |
| 05 | Report Writing Skills | MILODA | 01 | 01 |
| 06 | Internet & Email | NIPM | 03 | 01 |
| 07 | රජයේ වාහන නඩත්තුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (Online) | 02 | 01 |
| 08 | වාර්ෂික වත්කම් භාණ්ඩ සමීක්ෂණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (Online) | 01 | 03 |
| 09 | රියදුරන්ගේ කුසලතා සංවර්ධනය | | 02 | 02 |
| 10 | Online Certificate in English for Employment Purpose | CEEP | 01 | 30 |
| 11 | Capacity Building Programme to be conducted by Singapore cooperation enterprise and TEMASEC foundation International | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 06 | 03 |
| 12 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සම්බන්ධ පුහුණු වැඩමුළුව (Online) | අනුර ලොකුගමගේ මයා | 20 | 04 |
| 13 | Certificate Course on Export & Import Procedures | EDB | 05 | 01 |

වගුව 32 - දේශීය පුහුණු සංවර්ධන කටයුතු

## පාලන අංශයේ වෙනත් කාර්යයන්

- ආයතනයේ ස්ථාවර වත්කම් සම්බන්ධ වත්කම් ලේඛන පවත්වාගෙන යාම, වාර්ෂික තොග සමීක්ෂණ සම්බන්ධ සියළු කටයුතු ඉටු කිරීම.

- අධිකාරියට අවශ්‍ය සියළුම ප්‍රග්ධන භාණ්ඩ ලිපිද්‍රව්‍ය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයෙහි ස්ථාපිත කර ඇති ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ අංශය, රසායනික විශ්ලේෂණ අංශය හා සංවේදී රසායනාගාරය යන මූලික රසායනාගාර හා ඊට අනුබද්ධව පවතින මාධ්‍ය සැකසුම් ඒකකය සංවේදී උපකරණ අංශය හා සේදුම් ඒකකය වැනි තත්ත්ව පාලන ඒකක සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ, රසායනික ද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ජීවී මාධ්‍ය මිලදී ගැනීම.
- සේවකයින් ආයතනික පරිපාලනමය නීති රීති වලට අවනත නොවීම යන කරුණු කාරණා වලදීත් ආයතනයේ විනය පාලනයට අවශ්‍ය සියළුම ක්‍රියා පරිපාටි සහ කම්කරු විනිශ්චය සභා කාර්මික අධිකරණයේ නීති කටයුතු සිදු කිරීම.
- ප්‍රවාහන කළමනාකරණය සම්බන්ධ සියළු කටයුතු
- ඉදිකිරීම්,නඩත්තු හා සේවා සම්බන්ධ සියළු කටයුතු සිදුකිරීම.
- අධිකාරියට අවශ්‍ය ආරක්ෂක සේවාව,පවිත්‍රතා සේවාව කාර්යය මණ්ඩලය ප්‍රවාහන සේවාව ලබා ගැනීම සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම
- අධිකාරියේ කාර්යය මණ්ඩලය සම්බන්ධව හා රථවාහන සඳහා රක්ෂණාවරණය ලබා ගැනීම සම්බන්ධව කටයුතු සිදු කිරීම
- වැවිලි අමාත්‍යාංශයේ,පොල් කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගීකරණ අමාත්‍යාංශ,කළමනාකාරණ සේවා දෙපාර්තමේනතුව ආදි ආයතන වෙත ඉල්ලුම් කරන අවස්ථා වලදී අදාළ වාර්තා , ප්‍රගතිය සම්බන්ධ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම
- අධිකාරියේ එක් එක් අංශ වලින් ලබා ගන්නා ලද දත්ත ඇසුරින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම
- ඒක් ඒක් අංශ වලින් ලබා ගන්නා ලද තොරතුරු හා විගණකාධිපති වාර්තා ඇතුලත් කර වාර්ෂික වාර්තාව සකස්කිරීම, අදාළ අනුමැතීන් ලබා ගැනීම හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- අධිකාරියේ එක් එක් අංශ වලට අදාළ වන සියළුම මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම
- අධිකාරියට භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.
- අධිකාරියේ ගබඩාව නිසි තොග පාලනයක් යටතේ පවත්වා ගෙන යෑම.

# 05. මුදල් අංශය

පොල් සංවර්ධන අධිකාරියේ මුදල් අංශය මඟින් විවිධ අංශවලට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීමේ වගකීම දරයි. ඒ අනුව, අයවැය සහ මූල්‍ය කාර්යය සැලසුම්වලට අනුකූල වූ අනුමත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මුදල් අංශය වගකීම දරයි. වරින් වර මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා පිළියෙල කිරීම ඇතුළුව මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම වැනි කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් ද මුදල් අංශය වගකීම උසුලයි. ආයෝජන කළමනාකරණය ඇතුලුව එහි අරමුදල් භාරව කටයුතු කරන්නේ ද මුදල් අංශයයි.මුළු වත්කම් පාලනය කිරීම හා සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම මුදල් අංශයේ වගකීම වේ. කළමනාකරණ අවශ්‍යතා සඳහා විවිධ මූල්‍ය වාර්තා පිළියෙල කිරීම ද මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම මෙම අංශය මඟින් සිදුකෙරේ.

## 5.1 සාමාන්‍ය මෙහෙයුම් කටයුතු

- 2021 වර්ෂයේ රජයේ පුනරාවර්ථන ප්‍රදාන ලෙස රු. මිලියන 134.5 ක් සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.මිලියන 7.0 ක් ලැබී ඇති අතර, රු.මිලියන 178 ක් අභ්‍යන්තර ආදායම් උපයා ඇත.
- සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පුනරාවර්ථන වියදම රු. මිලියන 232 ක් සහ ප්‍රාග්ධන වියදම් රු. මිලියන 83 ක් දරා ඇති අතර, ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැය කර ඇති මුදල රු. මිලියන 25.5 ක් වේ.

## 5.2 ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන

- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, සැකසුම සංවර්ධන අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය යටතේ අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අදාළ ව්‍යාපෘතීන් සඳහා ප්‍රාග්ධන අරමුදල් වියදම් කිරීම සිදු කරන අතර, ඒ සම්බන්ධව වෙනම ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම සිදු කරයි.

## 2021 වර්ෂයේ දී ද පහත සඳහන් කටයුතු නිම කිරීමට අධිකාරියේ මුදල් අංශයට හැකි වී ඇත.

- අරමුදල් කළමනාකරණය සහ සංවර්ධන ව්‍යාපෘති යන වැඩසටහන් පිළිබඳ මූල්‍ය වාර්තා සැපයීම.
- මෝල් සංවර්ධන අරමුදලේ දිසිදි පොල් මෝල් හිමියන් නමින් පවත්වාගෙන යන ආරක්ෂිත ඇප තැන්පත් කේවළ ගිණුම් සඳහා මාසිකව අපනයන දිසිදි නිෂ්පාදන මත මුදල් බැර කිරීම.
- පොල් තෙල් මිල ස්ථායීකරණ අරමුදල උපයෝගී කර ගනිමින් පොල් කර්මාන්තයේ නියුතු ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට මහජන බැංකුව හා එක්ව ‘‘කජ්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය’’ සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එක්ව ‘‘කජ්රුක ජය ඉසුර’’ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහය වීම.
- පොල් සංවර්ධන අධිකාරියේ සේවක අර්ථසාධක අරමුදලේ මුදල් නිසි පරිදි කළමනාකරණය කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට ණය මුදල් ගෙවීම් කටයුතු කිරීම හා අවුරුදු 55 ඉක්ම වූ සේවකයින්ගේ ඉල්ලීම මත 75% සීමාවට යටත්ව සාමාජික මුදල් නිදහස් කිරීම.
- මනා කළමනාකාරිත්වයකින් යුතුව අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල සහ බැඳුම්කරවල ආයෝජනය කිරීම.
- මෝල් සංවර්ධන අරමුදලෙහි ඇති අරමුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එක් එක් මෝල් හිමියන්ගේ නමින් විවෘත කර ඇති කේවල ඉතිරි කිරීමේ ගිණුම්වල මනා කළමනාකාරිත්වයකින් යුතුව පවත්වාගෙන යෑම.

මුදල් අංශය විසින් වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික අවසාන ගිණුම් ප්‍රකාශ, මාසික මූල්‍ය ප්‍රගති වාර්තා සහ අනෙකුත් සංඛ්‍යාලේඛණ තොරතුරු සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය, අමාත්‍යාංශය, භාණ්ඩාගාරය, රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ ආයතන වෙත නියමිත කාලසීමාවන් තුළ ඉදිරිපත් කිරීමෙන් එහි වගකීම ඉටුකර ඇත.

## **2021.12.31** දිනටඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශය (සාරාංශගත)

| | 2021.12.31 | 2020.12.31 |
|---|---|---|
| | රු | රු |
| **වත්කම්** | | |
| | | |
| ***ස්ථාවර වත්කම්*** | **497,730,105** | **511,661,057** |
| | | |
| ***මුළු ජංගම නොවන වත්කම්*** | **211,350,727** | **201,996,817** |
| | | |
| ***ජංගම වත්කම්*** | | |
| තොග වට්ටෝරු/ තොග | 21,501,463 | 26,351,915 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ | 869,195,663 | 788,892,210 |
| පෙ ගෙවුම් | 2,353,643 | 2,729,142 |
| මුදල් සහ මුදල් සම න දේ | 9,930,330 | 23,635,946 |
| අන්තර් ජංගම ගිණුම | 260,405,261 | 224,711,009 |
| **මුලු ජංගම වත්කම්** | **1,163,386,360** | **1,066,320,222** |
| **මුළු වත්කම්** | **1,872,467,191** | **1,779,978,096** |
| | | |
| ***ජංගම නොවන බැරකම්*** | | |
| ප රිතෝෂික සඳහ ප්‍රතිප දන | (44,325,290) | (41,521,436) |
| | | |
| ***ජංගම බැරකම්*** | | |
| ගෙවිය යුතු දේ | (335,531,740) | (250,468,240) |
| උපචිත වියදම් | (27,989,350) | (10,566,095) |
| | **(363,521,090)** | **(261,034,335)** |
| | | |
| | **1,464,620,812** | **1,477,422,325** |
| ***හිමිකම් සහ බැරකම්*** | | |
| ප්‍ර ග්ධන සංචිත | 463,297,656 | 463,297,656 |
| ජයේ ප්‍රද න | 88,943,221 | 88,943,221 |
| ප්‍ර ග්ධන සංවර්ධන අ මුදලෙන් ප්‍රද න | 77,652,767 | 77,652,767 |
| සමුච්චිත අ මුදල | 834,727,168 | 847,528,682 |
| | | |
| **මුළු හිමිකම් සහ බැරකම්** | **1,464,620,811** | **1,477,422,325** |
| | | |

අංක 11-13 පිටුවල ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති සහ 14-29 පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශන යන්හිම ඒකාබද්ධ කොටසකි. මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් උසුලනු ලබයි.. මූල්‍ය ප්‍රකාශන 2022.02.05 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.

**එම්. පී සන්ධ්‍යා කාන්ති**
**අධ්‍යක්ෂ මූල්‍ය**

**ඒ වී කේ මාධවී හේරත්**
**සභාපති**

**එස් පී විතානගේ**
**අධ්‍යක්ෂ ජනරාල්**
25/02/2022

**ආර් පී කස්තුරිආරච්චි**
**අධ්‍යක්ෂක**

## *පොල් සංවර්ධන අධිකාරිය*

### ***2021.12.31** දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශය*

| | *සටහන් අංක* | **2021.12.31** රු. | 2020.12.31 රු. |
|---|---|---|---|
| ***ස්ථාවර වත්කම්*** | | | |
| *ස්ථාවර වත්කම්* | ***1*** | 761,252,912 | 738,046,612 |
| *අඩුකළා : සමුච්චිත ක්ෂය* | | (263,522,807) | (226,385,555) |
| | | **497,730,105** | **511,661,057** |
| ***ජංගම නොවන වත්කම්*** | | | |
| *කෙරීගෙන යන වැඩ* | | 1,075,200 | - |
| *මාඔම් තාප්පය සහ ජලාපවහන නල පද්ධතිය* | | 1,128,243.88 | 1,565,936 |
| *කාර්ය මණ්ඩල ණයගැතියෝ* | ***5*** | 19,765,494 | 22,558,635 |
| *බී සී සී ලංකා සමාගමට දෙන ලද ණය* | ***6*** | 58,265,037 | 58,265,036 |
| *බී බී සී ලංකා සමාගම වෙනුවෙන් ලැබිය යුතු පොලී* | | 56,162,526 | 52,150,917 |
| *අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන* | | (56,162,526) | (52,150,917) |
| *කප්රුක නිපැයුම් දිරිය සඳහා දුන් ණය* | ***7*** | 131,116,751 | 119,607,210 |
| | | **211,350,727** | **201,996,817** |
| ***ජංගම වත්කම්*** | | | |
| ***බඩු වට්ටෝරු/ තොග*** | | | |
| *තොග* | ***2*** | 21,501,463 | 26,351,915 |
| | | **21,501,463** | **26,351,915** |
| ***වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ*** | | | |
| *සුභසාධන ණය අරමුදල* | ***3*** | 2,007,438 | 2,007,438 |
| *සුළු ණයගැතියෝ* | ***4*** | 23,989,634 | 21,429,247 |
| *කාර්ය මණ්ඩල ණයගැතියෝ* | ***5*** | 5,654,992 | 5,766,816 |
| *සුළු අත්තිකාරම්* | ***8*** | 483,500 | 553,200 |
| *සුළු තැන්පතු* | ***9*** | 1,749,994 | 2,066,708 |
| *බැංකු තැන්පතු* | ***10*** | 811,811,075 | 734,928,453 |
| *භාණ්ඩාගාර බිල්පත්* | ***10*** | 23,499,031 | 22,140,348 |
| | | **869,195,663** | **788,892,210** |
| *පෙර ගෙවුම්* | ***11*** | 2,353,643 | 2,729,142 |
| ***මුදල් සහ මුදල් සමාන දෑ*** | | | |
| *බැංකුවේ ඇති මුදල්* | ***12*** | 9,872,293 | 23,548,970 |
| *සුළුමුදල්* | ***12*** | 29,420 | 55,000 |
| *මුද්දර යන්ත්‍රය* | | 28,617 | 31,976 |
| | | **9,930,330** | **23,635,946** |
| *අන්තර් ජංගම ගිණුම* | | 260,405,261 | 224,711,009 |
| ***මුළු ජංගම වත්කම්*** | | 1,163,386,360 | 1,066,320,222 |
| | | **1,872,467,191** | **1,779,978,096** |
| ***ජංගම නොවන බැරකම්*** | | | |
| *පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන* | | **(44,325,290)** | (41,521,436) |
| ***ජංගම බැරකම්*** | | | |
| ***ගෙවිය යුතු දෑ*** | | | |
| *සුළු ණය හිමියෝ* | ***13*** | (70,527,250) | (23,226,071) |
| *ආපසු ගෙවනු ලබන තැන්පතු* | ***14*** | (532,625) | (888,820) |
| *කලින් ලද අත්තිකාරම්* | ***15*** | (4,066,605) | (1,642,340) |
| *උපචිත වියදම්* | ***16*** | (27,989,350) | (10,566,095) |
| *අන්තර් ජංගම ගිණුම* | | (260,405,261) | (224,711,009) |
| ***මුළු ජංගම වත්කම්*** | | **(363,521,090)** | **(261,034,335)** |
| | | **1,464,620,812** | **1,477,422,325** |
| ***මූල්‍යණය කරන ලද්දේ*** | | | |
| *ඉඩම් සඳහා ප්‍රත්‍යාගණන සංචිත* | | 268,897,540 | 268,897,540 |
| *ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණන සංචිත* | | 129,425,116 | 129,425,116 |
| *මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන සංචිත* | | 64,975,000 | 64,975,000 |
| | | **463,297,656** | **463,297,656** |
| *ප්‍රදාන සහ දායක මුදල්* | | 88,943,221 | 88,943,221 |
| *ප්‍රාග්ධන සංවර්ධන අරමුදලින් ප්‍රදාන* | | 77,652,767 | 77,652,767 |
| *සමුච්චිත අරමුදල* | ***17*** | 834,727,168 | 847,528,682 |
| | | **1,464,620,812** | **1,477,422,326** |

අංක 11-13 පිටුවල ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති සහ 14-29 පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හිම ඒතාබද්ධ කොටසකි. මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් උසුලනු ලබයි.. මූල්‍ය ප්‍රකාශන 2022.02.05 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.

**එම්. පී සන්ධ්‍යා කාන්ති**
**අධ්‍යක්ෂ මූල්‍ය**

**ඒ වී කේ මාධවී හේරත්**
**සභාපති**

**එස් පී විතානගේ**
**අධ්‍යක්ෂ ජනරාල්**
25/02/2022

**ආර් පී කස්තුරිආරච්චි**
**අධ්‍යක්ෂක**

## මූල්‍ය තත්ව ප්‍රකාශය (අරමුදල් අනුව විශ්ලේෂිත)

| වසර | 2020 | | | | |
|---|---|---|---|---|---|
| | පොදු මණ්ඩල මෙහෙයුම් රු | ප්‍රාග්ධන සං අරමුදල රු | පී එස් එස් තෙල් අරමුදල රු | පොල් සංවර්ධන අරමුදල රු | එකතුව රු. |
| **ස්ථාවර වත්කම්** | | | | | |
| ස්ථාවර වත්කම් | 672,613,702 | 65,432,910 | - | - | 738,046,612 |
| අඩුකළා- සමුච්චිත ක්ෂය | (225,050,982) | (1,334,573) | - | - | (226,385,555) |
| | **447,562,720** | **64,098,337** | **-** | **-** | **511,661,057** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| කෙරීගෙන යන වැඩ | | | | | - |
| මායිම් කාප්පය සහ ජලාපවහන නල පද්ධතිය | 1,565,936 | - | - | | 1,565,936 |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | 22,558,635 | - | - | - | 22,558,635 |
| බී සී සී ලංකා සමාගමට දෙන ලද ණය | - | 31,550,000 | 26,715,037 | - | 58,265,037 |
| බී බී සී ලංකා සමාගම වෙනුවෙන් ලැබිය යුතු පොළ | - | - | 52,150,917 | - | 52,150,917 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන (ණය පොලී) | - | - | (52,150,917) | - | (52,150,917) |
| දිරිය/ ජය ඉසුරු ණය අරමුදල | - | | 2,799,441 | 116,807,768 | 119,607,210 |
| | **24,124,570** | **31,550,000** | **29,514,479** | **116,807,768** | **201,996,817** |
| **ජංගම වත්කම්** | | | | | |
| **බඩු විට්ටෝරු/ තොග** | | | | | |
| තොග | 26,351,915 | - | - | - | **26,351,915** |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | - | - | - | - | **-** |
| සුභසාධන ණය අරමුදල | 2,007,438 | - | - | - | **2,007,438** |
| සුළු ණයගැතියෝ | 7,517,579 | 7,610,552 | 2,152,466 | 4,148,650 | **21,429,247** |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | 5,766,816 | - | - | - | **5,766,816** |
| සුළු අත්තිකාරම් | 553,200 | - | - | - | **553,200** |
| සුළු නැන්පතු | 1,916,708 | 150,000 | - | - | **2,066,708** |
| භාණ්ඩාගාර බිල්පත් | 2,877,081 | - | 19,263,268 | | **22,140,348** |
| බැංකු නැන්පතු | 325,727,574 | 47,456,308 | 200,908,616 | 160,835,956 | 734,928,453 |
| | **346,366,395** | **55,216,860** | **222,324,349** | **164,984,606** | **788,892,210** |
| පෙර ගෙවුම් | 2,729,142 | - | - | - | **2,729,142** |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | | | | |
| බැංකුවේ ඇති මුදල් | 55,000 | - | - | - | 55,000 |
| සුළු මුදල් | 16,420,824 | 7,128,146 | - | - | 23,548,970 |
| මුද්දර යන්ත්‍රය | 31,976 | - | - | - | 31,976 |
| | **16,507,800** | **7,128,146** | **-** | **-** | **23,635,946** |
| කප්රුක සහ ජය ඉසුර ණය යෝජනා ක්‍රමයන්ට දුන් අත්තිකාරම් | | | | | - |
| අන්තර් ජංගම ගිණුම (ප්‍රා සං අරමුදල/GBO) | 142,670,754 | 4,070,000 | 76,277,972 | 1,692,283 | 224,711,009 |
| **මුළු ජංගම වත්කම්** | 534,626,006 | 66,415,006 | 298,602,321 | 166,676,889 | 1,066,320,222 |
| | **1,006,313,296** | **162,063,343** | **328,116,799** | **283,484,658** | **1,779,978,097** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාරිභෝගික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | (41,521,436) | - | - | - | (41,521,436) |
| **ජංගම බැරකම්** | | | | | - |
| **ගෙවිය යුතු දෑ** | | | | | - |
| සුළු ණයහිමියෝ | (22,537,474) | (688,597) | - | - | (23,226,071) |
| ආපසු ගෙවනු ලබන නැන්පතු | (369,001) | (519,820) | - | - | (888,820) |
| කලින් ලද අත්තිකාරම් | (1,642,340) | - | - | - | (1,642,340) |
| උපචිත වියදම් | (9,791,370) | (774,725) | - | - | (10,566,095) |
| කප්රුක සහ ජය ඉසුර ණය යෝජනා ක්‍රමයන්ට දුන් අ | - | - | (4,070,000) | (199,277,972) | (203,347,972) |
| අන්තර් ජංගම ගිණුම | | (21,363,037) | | | (21,363,037) |
| **මුළු ජංගම බැරකම්** | **(34,340,184)** | **(23,346,179)** | **(4,070,000)** | **(199,277,972)** | **(261,034,335)** |
| | **930,451,676** | **138,717,164** | **324,046,799** | **84,206,686** | **1,477,422,326** |
| **මූල්‍යනය කරන ලද්දේ** | | | | | |
| ඉඩම් සඳහා ප්‍රත්‍යාගණන සංචිත | 216,455,830 | 52,441,710 | - | - | 268,897,540 |
| ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණන සංචිත | 129,425,116 | - | - | - | 129,425,116 |
| මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන සංචිත | 64,975,000 | - | - | - | 64,975,000 |
| ප්‍රදාන සහ දායක මුදල් | 88,943,221 | - | - | - | 88,943,221 |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදලින් ප්‍රදාන | 77,652,767 | - | - | - | 77,652,767 |
| සමුච්චිත අරමුදල්/ අතිරික්කය | 352,999,742 | 86,275,454 | 324,046,799 | 84,206,686 | 847,528,682 |
| | **930,451,676** | **138,717,164** | **324,046,799** | **84,206,686** | **1,477,422,326** |

## මූල්‍ය තත්ව ප්‍රකාශය (අරමුදල් අනුව විශ්ලේෂිත)

**වසර 2021**

| | සටහන් අංක | පොදු මණ්ඩල මෙහෙයුම් රු | ප්‍රාග්ධන සං අරමුදල රු | පී එස් එස් තෙල් අරමුදල රු | මෝල් සංවර්ධන අරමුදල රු | එකතුව රු |
|---|---|---|---|---|---|---|
| **ස්ථාවර වත්කම්** | | | | | | |
| ස්ථාවර වත්කම් | 1 | 694,231,494 | 67,021,418 | - | - | 761,252,912 |
| අඩුකළා- සමුච්චිත ක්ෂය | | (261,167,008) | (2,355,799) | - | - | (263,522,807) |
| | | **433,064,486** | **64,665,619** | **-** | **-** | **497,730,105** |
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| කෙරීගෙන යන වැඩ | | **75,600** | **999,600** | | | 1,075,200 |
| මායිම් තාප්පය සහ ජලාපවහන නල පද්ධතිය | | 1,128,244 | **-** | **-** | | 1,128,244 |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | 5 | 19,765,494 | - | - | **-** | 19,765,494 |
| බී සී සී ලංකා සමාගමට දෙන ලද ණය | 6 | - | 31,550,000 | 26,715,037 | **-** | 58,265,037 |
| බී බී සී ලංකා සමාගම වෙනුවෙන් ලැබිය යුතු පොලී | | - | - | 56,162,526 | **-** | 56,162,526 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන (ණය පොලී) | | - | - | (56,162,526) | **-** | (56,162,526) |
| දිරිය/ ජය ඉසුරු ණය අරමුදල | 7 | - | | 1,730,000 | 129,386,751 | 131,116,751 |
| | | **20,969,338** | **32,549,600** | **28,445,038** | **129,386,751** | **211,350,727** |
| **ජංගම වත්කම්** | | | | | | |
| **බඩු වට්ටෝරු/ තොග** | | | | | | |
| තොග | 2 | 21,501,463 | - | - | - | **21,501,463** |
| **වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | | - | - | - | - | **-** |
| සුභසාධන ණය අරමුදල | 3 | 2,007,438 | - | - | - | **2,007,438** |
| සුළු ණයගැතියෝ | 4 | 11,038,859 | 7,600,513 | 2,022,425 | 3,327,837 | **23,989,634** |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | 5 | 5,654,992 | - | - | - | **5,654,992** |
| සුළු අත්තිකාරම් | 8 | 483,500 | - | - | - | **483,500** |
| සුළු තැන්පතු | 9 | 1,599,994 | 150,000 | - | - | **1,749,994** |
| භාණ්ඩාගාර බිල්පත් | 10 | 3,022,344 | - | 20,476,686 | | **23,499,031** |
| බැංකු තැන්පතු | 10 | 341,658,104 | 49,853,419 | 211,804,767 | 208,494,784 | 811,811,075 |
| | | **365,465,232** | **57,603,932** | **234,303,878** | **211,822,621** | **869,195,663** |
| පෙර ගෙවුම් | 11 | 2,353,643 | **-** | - | - | **2,353,643** |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | | | | | |
| බැංකුවේ ඇති මුදල් | | 29,420 | - | - | - | 29,420 |
| සුළු මුදල් | 12 | 8,979,976 | 892,316 | - | - | 9,872,293 |
| මුද්දර යන්ත්‍රය | | 28,617 | - | - | - | 28,617 |
| | | **9,038,013** | **892,316** | **-** | **-** | **9,930,330** |
| කප්රුක සහ ජය ඉසුර ණය යෝජනා ක්‍රමයන්ට දුන් අත්තිකාරම් | | | | | | - |
| අන්තර් ජංගම ගිණුම් (ප්‍රා සං අරමුදල/GBO) | | 176,175,376 | **4,070,000** | **76,277,972** | 3,881,914 | 260,405,261 |
| **මුළු ජංගම වත්කම්** | | 574,533,727 | 62,566,248 | 310,581,850 | 215,704,535 | 1,163,386,360 |
| | | **1,028,567,550** | **159,781,467** | **339,026,888** | **345,091,286** | **1,872,467,191** |
| **ජංගම නොවන බැරකම්** | | | | | | |
| පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | | (44,325,290) | - | - | - | (44,325,290) |
| **ජංගම බැරකම්** | | | | | | - |
| **ගෙවිය යුතු දෑ** | | | | | | - |
| සුළු ණයහිමියෝ | 13 | (62,335,432) | (8,191,817) | - | - | (70,527,250) |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | 14 | (532,625) | | - | - | (532,625) |
| කලින් ලද අත්තිකාරම් | 15 | (4,066,605) | | - | - | (4,066,605) |
| උපචිත වියදම් | 16 | (11,175,301) | (16,814,049) | - | - | (27,989,350) |
| කප්රුක සහ ජය ඉසුර ණය යෝජනා ක්‍රමයන්ට දුන් අත්ති | | - | | | | - |
| අන්තර් ජංගම ගිණුම් | | | (11,057,289) | (4,070,000) | (245,277,972) | (260,405,261) |
| **මුළු ජංගම බැරකම්** | | **(78,109,963)** | **(36,063,155)** | **(4,070,000)** | **(245,277,972)** | (363,521,090) |
| | | **906,132,298** | **123,718,312** | **334,956,888** | **99,813,314** | **1,464,620,812** |
| **මූල්‍යනය කරන ලද්දේ** | | | | | | |
| ඉඩම් සඳහා ප්‍රත්‍යාගණන සංචිත | | 216,455,830 | 52,441,710 | - | - | 268,897,540 |
| ගොඩනැගිලි සඳහා ප්‍රත්‍යාගණන සංචිත | | 129,425,116 | - | - | - | 129,425,116 |
| මෝටර් වාහන සඳහා ප්‍රත්‍යාගණන සංචිත | | 64,975,000 | - | - | - | 64,975,000 |
| ප්‍රදාන සහ දායක මුදල් | | 88,943,221 | - | - | - | 88,943,221 |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදලින් ප්‍රදාන | | 77,652,767 | - | - | - | 77,652,767 |
| සමුච්චිත අරමුදල්/ අතිරික්කය | 17 | 328,680,365 | 71,276,602 | 334,956,888 | 99,813,314 | 834,727,169 |
| | | **906,132,298** | **123,718,312** | **334,956,888** | **99,813,314** | **1,464,620,812** |

අංක 11-13 පිටුවල ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති සහ 14-29 පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හිම ඒකාබද්ධ කොටසකි. මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් උසුලන ලබයි.. මූල්‍ය පකාශන 2022.02.05 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී. .

එම්. පී සන්ධ්‍යා කාන්ති
අධ්‍යක්ෂ මූල්‍ය

ඒ වී කේ මාධවී හේරත්
සභාපති

එස් පී විතානගේ
අධ්‍යක්ෂ ජනරාල්
25/02/2022

ආර් පී කස්තුරිආරච්චි
අධ්‍යක්ෂක

## *පොල් සංවර්ධන අධිකාරිය*

### *ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (සාරාංශගත)*

| | ***2021*** | ***2020*** |
|---|---|---|
| | *රු.* | *රු.* |
| ***ආදායම*** | | |
| *රජයේ ප්‍රදාන (පුනරාවර්තන)* | *134,500,000* | *165,000,000.00* |
| *රජයේ ප්‍රදාන (ප්‍රාග්ධන)* | *7,000,000* | *49,250,000* |
| | | |
| ***අනෙකුත් ආදායම්*** | | |
| *පොලී ආදායම්* | *42,550,594* | *53,982,834* |
| *කුලී ආදායම්* | *211,200* | *168,000* |
| *ලියාපදිංචි ගාස්තු* | *23,910,612* | *25,607,725* |
| *වෙන්දේසි පරිපාටි* | *1,085,454* | *631,492* |
| *රසායනාගාරයේ ආදායම්* | *25,048,632* | *16,085,831* |
| *විවිධ ආදායම්* | *4,666,946* | *4,498,971* |
| *පරීක්ෂා කිරීමේ සහ සැකසුම් ගාස්තු- නැවුම් පොල්* | *43,521,769* | *49,637,514* |
| *පරීකන්ෂා කිරීමේ සහ සැකසුම් ගාස්තු- තැඹිලි* | *60,197,894* | *35,052,305* |
| *ආපසු එවන ලද □පනයන මත ගාස්තු/ටීප් ගාස්තු/ප්‍රදර්ශන කුටි ගාස්තු* | - | *1,177,500* |
| *බී සී සී ණය මත පොලී* | *4,011,609* | *4,011,609* |
| *□බලි ද්‍රව්‍ය /යන්ත්‍රෝපකරණ □ලෙවිය* | *97,598* | - |
| *දුන්කන්නාව පොල් වත්න සහ මොඩර්න් මෝල* | *1,874,131* | *99,965* |
| ***මුළු අනෙක් ආදායම්*** | ***207,176,439*** | ***190,953,746*** |
| ***මුළු අආදායම්*** | *348,676,439* | *405,203,746* |
| | | |
| ***මුළු ශුද්ධ ආදායම*** | ***348,676,439*** | ***405,203,746*** |
| ***වියදම*** | | |
| *පුද්ගල පාරිශ්‍රමික* | *(149,163,624)* | *(137,555,593)* |
| *ගමන් වියදම්* | *(2,744,795)* | *(3,412,211)* |
| *සැපයුම් සහ □වශ්‍යතා* | *(31,914,415)* | *(27,537,702)* |
| *□ත්වැඩියා සහ නඩත්තු* | *(14,890,050)* | *(12,132,699)* |
| *කොන්ත්‍රාත් සේවා සහ වෙනත්* | *(29,232,476)* | *(26,484,212)* |
| *බදු සහ වෙනත්* | *(4,869,920)* | *(6,387,629)* |
| *මූල්‍ය ගාස්තු* | *(18,000)* | *(23,218)* |
| *□බලි ද්‍රව්‍ය /යන්ත්‍රෝපකරණ □ලෙවිය* | - | *(23,588)* |
| *සැකසුම් සංවර්ධන. - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන* | *(61,372,453)* | *(27,307,750)* |
| *□ලෙවි සංවර්ධන - ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන* | *(21,041,206)* | *(9,436,712)* |
| *නත්ව පාලන සහ නත්ව සහනික කිරීම්- ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන* | *(14,512,391)* | *(415,736)* |
| මිලදී ගත් ස්ථාවර වත්කම් වෙත මාරු කිරීම් | *13,570,398* | |
| | ***(316,188,932)*** | ***(250,717,051)*** |
| *මෙහෙයුම් ලාභය* | ***32,487,507*** | ***154,486,695*** |
| *වසරේ ක්ෂය කිරීම්* | *(40,511,315)* | *(41,201,537)* |
| *මායිම් නාප්පය ඉදිකිරීමේ පිරිවැය සහ පල්දෝරු පද්ධතිය □ත්වැඩියා කිරීමේ පිරිවැය පොත්වලින් කපා හැරීම* | *(437,692)* | *(437,692)* |
| *ඒකාබද්ධ □රමුදලට මාරු කරන ලද ආයතනයේ නාවකාලික □ධිභාර භාරකාර □රමුදල* | - | *(93,228,592)* |
| *පාරිතෝෂික වෙනුවෙන් □ධි/ □ව ප්‍රතිපාදන* | *(6,472,629)* | *2,586,764* |
| *බී සී සී ලංකා සමාගම වෙත දෙන ලද ණය වෙනුවෙන් කරන ලද □ඩමාන පොලී ප්‍රතිපාදන* | *(4,011,609)* | *(4,011,609)* |
| | ***(18,945,738)*** | ***18,194,029*** |

□ක 11-13 පිටුවල ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති සහ 14-29 පිටුවල ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හිම ඒකාබද්ධ කොටසකි.
මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම □ධ්‍යක්ෂක මණ්ඩලය විසින් උසුලනු ලබයි.. මූල්‍ය ප්‍රකාශන 2022.02.05 දින □ධ්‍යක්ෂ මණ්ඩලය විසින් □නුමත කරනු ලදුව ඔවුන් වෙනුවෙන් □ත්සන් තබන ලදී.

**එම්. පී සන්ධ්‍යා කාන්ති**
**අධ්‍යක්ෂ මූල්‍ය**

**ඒ වී කේ මාධවී හේරත්**
**සභාපති**

**එස් පී විතානගේ**
**අධ්‍යක්ෂ ජනරාල්**
25/02/2022

**ආර් පී කස්තුරිආරච්චි**
**අධ්‍යක්ෂක**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (අරමුදල් අනුව විශ්ලේෂිත)**

| වසර | 2020 | | | | |
|---|---|---|---|---|---|
| | පොදු මණ්ඩල මෙහෙයුම් රු | ප්‍රාග්ධන සං අරමුදල රු | පී එස් එස් කෙල් අරමුදල රු | මෝල් සංවර්ධන අරමුදල රු | එකතුව රු |
| ආදායම් | | | | | |
| රජයේ ප්‍රදාන (පුනරාවර්තන) | 165,000,000 | - | - | - | 165,000,000 |
| රජයේ ප්‍රදාන (ප්‍රාග්ධන) | 49,250,000 | - | - | - | 49,250,000 |
| රජයේ ප්‍රදාන වෙත මාරුකිරීම්(ප්‍රාග්ධන) | (40,250,000) | 40,250,000 | - | - | - |
| | | | | | - |
| **අනෙකුත් ආදායම්** | | | | | - |
| පොලී ආදායම් | 27,013,800 | 3,462,254 | 17,531,802 | 5,974,978 | 53,982,834 |
| කුලී ආදායම් | 168,000 | - | - | - | 168,000 |
| ලියාපදිංචි ගාස්තු අලෙවි අංශය | 25,607,725 | - | - | - | 25,607,725 |
| ලියාපදිංචි ගාස්තු සැකසුම් අංශය | | | | | |
| ලියාපදිංචි ගාස්තු පරිපාලන අංශය | | | | | |
| M 86 | ජේ පී එම් පින්ටෝ ඇන්ඩ් කම්පැණි පුද් සමාගම, නව මාඉ | 32,500 | 47,500 | 11,390 | 91,390 |
| M 89 | කුඩාවැව මිල්ස් කුඩාවැව | 39,634 | 42,500 | | 82,134 |
| M 90 | නැදුන්ගමුව මිල්ස් නැදුන්ගමුව | - | 48,750 | | 48,750 |
| M 91 | සඳලංකා ඩී සී මිල්ස් | - | 66,250 | 11,360 | 77,610 |
| M 93 | ග්‍රීන් ෆාර්ම් මිල්ස්, කලුඅරිජ්පුව කටාන | 127,158 | | | 127,158 |
| M 94 | සිරිකත ඩී සී මිල්ස් කොව්විකඩේ | 33,750 | | | 33,750 |
| M 98 | සෙරන්ඩිබ් සුපර් ෆුඩ් පුද් සමාගම | 170,914 | 241,250 | | 412,164 |
| M 102 | එන් එම් කේ කොකෝ ලෑන්ඩ් පුද් සමාගම | 66,250 | 51,250 | | 117,500 |
| M 102 | නාරා කොකෝ ලෑන්ඩ්ස් | - | 63,750 | | 63,750 |
| M 103 | සෙන්ට් තෙරේසා ඩී සී මිල්ස්, කටාන | 1,250 | 152,500 | 11,180 | 164,930 |
| M 105 | ඩී වයි ඇන්ඩ් ඩී යූ රාජපක්ෂ පුද් සමාගම, හේනෙගම ඩී සී | 41,250 | 40,000 | | 81,250 |
| M 111 | කුඩ්ඩිරුප්පු කොකනට් ප්‍රොඩ්යුසර්ස්, පුද් සමාගම | - | 92,500 | 11,828 | 104,328 |
| M 113 | බැලුම්මහර ඩීසී මිල්ස්, බැලුම්මහර මුදුන්ගොඩ | 75,000 | 50,000 | 10,852 | 135,852 |
| M 114 | නාත්තණ්ඩිය මිල්ස් | 38,750 | 57,500 | 23,188 | 119,438 |
| M 115 | බෝගමුව ඩී සී මිල්ස්, අලුත්ගම, බෝගමුව, අලුත්ගම | 4,724 | 48,750 | | 53,474 |
| M 119 | මාතම්මන ඩීසී මිල්ස් මිනුවන්ගොඩ | 38,750 | 60,000 | 11,076 | 109,826 |
| M 120 | කටාන ඩීසී ඇන්ඩ් ඔයිල් මිල්ස්, නයිනමඩම | 47,500 | 41,250 | | 88,750 |
| M 122 | ශාන්ත ජෝශප් ඩීසී ඇන්ඩ් ෆයිබර් මිල්ස්, කටාන | 25,000 | 41,250 | | 66,250 |
| M 126 | ලක්ෂ්මී ඩී සී මිල්ස්, බටකන්ද බඩල්ගම | - | 53,750 | | 53,750 |
| M130 | බෝයගනේ ඩීසී මිල්ස් පුද් සමාගම බෝයගනේ කුරුණෑගල | 79,588 | 153,750 | 12,088 | 245,426 |
| M 131 | ජයකොඩි මිල්ස් පුද් සමාගම නාත්තන්ඩිය පාර දංකොටුව | 9,962 | 58,750 | | 68,712 |
| M 133 | උපාලි ඩී සී මිල්ස් තලවිල මාරවිල | 6,250 | | 11,580 | 17,830 |
| M 134 | ගුණවර්ධන ඩීසී මිල්ස්, ගලවත්ත කටාන | - | 46,250 | 11,024 | 57,274 |
| M 136 | වෙල්වින් ඩී සී මිල්ස් පුද් සමාගම මිනුවන්ගොඩ | 38,600 | | | 38,600 |
| M 139 | සංහිඳ ඩීසී මිල්ස් පුද් සමාගම | 25,000 | 51,250 | | 76,250 |
| M 145 | දූනගහ පොල් නිපැයුම්කරුවන්ගේ සමූපකාර සමිතිය දූනගහ | 5,000 | 37,500 | | 42,500 |
| M 148 | ආර් එම් පී කොකනට් ප්‍රොඩක්ට් පුද් සමාගම | 11,146 | | | 11,146 |
| M 149 | මවික්ශෙල් ඉන්ටර්නැෂනල් කොම් පුද් සමාගම | - | 186,250 | 13,560 | 199,810 |
| M 150 | එන්ඩී සී එක්ස්පෝර්ට්ස් පුද් සමාගම | - | 45,000 | | 45,000 |
| M 151 | වයඹ ඩී සී ඇන්ඩ් ඔයිල් මිල්ස් පුද් සමාගම | - | 32,500 | | 32,500 |
| M 152 | සන්මික් ෆුඩ් පුද් සමාගම | 65,990 | 181,250 | | 247,240 |
| M 153 | නවික් මිල්ස් පුද් සමාගම | 11,250 | 7,500 | | 18,750 |
| M 155 | වගුරුවෙල ඔයිල් මිල්ස් | - | 10,000 | | 10,000 |
| M 156 | වී එස් එස් ප්‍රොඩක්ට් පුද් සමාගම | 11,250 | | | 11,250 |
| M 157 | මෙට්ෂු එක්ස්පෝර්ට්ස් පුද් සමාගම | - | 7,500 | | 7,500 |
| M 158 | වනසිංහ හොල්ඩිංග්ස් පුද් සමාගම | - | 53,750 | | 53,750 |
| | | **1,321,138** | **3,597,500** | **185,830** | **5,104,468** |

**2021. 12. 31** දිනටණයගැතියෝ-නැවුම පොල් සහ
කොප්පරා තොග ගාස්තු සහ කිරි නිෂ්පාදන

| | කොප්පරා | ප්‍රමාණය රු |
|---|---|---|
| | **නැවුම් පොල් වෙන්දේසි ගාස්තු** | |
| 1 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 188,726.33 |
| 2 | හලාවත වැවිළි සමාගම | (0.21) |
| 3 | පොල් පර්යේෂණ ආයතනය | 114,074.99 |
| 4 | පොල් වගාකිරීමේ් මණ්ඩලය | 116,133.82 |
| 5 | කුරුණෑගල වැවිළි සමාගම | 33,646.36 |
| 6 | ඇල්කඩුව වැවිළි සමාගම | 119,886.03 |
| 7 | යාග්‍රෝ පුද් සමාගම | 811.63 |
| 8 | දික්ලන්ද වතුයාය | 6,705.00 |
| 9 | එච් එල් ඩී මෙල් සහ සමාගම | 34,700.01 |
| 10 | ලාලන රබර් පුද් සමාගම | 61,139.93 |
| 11 | මැදගම්පොල වතුයාය | 1,384.98 |
| 12 | කෑගල්ල වැවිළි සමාගම | 4,275.00 |
| 13 | සී ඇන්ඩ් ජේ මැතිව් | 39,919.00 |
| 14 | සී දිපාල් මැතිව් මහතා | 1,398.00 |
| 15 | පොල් කනත්ත වත්ත | 128.00 |
| 16 | පී පී ගුණසේකර | 117.47 |
| 17 | මරදන්විල | 33,870.18 |
| 18 | පොල්ට්‍රි ඩිවලොප්මන්ට් කම්පැණි | 1,147.50 |
| | **Total** | **758,064.02** |

| | | පොල් කිරි නිපැයුම් **2021.12.31** | | |
|---|---|---|---|---|
| | | | **2021** | **Total** |
| | **නම** | | ප්‍රමාණය රු | ප්‍රමාණය රු |
| 1 | සී බී එල් ග්ලෝබල් ෆුඩ් ලිමිටඩ් | 6,000.00 | 24,840.00 | 30,840.00 |
| 2 | කොන්සොලිඩේටඩ් බිස්නස් සිස්ටම් | 18,000.00 | 37,750.00 | 55,750.00 |
| 3 | ජායින්දි එක්ස්පෝර්ට් පුද් සමාගම | 6,000.00 | 65,458.00 | 71,458.00 |
| 4 | කන්දෙකැටිය ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස් | 6,000.00 | 74,800.00 | 80,800.00 |
| 5 | මන්වි ඩි කොකෝ ප්‍රොඩක්ට්ස් | 18,000.00 | 44,407.00 | 62,407.00 |
| 6 | මාස් ට්‍රොපිකල් ෆුඩ් ප්‍රොසෙසින් පුද් සමාගම | 18,000.00 | 46,207.00 | 64,207.00 |
| 7 | එන් ඩී සී එක්ස්පෝර්ට්ස් පුද් සමාගම | 18,000.00 | 81,348.00 | 99,348.00 |
| 8 | නෙක්ස්පෝ කන්වර්ෂන් පුද් සමාගම | 6,000.00 | 6,900.00 | 12,900.00 |
| 9 | රේනුකා ඇග්‍රි ෆුඩ්ස් | 18,000.00 | 77,901.00 | 95,901.00 |
| 10 | සිල්වර් මිල් නැවුරල් බෙවරේජස් | 6,572.61 | | 6,572.61 |
| 11 | සන්මික් ෆුඩ්ස් පුද් සමාගම | 18,000.00 | 63,901.00 | 81,901.00 |
| 12 | වඟුරුවෙල තෙල් මෝල | 6,000.00 | 98,292.00 | 104,292.00 |
| 13 | විවී වැවිළි සමාගම | 572.61 | 81,348.00 | 81,920.61 |
| 14 | ශාන්ත් ආනා කම්හල | | 16,974.00 | 16,974.00 |
| 15 | බත්තුලුඔය | | 25,461.00 | 25,461.00 |
| 16 | බයෝ ෆුඩ් | | 31,540.00 | 31,540.00 |
| 17 | හලාවත | | 9,650.00 | 9,650.00 |
| 18 | ඉයෝස් | | 26,310.00 | 26,310.00 |
| 19 | ගිරිඋල්ල මෝල | | 50,301.00 | 50,301.00 |
| 20 | මෙට්ෂූ | | 6,210.00 | 6,210.00 |
| 21 | නාරා කොකෝ | | 67,141.00 | 67,141.00 |
| 22 | නවික් මිල්ක් | | 26,624.00 | 26,624.00 |
| 23 | නෙස්ලේ | | 34,300.00 | 34,300.00 |
| 24 | නියුට්‍රිබල් ට්‍රේලර්ස් | | 27,607.00 | 27,607.00 |
| 25 | ශාන්ත ජෝශප් | | 29,394.00 | 29,394.00 |
| | | **145,145.22** | **1,054,664.00** | **1,199,809.22** |

**පොල් සංවර්ධන අධිකාරිය**
**පුනරාවර්තන වියදම්**

රු

| 2020 | 2021 ඇස්තමේන්තුව | විස්තරය | උප එකතුව | 2021 |
|---|---|---|---|---|
| | | | | එකතුව |
| රු | | **පුද්ගල ඉපයුම්** | | රු |
| *84,192,276.19* | 87,000,000.00 | වැටුප් සහ වේතන | 87,499,393 | |
| *18,172,889.42* | 19,200,000.00 | ජීවන වියදම් සහ වෙනත් දීමනා | 18,282,126 | |
| - | | වැඩ බැලීමේ දීමනා | 148,496 | |
| *188,367.00* | 500,000.00 | නිවාඩු දින වැටුප් | 242,138 | |
| *18,343,954.37* | 21,240,000.00 | සේ හා අරමුදල සහ සේ නි හා අරමුදල | 18,845,152 | |
| *646,408.12* | 4,000,000.00 | ඉන්ධන දීමනා | 1,454,250 | |
| *1,334,697.64* | 7,000,000.00 | විශේෂ දීමනා | 1,152,600 | |
| | | දුරකථන ගාස්තු | 2,640,119 | |
| | | වාහන දීමනා | 250,000 | |
| | | භාෂා/ අතුරු දීමනා | 20,972 | |
| *7,376,178.04* | 6,000,000.00 | අතිකාල | 9,570,872 | |
| *2,025,820.00* | 4,500,000.00 | සුභසාධන වියදම් | 2,718,840 | |
| *353,140.50* | 2,000,000.00 | පුහුණු සහ සම්මන්ත්‍රණ | 487,420 | |
| *4,921,861.29* | 6,000,000.00 | රක්ෂණ- වෛද්‍ය | 5,210,450 | |
| | | නව බඳවා ගැනීම් සඳහා වියදම් | 640,796 | **149,163,624** |
| ***137,555,592.57*** | | | | |
| | | **ගමන් වියදම්** | | |
| *3,124,211.33* | 6,000,000.00 | ගමන් වියදම් දේශීය) | 2,493,595 | |
| *288,000.00* | | වාහන ගාල් කිරීමේ ගාස්තු | 251,200 | 2,744,795 |
| ***3,412,211.33*** | | | | |
| | | **සැපයුම් සහ අවශ්‍යතා** | | |
| *7,082,725.89* | 6,000,000.00 | ලිපිද්‍රව්‍ය සහ වෙනත් අවශ්‍යතා | 10,689,784 | |
| | | ලේබල් පොත් සහ ස්ටිකර් මුද්‍රණය | | |
| | | මාසික පත්‍රිකා මුද්‍රණය | | |
| *4,396,084.42* | 8,924,000.00 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 5,778,427 | |
| *537,870.02* | 900,000.00 | නිල ඇඳුම් | 483,999 | |
| *13,927,698.89* | 7,250,000.00 | රසායනාගාර රසායන ද්‍රව්‍ය සහ වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | 14,962,205 | |
| - | | විදුරු බඩු | | |
| *1,593,323.07* | | වෙනත් අවශ්‍යතා | | |
| - | | සාමාජික ගාස්තු (වාර මුදල්) | | 31,914,415 |
| ***27,537,702.29*** | | | | |
| | | **අළුත්වැඩියා සහ නඩත්තු** | | |
| *2,987,871.32* | **3,000,000.00** | ගොඩනැගිලි/ව්‍යුහ | 3,155,654 | |
| *1,375,748.54* | | ආදිපාද වීදිය | | |
| *2,429,598.88* | 3,000,000.00 | යන්ත්‍ර කාර්යාල උපකරණ සහ ලී බඩු | 2,505,990 | |
| *5,339,480.53* | 5,000,000.00 | මෝටර් වාහන | 9,228,406 | 14,890,050 |
| ***12,132,699.27*** | | | | |
| | | **ප්‍රවාහන සන්නිවේදන ප්‍රයෝජ්‍ය සහ වෙනත් සේවා** | | |
| *2,530,590.73* | 5,100,000.00 | සන්නිවේදන | 1,727,777 | |
| *1,209,382.12* | **2,500,000.00** | ප්‍රවාහන | 3,968,790 | |
| *3,718,960.00* | **3,600,000.00** | ආරක්ෂක සේවා | 3,881,250 | |
| *2,919,946.20* | 3,650,000.00 | **පවිත්‍රතා සේවා** | 3,585,361 | |
| *8,711,062.00* | 8,760,000.00 | වාහන කල්බදු කුලී | 7,845,092 | |
| *4,727,530.91* | 5,200,000.00 | විදුලිය | 4,865,435 | |
| *547,530.94* | 800,000.00 | ජලය | 787,869 | |
| *1,340,138.04* | 2,000,000.00 | වරිපනම් සහ බදු | 1,333,872 | |
| - | 600,000.00 | නීති ගාස්තු | 7,500 | |
| *245,875.80* | 300,000.00 | තැපැල් සහ මුද්දර ගාස්තු | 206,439 | |
| *500,000.00* | 900,000.00 | විගණන ගාස්තු | 985,872 | |
| *33,195.50* | 66,000.00 | බැංකු ගාස්තු | 37,219 | 29,232,476 |
| ***26,484,212.24*** | | | | |
| | | **බදු සහ වෙනත් ගෙවීම්** | | |
| *966,453.89* | | ආර්ථික සේවා ගාස්තු | 590,027 | |
| *411,211.59* | | වැට් බදු | | |
| *6,625.00* | | මුද්දර ගාස්තු | 7,125 | **597,152** |
| ***1,384,290.48*** | | | | |
| | | වෙනත් | | |
| *710,179.07* | 3,250,000.00 | **රක්ෂණ** | 837,737 | |
| *100,000.00* | 100,000.00 | සභාපතිගේ සංග්‍රහ වියදම් | 102,143 | |
| *956,979.90* | 2,050,000.00 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනා සහ මණ්ඩල රැස්වීම්වියදම් | 1,110,779 | |
| *2,655,330.63* | 400,000.00 | වෙළඳපල ප්‍රවර්ධන/ වෙළඳ දැන්වීම් | 1,119,149 | |
| *560,847.75* | | කෝවිඩ් වැලැක්වීමේ වියදම් | 253,451 | |
| *20,001.32* | | වෙනත් වියදම් | 651,103 | |
| | | හම්බන්තොට ව්‍යාපෘතිය- මූලික වියදම් | 198,406 | 4,272,768 |
| ***5,003,338.67*** | 5,800,000.00 | | | |
| ***213,510,046.85*** | 236,790,000.00 | **මුළු වියදම** | | **232,815,281** |

# 06. අභ්‍යන්තර විගණන අංශය

2021 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම, අධිකාරියේ ක්‍රියාකාරී අංශ වන සැකසුම් සංවර්ධන අංශය, අලෙවි සංවර්ධන හා ආර්ථික පර්යේෂණ අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයන්හි ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි සහ ඊට අමතරව පරිපාලන අංශය සහ මුදල් අංශ වල කටයුතු ආවරණය වන ආකාරයට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ භාණ්ඩාගාරයේ නියෝජිත මහත්මියගේ උපදෙස් පරිදි සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, අනුමත කල විගණන සැලැස්ම පරිදි විගණන පරීක්ෂාවන් සිදුකර වාර්තාවන් 12 ක් ඉදිරිපත් කරන ලදී. කළමනාකාරිත්වය විසින් පවරන ලද විශේෂ විමර්ශනයක් වර්ෂය තුල සිදුකරන ලද අතර, මෙම විමර්ශණයට අදාළ වාර්තාව වර්ෂය තුල සිදුකර කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර ඇත.

## 6.1 විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

### 6.1.1 සංයුතිය සහ ගණපූර්ණය

රාජ්‍ය ආයතනවල යහපාලනයට අදාළ මාර්ගෝපදේශ අත්පොත නමින් වූ 2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 4.7.1 දරණ පරිච්ඡේදය සහ 2010.12.04 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/55 ප්‍රකාරව පොල් සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා, එම චක්‍රලේඛ විධිවිධාන අනුව එම කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම සිදුකෙරේ. විගණන හා කළමනාකරණ කමිටු මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචනයට බඳුන්වන වර්ෂයෙහිදී පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

**2021.03.17දින පැවති 2021/01 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යාංශ නියෝජිත(කමිටු සභාපති)
2. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය -භාණ්ඩාගාර නියෝජිත
3. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා -සාමාජික
4. උපාලි ධම්මික ද සිල්වා මයා -සාමාජික

**2021.12.01දින පැවති 2021/02 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය -භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති)
2. ආර්.පී කස්තුරි ආරච්චි මිය -අමාත්‍යාංශ නියෝජිත
3. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා -සාමාජික

**2021.12.29දින පැවති 2021/03 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය -භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති)
2. ආර්.පී කස්තුරි ආරච්චි මිය -අමාත්‍යාංශ නියෝජිත
3. ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා -සාමාජික

විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු 2021 වර්ෂයේ පවත්වන ලද සියළුම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සියළුම රැස්වීම් සඳහා සහභාගී වී ඇත. කමිටුවෙහි, කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරාධනයෙන් රැස්වීම සඳහා සහභාගි වේ. කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගීත්වය කමිටුවට අවශ්‍ය වූ විට, රැස්වීම සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලබයි. කමිටුවෙහි ගණපූර්ණය සාමාජිකයින් 03 කි.

## 6.2 කමිටුවෙහි කාර්යය භාරය

- පූර්ව අවසාන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය කරමින් කමිටු උපදෙස් සහ නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳ විමසා බැලීම.

- ආකෘති සහ අන්තර්ගතය සමාලෝචනය කිරීම සහ පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම.

- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මුලිකත්වය හා සඵලදායකත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.

- අභ්‍යන්තර පාලනයන්හි යෝග්‍යතාවය සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.

- නියාමන සහ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමඟ අනුගත වීම සහ අදාළ නියාමන අධිකාරීන් සමඟ පවත්නා සම්බන්ධතා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියාපරිපාටීන් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 6.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුල තුන්වරක් (03) කමිටුව හමුවන ලදී. රැස්වීම සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගී වූ ගණන |
|---|---|
| අයි.ටී. නිමේෂා මෙන්ඩිස් මිය | 03 |
| එන්.එස් වනසිංහ මයා (2021-01) | 01 |
| ආර්.පී කස්තුරි ආරච්චි මිය | 02 |
| ප්‍රියලත් කිඹියහෙට්ටිගේ මයා | 03 |
| උපාලි ධම්මික ද සිල්වා මයා | 01 |

වගුව 33 -ප්‍රගති සමාලෝචන රැස්වීම්

සමාලෝචිත වර්ෂය කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

### 6.3.1 අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු වලට අදාළව 2021 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සැළකිල්ලට ගනිමින් පිළියෙල කරනු ලැබූ අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම සාකච්ඡාවට භාජනය කර, වැඩිදුරටත් විගණනයට භාජනය කලයුතු ක්ෂේත්‍රයන් පිළිබඳ උපදෙස් දීම සහ විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම මණ්ඩලීය අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
- 2021 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායකත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අභ්‍යන්තර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ ප්‍රගතිය ඇගයීම.
- අනාගතයේදී නැවත සිදුවීම් වලක්වනු පිණිස කාලීන නිරවද්‍ය පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයාගැනීම් හා ඒවා සඳහා කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.

### 6.3.2 බාහිර විගණනය

- 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලට අදාළව පිළිතුරු යැවීමේ ප්‍රගතිය ඇගයීම සහ කළමනාකරණය විසින් දක්වන ලද පිළිතුරු සමාලෝචනයට ලක් කරන ලද අතර, විශේෂයෙන් පෙන්වාදෙන ලද ගැටළු නැවත ඇති වීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී. 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 2018 අංක 19 දරණ විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර වාර්තාව මඟින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ කමිටුව විසින් අවධානය යොමුකල අතර, එම කරුණු වලට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් සිදුකර ඇත.
- 2021.01.21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කමිටු රැස්වීමේදී ලබාදී ඇති නිර්දේශ පිළිබඳව සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව කමිටුව විසින් අවධානය යොමු කොට ඇති අතර, ඒවා සම්බන්ධව පසු විපරම් කටයුතු සිදුකරන ලදී.

### 6.3.3 මූල්‍ය වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නියම කරන ලද අවශ්‍යතාවයන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරීමේදී මණ්ඩලයට සහයවන ලදී.

### 6.3.4 රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම්

- කමිටු පැවැත්වීම පිළිබඳ යෝග්‍ය රැස්වීම් වාර්තා මණ්ඩලීය ලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලැබේ. රැස්වීම්වල සියළුම වාර්තා සභාගත කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සම්මත කර ගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගනු ලැබේ. ක්‍රමික පදනමක් මත කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනු ලැබේ. අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ඇත.

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. PAL/F/CDA/01/2021/45 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 අගෝස්තු 31 දින

සභාපති

පොල් සංවර්ධන අධිකාරිය

**පොල් සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

පොල් සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්පීත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළ හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර නිබුණු මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත ආදායම හා ආදායම් විවලනය සඳහන් කර නොතිබුණි.

(ආ) සමුච්චිත අතිරික්තයට ගලපන ලද පෙර වර්ෂ ගැලපීම් රු.1,474,281 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයට ගලපා තිබීමත්, මාස 03 න් කල් පිරෙන රු.376,499,131 ක ස්ථාවර තැන්පතු 20 ක්, රු.11,237,375 ක භාණ්ඩාගාර බිල්පත් 06 ක් සහ රු.71,963,410 ක ඉතුරුම් ගිණුම් 03 ක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස නොදක්වා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි නියමයන්ට අනුකූල ලෙස පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පිරිවැය රු.88,827,013 ක් වූ රසායනාගාර උපකරණ සහ යන්ත්‍රෝපකරණ දැනටමත් භාවිතයට ගනිමින් පැවතිය ද එම වත්කම්වල ඵලදායී ජීවිතකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතා කිරීමට අරමුණු කරගත් කාර්යය සඳහා යෙදවීම ආරම්භ කළ විට එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, 2011 ත් 2018 ත් අතර කාලය තුළ මිලදීගෙන අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොතිබුණු HPLC උපකරණය ඇතුළුව පිරිවැය රු.17,714,910 ක් වූ උපකරණ 12 ක් මිලදීගත් වර්ෂයේ සිට වාර්ෂිකව සියයට 20 ක් බැගින් ක්ෂය කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට භාවිතයට නොගත් යන්ත්‍ර උපකරණ 08 ක අගය ශූන්‍ය වී තිබුණු අතර වත්කම් හා සමුච්චිත අතිරික්තය රු.12,577,364 ක් බැගින් අඩුවෙන් ද, වියදම රු. 3,205,365 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 33 ඡේදය ප්‍රකාරව ගනුදෙනුව හා ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතා අස්ථිත්වයට ගලා එන බවට භව්‍යතාවයක් ඇති විට හා අයභාරයේ ප්‍රමාණය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට ඒවා පොලී ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත්, වසර 36 ක් තිස්සේ අය නොවන බී.සී.සී. ලංකා සමාගමේ රු. 26,715,037 ක ණය ශේෂය සඳහා වාර්ෂිකව රු.4,011,609 ක් බැගින් පොලී ආදායමක් ගණනය කර එම වටිනාකම් අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණ කිරීමටත්, ණය ශේෂය සඳහා වන හානිකරණ අගය වෙනුවෙන් අවශ්‍ය ගැලපීම් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) වටිනාකම් රහිතව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණු දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ පවත්නා යන්ත්‍රෝපකරණ 16 ක්, පරිගණක හා උපාංග 17 ක්, ලී බඩු උපකරණ 04 ක් හා වෙනත් වත්කම් 65 ක් ඇස්තමේන්තු කර ගිණුම්වලින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝජන ද්‍රව්‍ය පිළිබඳ භෞතික තොග සමීක්ෂණයක් සිදුකර තිබුණු නමුත් එම වාර්තාවේ ඇතුළත් තොග අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පෙර ලැබීම් පෙර නිකුත් කිරීම් (FIFO) ක්‍රමයට අගය කර මූල්‍ය

ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පොත් අනුව ශේෂය වූ රු.21,501,463 ක නිවැරදිකාවය සනාථ කරගත නොහැකි විය.

(උ) ප්‍රධාන කාර්යාල ගබඩාවේ තොගයෙන් ඉවත් කර අදාළ අංශවලට නිකුත් කළ රු.2,962,845 ක් වටිනා ස්ටිකර් 1,649,010 ක් හා වර්ග 105 කට අයත් රු.8,427,201 ක් වටිනා රසායන ද්‍රව්‍ය, වීදුරු උපකරණ හා මාධ්‍ය උපකරණ තොග 2021 දෙසැම්බර් 31 දිනට එම අංශයන්හි ඉතිරි වී තිබුණු නමුත් ඒවා භෞතිකව සමීක්ෂණය කර තොගයට ගැලපීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් රු.11,390,046 කින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොගය අඩුවෙන් ද, වියදම් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(එ) රසායන වර්ග 11 ක් කේත කිපයක් යටතේ ගබඩා දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති බවට ගබඩා ලෙජර් ගිණුම් හා භෞතික තොග සමීක්ෂණ වාර්තා නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වීමෙන් එම රසායනික ද්‍රව්‍යයන්හි තොග ලැබීම් හා නිකුත් කිරීම් නිවැරදිව ගිණුම්ගත නොවන බවට නිරීක්ෂණය විය.

(ඒ) දිසිදි පොල් මෝල් හිමියන්ට සේවා සැපයීම හා මුදල් අය කිරීම සඳහා ඉන්වොයිස් නිකුත් කර නොතිබීම, ණයගැති ලෙජරයක් හා ණයගැති පාලන ගිණුමක් පවත්වා නොතිබීම, මුදල් අයකර ගැනීමේ නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම, බැංකුවට සෘජුව බැර කරන මුදල් හඳුනා ගැනීමේ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් නොතිබීම යනාදී කරුණු අනුව විකුණුම් හා ණයගැතියන් සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් පවතින බවටත්, ණයගැතියන් හා ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකර ඇති බවටත් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ආදායම රු.11,057,590 ක් ද, ණයගැති ශේෂය රු.5,104,468 ක් ද වූ අතර ආදායම රැස් කරන අංශය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව එම ආදායම රු.9,794,902 ක් ද, ණයගැති ශේෂය රු.4,377,852 ක් ද විය.

(ඔ) මූල්‍ය ප්‍රකාශනවල "Receipt In Advance" වශයෙන් ජංගම වගකීම් යටතේ පැවති රු.2,391,232 ක හඳුනා නොගත් ශේෂ අතරින් පිළිවෙලින් රු.335,750 ක්, රු.460,627 ක් හා රු.912,000 ක් වශයෙන් එකතුව රු.1,708,377 ක් 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළව ගනුදෙනුකරුවන් විසින් කෙලින්ම බැංකුවේ තැන්පත් කරන ලද පරීක්ෂණ ගාස්තු හා ලියාපදිංචි ගාස්තු ආදායම් බවට නිරීක්ෂණය විය. එසේ වුවත් මෙම ශේෂයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබීම හේතුවෙන් රු.1,708,377 කින් ජංගම වගකීම් වැඩියෙන් දැක්වුණු අතර සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 460,627 කින්, සමුච්චිත අතිරික්තය රු.335,750 කින් හා ඉදිරියට ලැබීම් රු.912,000 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඕ) ණයහිමියන් 20 දෙනෙකුට ගෙවිය යුතු රු.70,527,249 ක් හා ණයගැතියන් 92 ක ගෙන් අයවිය යුතු රු.15,236,329 ක් සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කර නොතිබීමෙන් එම ශේෂවල නිවැරදිකාවය සහ පැවැත්ම පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තව දුරටත් විස්තර කොට ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 පොල් සංවර්ධන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත්අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් පොල් සංවර්ධන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝමතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහවංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පොල් සංවර්ධන අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පොල් සංවර්ධන අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම්

තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පොල්පොල් සංවර්ධන අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2(අ), (ඇ), (ඉ), (ඊ), (උ) හා (ඒ) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණනපනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති විධානයට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (ආ) වගන්තිය, 2004 ජූනි 29 දිනැති අංක 25 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2006 ජූනි 27 දිනැති අංක PE/PE/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යවසායන්හි මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 40 ක ආයෝජිත රු.739,847,663 ක් සඳහා එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 හා 13.7 ඡේද | පුරප්පාඩු වී ඇති තනතුරක් සඳහා පූර්ණ කාලීන නිලධාරියෙකු නොපමාව පත් කළ යුතු අතර, රාජකාරී ආවරණය කිරීමේදී එම නිලධාරියාට අතිරේක පරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නොමැත. එසේ වුවද, අධිකාරියේ අධ්‍යක්ෂ (පරිපාලන) ඇතුලු තනතුරු 03 ක රාජකාරී ආවරණය කිරීම සඳහා නිලධාරීන් 03 දෙනෙකු වසර 02 යි මාස 03 ක්, වසර 02 යි මාස 08 ක් හා වසර 03 යි මාස 04 ක සිට පත් කර ඒ සඳහා මාසයකට රු.29,201 ක් බැගින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.924,220 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ. 371 | ලබාගත් අතුරු අග්‍රිම අදාළ කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 18 කදී නිලධාරීන් 15 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.801,990 ක අත්තිකාරම් පියවීමට දින 30 ත් 246 ත් අතර කාලයක් ගත කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ **හැර** අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත ප්‍රකාරව "දිසිදි" පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා, අපනයනය කරනු ලබන සෑම දිසිදි පොල් කි. ග්‍රෑ 1 ක් වෙනුවෙන් ශත 20 ක් බැගින් සෙස් අරමුදලින් ලැබෙන මුදල් ඒ ඒ මෝල් හිමියන් නමින් ඉතිරි කිරීමේ බැංකු ගිණුම්වල තැන්පත් කොට මෝල් සංවර්ධනය කිරීමේ අරමුණින් 1980 වර්ෂයේදී පිහිටුවා තිබුණු මෝල් සංවර්ධන අරමුදල සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා ලැබුණු සෙස් ආදායම් හා බැංකු පොලී ආදායම් එකතුව සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.99,813,314 ක් ද, බැංකු තැන්පතුවල වටිනාකම රු.208,494,784 ක් ද වූ නමුත් සමාලෝචිත වර්ෂයේදී මෝල් 04 ක් නවීකරණය කිරීම සඳහා ලබාදී තිබුණු මුදල සමුච්චිත අරමුදලින් සියයට 3 ක් වූ රු.3,216,952 ක් පමණක් වීමෙන් මෝල් සංවර්ධනය සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් නොමැති බවට නිරීක්ෂණය විය.

(ආ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ බලතල අනුව පොල් තෙල් විශාල තොග වශයෙන් මිලදී ගෙන මිල අඩු වැඩි වීම අනුව වෙළඳපොලට නිකුත් කිරීම මඟින් මිල පාලනය කිරීමේ අරමුණින් පොල්තෙල් මිල ස්ථායිකරණ අරමුදලපිහිටුවා තිබුණද, 1981 වර්ෂයේ සිට මෙම වැඩ පිළිවෙල අධිකාරිය විසින් අතහැර දමා ඒ සඳහා වරායේ පවත්වා තිබුණු තෙල් ටැංකි ද වෙනත් ආයතනවලට ලබා දී තිබුණි. එසේ වුවද, 1985 වර්ෂයේ සිට නිහඬිට ඇති රු.78,865,954 ක ණය මුදලක් ඇතුළුව එකතුව රු.160,885,535 ක අයවිය යුතු ණය ශේෂයක් ද, රු.232,281,453 ක ආයෝජන ශේෂයක් හා රු.334,956,888 ක සමුච්චිත අරමුදල් ශේෂයක් ද සහිතව සමාලෝචිත වර්ෂය දක්වාම අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පැවතුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ හැර** අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ 2019 වර්ෂයේ දී රු.4,092,743 ක් ගෙවා සිදු කළ විදුලි අලුත්වැඩියා කටයුතු නිසි ලෙස සිදු නොකිරීම හේතුවෙන් ඒ සඳහා නැවතත් 2021 වර්ෂයේ දී රු.1,400,200 ක මුදලක් දැරීමට සිදු වී තිබුණි.

(ආ) පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් අධිකාරිය වෙත පැවරී ඇති අධීක්ෂණ හා නියාමන කාර්යයන් ක්‍රමවත් කිරීම පිණිස කර්මාන්තකරුවන් වෙත අනු අංක සහිත ස්ටිකර් ආකාර ලේබල් ක්‍රමයක් හඳුන්වා දීම අරමුණු කරගෙන අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව 2016 ත් 2018 ත් අතර කාලය තුළ රු.11,626,311 ක් වැය කර වර්ග 07 ක් යටතේ මුද්‍රණය කරන ලද ස්ටිකර් 6,573,831 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.8,358,002 ක් වටිනා සියයට 72 ක් වන ස්ටිකර් 4,725,841 ක් ඉතිරි වී තිබුණු අතර ස්ටිකර් මිලදී ගැනීම සඳහා කර්මාන්තකරුවන්ගේ

උනන්දුව අඩු වෙමින් පැවතීම හේතුවෙන් එම ඉතිරි තොගය අනාර්ථික වියදමක් විය හැකි බවට නිරීක්ෂණය කෙරේ.

(ඇ) පූර්ව සැලසුම්ගත කාර්යයක් නොවූ පොල් සංවර්ධන අධිකාරියේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට අඩි 12X9 ප්‍රමාණයේ P5 පරාමිතිය යටතේ LED ඩිජිටල් තිරයක් ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිවිතර සපුරා රු.5,196,879 ක අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයකට පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබිය දී ඊ තැපැලෙන් පසුව ලබාගත් රු.6,183,000 ක වැඩිම මිලගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් නැවත විමසා රු.4,998,000 ක මිලකට විධිමත් ගිවිසුමකින් තොරව හා කාර්යසාධන සුරක්ෂණය රු.249,900 කින් අඩුවෙන් ලබාගෙන කාර්යය පවරා ඒ සඳහා රු.999,600 ක් ගෙවා තිබුණි.

(ඈ) පොල් නිෂ්පාදනයන්හි අඩංගු සීනි මට්ටම, විටමින් මට්ටම, අපද්‍රව්‍ය මට්ටම (PAH) පරීක්ෂා කිරීමත්, අපනයනය කරනු ලබන දිසිදි පොල්වල හා පොල්තෙල්වල SLS 98 : 2013 දරන ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව පවතින ඇප්ලාටොක්ෂින් පරීක්ෂා කිරීමත් අරමුණු කරගෙන 2017 වර්ෂයේදී රු.6,590,685 කට මිලදීගත් High Performance Liquid Chromo to graph (HPLC) යන්ත්‍රය සඳහා 2019 හා 2021 වර්ෂයන්හිදී තවත් රු.9,107,192 ක් වැය කර අමතර උපාංග ද මිලදීගෙන තිබූ නමුත් මිලදීගත් දින සිටම දෝෂ වාර්තා වී තිබීම හා රසායනාගාරයේ නවීකරණ කටයුතු අවසන්ව නොතිබියදී යන්ත්‍රය මිලදී ගැනීම සහ විශ්ලේෂක සේවක පුරප්පාඩු පැවතීම යනාදී කරුණු මත යන්ත්‍රය නිෂ්ක්‍රියව තිබූ අතර 2018 වර්ෂයේදී යන්ත්‍රයේ වගකීම් කාලය ද අවසන් වී තිබුණි. තවද, තාක්ෂණික දැනුම ඇති ස්වාධීන නිලධාරියෙකු ලවා යන්ත්‍රය පරීක්ෂා නොකර සියලු ගෙවීම් සිදු කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර නොතිබියදී හා අවශ්‍යතායක් නොතිබියදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන ආකාරයට හා අරපිරිමැසුම්දායී නොවන ආකාරය විද්‍යුත් ලිපිනයට මිල ගණන් ලබා ගෙන නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ සභාපති කාමරය සඳහා රු.1,314,890 ක් වැය කර රූපවාහිනී යන්ත්‍රයක්, APPLE I PAD PRO 12.9" 256 GB උපකරණයක් හා 758 L බොට්ල් කූලර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි.

(ඊ) පරිගණක හා උපාංග මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මෙන් වෙන් කළ මුදල රු.3,154,000 ක් වුවද, ඊට වඩා රු.1,431,150 ක් වැඩියෙන් ගෙවා රු.4,585,150 කට පරිගණක 13 ක්, මුද්‍රණ යන්ත්‍රයක් හා උකුල් (ලැප්ටොප්) පරිගණක 13 ක් මිලදීගෙන තිබුණු අතර උකුල් පරිගණක 13 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවට යොමු නොකර අධිකාරියේ සභාපතිවරයාගෙන් අනුමැතිය මත මිල ගණන් ලබා ගැනීමේ සිට ඇනවුම් කිරීම දක්වා සියලුම ප්‍රසම්පාදන කාර්යයන් එක් දිනක් තුළ සිදු කර කාර්යසාධන සුරක්ෂණයක් ද ලබා නොගෙන මිලදී ගැනීම සිදු කර තිබුණි.

(උ) අප ජල පරීක්ෂාව, දිසිදි පොල් හා පොල් තෙල් ඇතුළු පොල් නිෂ්පාදනයන්හි බැරලෝහ, අපද්‍රව්‍ය හා පෝෂක යනාදී ගුණාත්මක භාවය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් 2008 – 2020

වර්ෂ අතර කාලය තුළ රු. 35,057,502 කට මිලදීගෙන තිබුණු පරීක්ෂණ උපකරණ හා ද්‍රව්‍ය 23 ක් 2021 වර්ෂය අවසානය දක්වාම අභාවිතව පවතින බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් පොල් නිෂ්පාදන ප්‍රමිතියට අනුකූලව ගුණාත්මකව සිදු කරන බවට සහතික වීමේ වගකීම ඉටු කිරීමට නොහැකි වී තිබුණු අතර අධිකාරියට ආදායම් ද අහිමි වී තිබුණි.

(උ) අධිකාරියට අයත් මහල් 04 කින් යුක්ත වර්ග අඩි 17,866 ක් වූ කොළඹ කොටුව කාර්යාලයේ වර්ග අඩි 7,754 කින් සමන්විත පළමු මහල හා තෙවන මහල 2018 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට විකල්ප භාවිතයකින් තොරව පැවතුණි.

(ඵ) ජනපති පදවි ප්‍රාප්තියේ දෙවර්ෂ පූර්ණයට සුභ පැතුම් එක් කිරීමේ පුවත්පත් දැන්වීමක් නිර්මාණය කර ගැනීම සඳහා රු.75,600 ක් වැය කිරීම, රේඛීය රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මුද්‍රණය කළ 'අපේක්ෂා කප්රුක' නම් පොතේ පිටපත් 150,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.8,181,000 ක් ගෙවීම අධිකාරියේ අරමුණුවලට පටහැනි බවට නිරීක්ෂණය විය.

(ඒ) අධිකාරියේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපසින් සභාපතිවරයා සඳහා කොටසක් එකතු කිරීම හා කොළඹ කොටුවේ පවත්වාගෙන යනු ලබන කාර්යාලයේ අලෙවිසැලක් සකස් කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන නොනිබියදී ඊට අදාළ සැලසුම් සකස් කිරීම සඳහා එකඟ වී තිබුණු රු.1,200,000 ක උපදේශන ගාස්තුවෙන් පළමු වාරිකය වශයෙන් පෞද්ගලික උපදේශන සමාගමකට ගෙවා තිබුණු රු.300,000 ක් එම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොදීම හේතුවෙන් අදාළ ඉදි කිරීම් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) පොල් සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට 259 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 20 ක් වූ තනතුරු 52 ක් වසර ගණනාවක සිට පුරප්පාඩු වී පැවති අතර අධ්‍යක්ෂ(පරිපාලන) හා අධ්‍යක්ෂ (අලෙවිකරණ-ජාත්‍යන්තර) යන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 02 ක් ද ඒ අතර විය. අවශ්‍යතාවය අනුව එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය යටතේ ඇති පොල් තෙල් මිල ස්ථායීකරණ අරමුදලෙන් හා ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් B.C.C ලංකා සමාගමට 1985 වර්ෂයේ දී ලබාදී තිබූ ණය රු.26,715,037 ක් හා 2002 හා 2004 වර්ෂයන්හිදී ලබාදී තිබූ ණය රු.31,550,000 ක් සහ ඊට අදාළ පොලී මුදල් රු.56,162,526 ක් වශයෙන් එකතුව රු. 114,427,563 ක් වසර 36 කට අධික කාලයක් නිස්සේ හිඟහිටව ඇති අතර එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2018, 2019 හා 2020 වර්ෂවලදී දිසිදි පොල් නියැදි පරීක්ෂාවන් සිදුකර සහතික නිකුත් කර තිබුණු මෝල් හිමියන් 33 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,321,138 ක්, දිසිදි නිෂ්පාදන සඳහා ලියාපදිංචි

සහතික ලබා නොගත් මෝල් 15 කින් අයවීමට ඇති රු.1,119,599 ක් හා පොල් කිරි නිෂ්පාදන ආයතන 13 කින් අයවිය යුතුව පැවති රු.145,144ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව ඉල්ලුම්කරුවන් විසින් යොමු කරන දිසිදි පොල්, පොල් තෙල්, කොහුබත්, ජලය, දිසිදි පොල්, පුන්නක්කු, කොප්පරා, පොල් කෙදි ආදියෙහි ආදර්ශයන්හි පරීක්ෂාවන් සිදු කර අධිකාරියේ රසායනාගාර මඟින් දින 05 ත් දින 10 ත් අතර කාලසීමාවේදී පරීක්ෂණ වාර්තා නිකුත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ පරීක්ෂණ වාර්තා 60 ක් දින 14 ත් දින 118 ත් අතර කාලයක් ප්‍රමාද කර නිකුත්කර තිබූ අතර පරීක්ෂණ වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ඉ) පොල් නිෂ්පාදන පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන සඳහා 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට රු.9,344,832 ක් ගෙවා තිබුණ ද, ප්‍රචාරණ කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ආපසු අයවිය යුතු රු.7,060,032 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට නොහැකි වීම මතභේදාත්මක කරුණක් වූ අතර මෙම ප්‍රචාරන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුවී ඇති බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිසන් සභාව හා ජනාධිපති විමර්ෂණ ඒකකය විසින් 2016 වර්ෂයේදී සිදු කළ විමර්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳව ද සොයා බලා නොතිබුණි. වැය කළ රු.2,284,800 ක මුදලින් රු.2,280,000 ක් ප්‍රචාරක පට 06 ක් නිෂ්පාදනය කිරීම සඳහා වුවද, එම ප්‍රචාරක පට විකාශනය කර නොතිබීමෙන් එම මුදල ද අනාර්ථික වියදමක් වී තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති